# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## *WESTERN PROVINCE PROVINCIAL COUNCIL*

**2018** ජනවාරි 23 වන අඟහරුවාදා
2018 தை 23 செவ்வாய்க் கிழமை
Tuesday 23rd January 2018

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09. 37 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.37 க்கு சபை கூடியது
*The Provincial Council met at 09.37 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு.தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ සංකල්පයක් පරිදි මුද්‍රණය කරන ලද මෙම පළාත් සභාවට අදාළ 1988 සිට 1995 දක්වා පළාත් සභා ප්‍රඥප්ති - වෙළුම I නම් ග්‍රන්ථයේ පිටපතක් එතුමන්ගේ උපදෙස් පරිදි පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ පරිහරණය පිණිස බෙදා දීම පිණිස යොමු කරන බව ආණ්ඩුකාර ලේකම්තුමා විසින් සභා ලේකම්තුමා වෙත අංක GOS/ADM/09 හා 2018.01.18 දිනැති ලිපිය මගින් දැනුම් දී තිබෙනවා. එම ග්‍රන්ථයේ පිටපත් අද දින ගරු මන්ත්‍රීවරුන් වෙත සභා කාර්ය මණ්ඩලය මගින් ලබා දීමට කටයුතු සලස්වා තිබෙනවා. එමෙන්ම ගරු ආණ්ඩුකාරතුමාට විශේෂ ස්තුතියක්, ප්‍රශංසාවක් පළ කර සිටිනවා. මෙවන් උත්කෘෂ්ඨ කාර්යයක් ඉටු කරලීම සඳහා පුරෝගාමී වීම පිළිබඳව මම මේ අවස්ථාවේදී බස්නාහිර පළාත් සභාවේ අපි සියලු දෙනාගේම ගෞරවය එතුමාට පුද කර සිටිනවා."*

මේ තිබෙන්නේ එතුමා විසින් එවා ඇති වෙළුම I පොත. මම හිතන්නේ මේ වන කොට ඔබතුමන්ලාට ඒ පොත ලැබෙන්න සලස්සනවා.

*ii*

*"2017.12.12 දින සභා සම්මත වූ 2018 වර්ෂයට අදාළ මුදල් ප්‍රකාශය හා සම්බන්ධ 2017 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තියට 2017.12.14 වන දින ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී තිබෙන බවත් කාරුණිකව දැනුම් දෙනවා."*

*iii*

*"සේනක දමයන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමා පළාත් සභා මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වීම හේතුකොටගෙන, මෙම පළාත් සභාවේ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන, සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේ ඇති වූ සාමාජික පුරප්පාඩුව සඳහා ක්‍රිෂාන්ත යෝගදාස් පංචරත්නම් රාම් ගරු මන්ත්‍රීතුමාව 2018.01.23 වන දින සිට පත් කර ඇති බව කාරුණිකව දැනුම් දෙනවා."*

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2018.01.10 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම මෙම සභාවට පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*The Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

*[සභා මේසය මත තබන ලද පෙත්සම්]
*[Tabled petitions]*

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

මීවනපලාන, ගුරුගොඩ, "ඉඳුනිල" හි පදිංචි ඉන්ද්‍රානි මද්දුමගේ යන අයගේ පෙත්සම.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

i. මහරගම, නාවින්න, ජයගත් පාර, අංක 41/1E හි පදිංචි පී.ඩී. නදීශා ක්‍රිශාන්ති යන අයගේ පෙත්සම.

ii. පන්නිපිටිය, හෝකන්දර පාර, හීන්පන්විල, 1437/B/2 හි පදිංචි දූලිකා සමන් කුමාරි යන අයගේ පෙත්සම සහ

iii. පන්නිපිටිය, දෙපානම, ග්‍රාම සංවර්ධන පාර, 22(19/A) හි පදිංචි එස්. තිළිණි මහෝධ්‍යා යන අයගේ පෙත්සම.

***සියලු පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*All Petitions, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

**01.**

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)18/01)**

අ. අවිස්සාවේල්ල මූලික රෝහලට අයිති ගොඩනැගිලි කිහිපයක් රෝහලේ කාර්යය මණ්ඩලයට අයත් නොවන පුද්ගලයින් විසින් පරිහරණය කරන බව ඔබතුමා දන්නේද?

ආ. රෝහලේ සේවයේ නියුතු විවිධ ශ්‍රේණිවලට අයත් බහුතර පිරිසක් නිල නිවාස නොමැතිව පෞද්ගලික ස්ථානවල පදිංචිව සිට, රෝහලට සේවය සඳහා පැමිණෙන බව ඔබතුමා පිළිගන්නේද?

ඇ. රෝහල සතු ගොඩනැගිලි බාහිර අයගේ පදිංචියට දීමෙන්, වරප්‍රසාද ලැබිය යුතු නිලධාරීන් හා විවිධ සේවාවන් වල නියුතු අයට, අසාධාරණයක් වී ඇති බව ඔබතුමා පිළිගන්නේද?

ඈ. මේ පිළිබඳව ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ග කවරේද?

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

අ. ඔව්.

ආ. ඔව්.

ඇ. ඔව්.

ඈ. 2017.10.06 වන දින අවිස්සාවේල්ල පොලිස් ස්ථානයේ CIB(02) 140/48 යටතේ අනවසර පදිංචිකරුවකු වන ඩබ්.ජ්. රත්නපාල නම් පුද්ගලයා ඉවත් කර දෙන ලෙස පැමිණිලි කර ඇත. එහිදී 2017.12.31 වන දිනට පෙර ඔහු ඉවත් වන බවට පොරොන්දු වී ඇත. නමුත් මේ වන තෙක් ඔහු ඉවත් නොවීම නිසා නීතිමය කටයුතු සිදු කරන ලෙස පොලිසියට දැනුම් දී ඇත.

2017.11.09 වන දින අවිස්සාවේල්ල පොලිස් ස්ථානයේ MCR/4086/17 යටතේ දෙවන අනවසර පදිංචිකරුවන වෛද්‍ය චූලා ගුණසේකර මහතා ඉවත් කර දෙන ලෙස පැමිණිලි කර ඇත. 2018.02.10 වන දිනට පෙර ඔහු ඉවත් වන බවට පොරොන්දු වී ඇත.

පළාත් ඉංජිනේරු කාර්යාලය මගින් ලබා දී ඇති නිල නිවාස 04 න් 03 ක් අලුත්වැඩියා කිරීමෙන් පසුව මෙම රෝහලේ නිලධාරීන් වෙත පවරා ඇත. පළාත් ඉංජිනේරු කාර්යාලය සතු සබරගමුව බස් සමාගම භාවිතා කරන ගොඩනැගිල්ලක් ද නිල නිවසක් ලෙස භාවිතා කිරීම සඳහා පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු ඇමතිතුමා, රෝහලට අයිති ස්ථානවල අනවසර පදිංචිකරුවන් නවාතැන්ගෙන ඉන්නේ - පොලිසියට ගිහිල්ලා මේ කටයුතු කරන්න ඔබතුමාට රෝහල සම්බන්ධව අධිකාරී බලයක් නැද්ද?

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

දැන් මෙහෙමයි. මම ඔය ගැන පොඩ්ඩක් සොයා බැලුවා. එයා යන්නේ නැත්නම් අපට නඩු දාලා තමයි ඉවත් කරන්න වෙන්නේ. නඩුවක් යන්න වෙනවා. දැන් බොහෝදුරට ඒ අය යන්න එකඟ වෙලා තිබෙනවා. දැන් මේ ළඟදී මාස දෙකක් ද කොහෙද කල් ඉල්ලලා තිබුණා, යන්න. එක නිල නිවාසයක. අනික් එක නම්, මට දැනුම් දුන්නේ නැහැ. වෛද්‍යවරයාගේ එක. ඒවා ගැන මම සොයා බලන්නම්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඇත්තටම ඒක පොලිසියට අයිති කාරණයක් නොවෙයි. මොකද, කවුරු හරි ඉන්නවා නම් ඉවත් කරන්න පොලිසියට අයිතියක් නැහැ. පොලිසිය කියන්නේ, මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියා මාර්ගවලට යන්න කියලා. එතකොට ඒක පදිංචිකරුවන්ට වාසියක් බවට පත් වෙනවා. ඒ නිසා මම හිතනවා ඔබතුමාට තිබෙනවා, තමන්ගේ ආයතනය හැටියට, තමන්ගේ අධිකාරී බලය හැටියට ඒ අයව එළියට දාන්න, ඔබතුමා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්න.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

අපට පුළුවන්. ක්‍රියා මාර්ග අරගන්න. ලියුම් අරින්න. ඔක්කොම පුළුවන්. ඕනෑම තැනක අනවසරයෙන් පදිංචි වෙලා ඉන්න කෙනෙක් පොලිසි ගිහිල්ලා, උසාවි ගිහිල්ලා ඔහොම වෙන කොට අන්තිමට යන්නේ නඩු මගට තමයි. මම දන්න විධියට නිල නිවාසවල හුඟක් තැන්වල ඔය ප්‍රශ්නය තිබෙනවා. එක නිල නිවාසයක කෙනෙක් යන්න මාස දෙකක් කල් ඉල්ලුවා. මටත් කථා කළා. මම හිතන්නේ යයි. අනික් එක නම් අර වෛද්‍යවරයාගේ නිල නිවාසය පිළිබඳව මම පොඩ්ඩක් සොයා බලන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීමේ අවස්ථාව. අමාත්‍යාංශ නිවේදන අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු සභාපතිතුමනි, පෙත්සමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් පෙත්සම් ඉවරයි. කොහෙද සිටියේ?

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමා, එතුමා නැඟිටින්න හදද්දී ඔබතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. දැන් ගොඩක් වෙලා පෙත්සම් ඉවර වෙලා. ඔබතුමා සභාගත කරන්න කෝ. ප්‍රශ්නයක් නැහැ. අමාත්‍යාංශ නිවේදන හා අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම ගැන බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, පළාතේ පාසල් ගණනාවක අර්බුද රැසක් නිර්මාණය වෙලා තිබෙනවා. විශේෂයෙන් මා කථා කරන්න යන්නේ කඩවත, රන්මුතුගල, නෙළුම්වැස්ස ප්‍රාථමික විද්‍යාලය කියලා විද්‍යාලයක් තිබෙනවා. මේ විද්‍යාලයේ දෙමව්පියන් පිරිසක් ලිපියක් යොමු කරලා තිබෙනවා, ගරු ප්‍රධාන අමාත්‍යතුමාට. ඒ වාගේම ජනාධිපතිතුමාට, ගරු ආණ්ඩුකාරතුමාට. එහි පිටපතක් මටත් එවලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මම මේ කථා කරන දෙය පිළිබඳව මේ සභාවේ අවධානය යොමු කළොත් හොඳයි කියලා හිතනවා. මේ පාසල ඇති කරන්නේම අවබෝධතා ගිවිසුමකින්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. එතුමාගේ ප්‍රකාශය අහන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අවබෝධතා ගිවිසුමකින් කඩවත, රන්මුතුගල විහාරස්ථ භූමියේ ශ්‍රී ලංකා නිසෙක් පදනමට අනුබද්ධව ආරම්භ කරන්නේ. නෙළුම් වැස්ස ප්‍රාථමික විද්‍යාලයට අදාළ ගිවිසුම් පත්‍රයයි. ගරු සභාපතිතුමනි, මේ ගිවිසුම අත්සන් කරලා තිබෙන්නේ, පී.එන්. අයිලප්පෙරුම. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ. ඒ වාගේම පූජ්‍ය සීලගම විමල හාමුදුරුවෝ. ඒ වාගේ ම සාක්ෂිකරුවන් වන්නේ ජයන්ති විජේතුංග. හිටපු ලේකම්, මල්සිරි ජේ. සෙනෙවිරත්න හිටපු ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්. 2012 වර්ෂයේ අත්සන් කරපු මේ ගිවිසුමේම බරපතළ අඩුපාඩු ගණනාවක් තිබෙනවා. ඒ නිසා මේ ගිවිසුම වහාම වෙනස් වෙන්න ඕනෑ. මේ නෙසෙක් පදනම කියන එකට පත් කරලා තිබෙන විදුහල්පති, අපි පළාත් සභාවෙන් පත් කරන්නේ. හැබැයි, මේකේ පරිපාලන මණ්ඩලයක් තිබෙනවා. ඒ මණ්ඩලය පත් කිරීම සම්පූර්ණයෙන්ම අවුල් සහගත තත්ත්වයක් තිබෙන්නේ. මේකේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ, නිල බලයෙන් සාමාජිකයන් වෙනවා. සභාපති ස්වාමීන් වහන්සේ නම් කරනු ලබන පත් කරපු හතර දෙනයි. සභාපතිත් එක්ක. එතකොට මේ හාමුදුරුවන්ට, මේ නෙසෙක් පදනමට බැහැ, මේ ඉස්කෝලේ පරිපාලනයට සම්බන්ධ වෙන්න. හැබැයි, මේකට ළමයින් ඇතුළත් කර ගැනීමේදී ගරු සභාපතිතුමනි, ලියුම යවන්නේ කවුද? ලියුම යවන්නේ හාමුදුරුවෝ. දැන් මේ පාසලට ළමුන් බඳවා ගැනීමේ සම්පූර්ණ පරිපාලනය මෙහෙය විය යුත්තේ, පාසලේ විදුහල්පති. හැබැයි ලියුම යවන්නේ, සීලගම විමලනායක හාමුදුරුවෝ. 2018 ට ළමයින් ඇතුළත් කර ගැනීම. මේකේ සම්පූර්ණ පරිපාලනය අපේ පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ගිලිහිලා තිබෙන්නේ. මේක තමයි පළමුවැනි කාරණය. ඊළඟ එක, මේ පාසලට ඇවිල්ලා විදුහල්පතිවරුන්ට ඉන්න බැහැ. මේ ලිපිය තිබෙනවා. මම මේ ලිපිය සභාගත කරනවා. මේ වන කොට, පසුගිය කෙටි කාලය තුළ විදුහල්පතිවරුන් හත් දෙනෙක් ඉඳලා තිබෙනවා. 2015 සිට මේ වනතුරු විදුහල්පතිවරු පස් දෙනෙක් ඉඳලා තිබෙනවා. ඇයි? මේ හාමුදුරුවෝ එක්ක මේ වැඩේ කරගෙන යන්න බැහැ. විදුහල්පතිව සම්පූර්ණයෙන්ම තමන්ගේ යටතට අරගෙන පාලනය කරන්න බලනවා. බැරි වුණාම, ඒ විදුහල්පතිව එළවනවා. දැන් තවත් විදුහල්පතිනියක් ගිය සතියේ අයින් වුණා. කලාප අධ්‍යක්ෂකට මම කථා කරලා කිව්වා, මැතිවරණයක් කැඳවලා තිබෙන වෙලාවේ මේ විදුහල්පති අයින් කරන්නේ කොහොමද කියලා. එතකොට කලාප අධ්‍යක්ෂිකාව කිව්වා, ඔව්. මැතිවරණය වෙලාවේදී අයින් කරන්න බැහැ. අපි පෙබරවාරි මාසේ 10 වැනිදායින් පස්සේ ඒක ක්‍රියාත්මක කරනවා කියලා. හැබැයි, හදිසියේම මේ විදුහල්පතිනිය මාරු වෙලා යනවා. විදුහල්පතිනියක් ඉල්ලීමක් කළා. මොකද ඒ තරම් අනවශ්‍ය බලපෑම් විදුහල්පතිනියට. මේක හොඳ පාසලක්. මේකේ දැන් අර්බුද ගණනාවක් තිබෙනවා. මෙහි වන සමහර දේවල් කියන්න බැරි තරම්. ඒ නිසා මේ ලිපියේ සියලු විස්තර තිබෙනවා. මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා. අපේ ගරු මහ ඇමතිතුමනි, මේ පාසල ගැන ඔබතුමා සොයා බලන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

මම මොකටද? මේ ඇමතිතුමා ඉන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නැහැ. ගරු මහ ඇමතිතුමාට මම ගිය සුමානෙම කිව්වා නේ. මොකද ඇමතිතුමාට කියලා වැඩක් නැහැ. දැන් එතුමාව සම්බන්ධ කරගන්න බැහැ. අනේ ගරු මහ ඇමතිතුමා, ඔබතුමාට මම මේක කිව්වා. හම්බ වෙලත් කිව්වා නේ? එතකොට ඔබතුමා මොකක්ද කිව්වේ? කිව්ව එක කියන්නද? කමක් නැද්ද?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

කියන්න. කියන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

උඹ මොකටද බන් ඔහේ ගෙනියන්නේ. ගෙනෙන් මෙහෙට. මගෙ ළඟට අරන් - කිව්වාද? නැද්ද? ඒක මම ඔබතුමාව අගය කරනවා. ඔබතුමා අඩුම ගණනේ ඇමතිවරු මේ වැඩේ කරන්නේ නැත්නම් ඔබතුමාගේ මැදිහත්වීම ඉහළින්ම අගය කරනවා. ඔබතුමා වාගේ නායකයෝ තමයි ඉන්න ඕනෑ. මොකද කරන්නේ නැත්නම් කවුරු හරි නිවැරදි කරන්න ඕනෑ. ඒගොල්ලන්ගේ නායකයා හැටියට. කැබිනට් මණ්ඩලයේ අනික් අය කරන්නේ නැත්නම්, දුරකථනයට එන්නේ නැත්නම්, යමක් කියන්න බැරි නම්, ඇහුමකන් දෙන්නේ නැත්නම්, කිව්වාහම කෙරෙන්නේ නැත්නම්. ඒ නිසා නේ මම කියන්නේ අධ්‍යාපනයේ පරිපාලනය බිඳ වැටිලා කියලා ගරු සභාපතිතුමනි. ඇත්තටම බිඳ වැටිලා. මම මේ එක පාසලක් ගැන විතරයි මේ කියන්නේ. බොහෝ තැන්වල නිලධාරීන් නොවන විධියට වැඩ කරනවා. මේක ඉතාම බරපතළ තත්ත්වයක්. ඇහෙන්නේ නැහැ වාගේ ඉන්න පුළුවන්. අපිව දැක්කාම දුවන්න පුළුවන්. දුරකථනයට answer කරන්නේ නැතිව ඉන්න පුළුවන්. හැබැයි, හැමදාම පවතින්න බැහැ. ඇමතිකම් ගන්න පුළුවන්. මහ ඇමතිකම් ගන්න පුළුවන්. නායක කම් ගන්න පුළුවන්. හැබැයි ඒවා පවත්වාගෙන යන්න, රඳවා ගන්න බැහැ, ජනතා සේවය කරන්නේ නැත්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් මම ඉල්ලන්නේ. මේ පාසලේ බරපතළ අර්බුද ගණනාවක් තිබෙනවා. මේ වන කොට සැක කටයුතු විගණන ප්‍රශ්න ගණනාවක් ඇති වෙලා තිබෙනවා. ඒ සියලු විගණන ප්‍රශ්න මා ළඟ තිබෙනවා. ඒ නිසා මේවා ගැන අවධානය යොමු කරලා කරුණාකරලා මේ අවබෝධතා ගිවිසුම හැකි ඉක්මණින් සංශෝධනය කරලා, අනවශ්‍ය ඇඟිලි ගැසීම්වලින් මේ පාසල බේරාගන්න කියලා මා මේ සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පිළියන්දල මූලික රෝහලේ කාර්ය මණ්ඩලයේ ගැටලු පිළිබඳව හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් තිබනවා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව -

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

බක පණ්ඩිතයා වාගේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා ඔබතුමාගේ පාඩුවේ ඉන්න කෝ. මගේ පණ්ඩිතකම් මගේ ළඟ තියාගන්නම්. ඔබතුමාට පිස්සු.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

බක පණ්ඩිතයා නොවී වාඩි වෙලා ඉන්නවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමාට මම මොකුත් කිව්වේ නැහැ නේ? ඔබතුමා ඔබතුමාගේ වැඩ බලා ගන්න කෝ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම කිව්වේ උදේනට. උදේන මගේ හොඳ යාළුවෙක්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒ යාළුකමට කියන්න. ඔබතුමා මාව ඉලක්ක කරලා කියන්න එපා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම කිව්වේ උදේනට. උදේනලා අපි පරණ මිනිස්සු. යාළුවෝ. ඔයාට කිව්වේ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේ මුළු සභාවම දන්නවා පිස්සා කවුද කියලා. තමුන්නාන්සේ ද මමද කියලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අපේ ගෙදර හිටියා පොඩි බලු කුක්කෙක්. මේ බලු කුක්කා හැමදාම -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒ බලු කුක්කාගේ තාත්තා මේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒ බලු කුක්කා හැමදාම කොහේ හරි තිබෙන එකක් අරගෙන මිදුලේ දානවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේ බලු කුක්කාගේ තාත්තා. එයාම කියා ගත්තා බල්ලෙක් කියලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

එයාලට වැඩ නැති වුණාට අපට වැඩ තිබෙනවා. ගරු සභාපතිතුමා මේ සභාව නිශ්ශබ්ද කරලා දාන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එයාම කියා ගත්තා එයා බල්ලෙක් කියලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු මහ ඇමතිතුමනි, මම ආණ්ඩුකාරතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ ප්‍රඥප්තිය බලගන්වන්න ඕනෑ, හරියට සභා රීති. සභා රීති බලගන්වන්න ඕනෑ. කුණු හරුප කියවන්න බැහැ. අදාළ මාතෘකාවට පිටින්. ඔබතුමා පාලනය කරන්න ඕනෑ සභාව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම පාලනය කරනවා. ඔබතුමාගේ ප්‍රශ්න නිසා නේ? හැමදාම අධ්‍යාපනය. හැමදාම සභාවේ අධ්‍යාපන ප්‍රශ්න නේ? උදේ පටන් ගත්තාම හැමදාම අධ්‍යාපනයෙන් පටන් ගන්නේ. ඔබතුමා මග හරින්න එපා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගම්පහ අධ්‍යාපන අධ්‍යක්ෂතුමෙක් සිටියා. මාරු කළා. ඔබතුමා කිව්වාම තව එක්කෙනෙක් දුන්නා. එයාවත් මාරු කළා. මම රටෙන් ගේන්න ද අධ්‍යක්ෂවරු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ප්‍රශ්නයක් නැහැ. මම ඒ කථා මොකුත් කිව්වේ නැහැ නේ?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

එහෙමනම් ඔබතුමා වුණත් කමක් නැහැ, අවබෝධයෙන් කථා කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අධ්‍යාපන ඇමැතිවරයා වශයෙන් ඔබතුමාගේ ක්‍රියා මාර්ග ඔබතුමා ගන්න. ඔබතුමා මන්ත්‍රීවරුන්ට ඇහුම්කන් දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මේ ගිවිසුමක් ගහපු ඉස්කෝලයක්. උවමනාවට වැඩිය ගුරුවරුන්ට ප්‍රශ්න හදන්න බැහැ. අපි දන්නවා ගුවරුන්ට ගරුත්වයක් තියන්න. මේ කුණු කන්දල් දාලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගුරුවරුන්ව මට්ටු කරන්න අපට බැහැ. විදුහල්පතිවරුන්ව මට්ටු කරන්න බැහැ. ප්‍රශ්න හදාගන්න බැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දණගස්සවන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න. මම රීති දන්නවා. හැමදාම මේ සභාවේ ප්‍රශ්න එන්නේ මුලින්ම අධ්‍යාපනයේ. පටන් ගන්නේම අධ්‍යාපනයෙන්. හරි ප්‍රශ්නයක් මේක.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම ගුරුවරුන්ට විශාල ගරුත්වයක් තිබෙනවා. (බාධා කිරීමක්) නිපුණ ගරු මන්ත්‍රීතුමා මම ගුරුවරුන්ට විශාල ගරුත්වයක් තිබෙනවා. බොරු කියන්න ඕනෑ නැහැ. මම කවදාවත් එහෙම කරන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. නිශ්ශබ්ද වන්න. හැමදාම මේ සභාව අධ්‍යාපන ප්‍රශ්නවලින් පටන් ගන්නේ. හැමදාම අධ්‍යාපන ගැටලු. ගරු ඇමතිතුමා, මේක ඉවරයක් කරගන්න. මේක මටත් ප්‍රශ්නයක්.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ඔබතුමා මූලාසනයේ ඉඳගෙන අපේ වරප්‍රසාද උල්ලංඝනය කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උල්ලංඝණය කිරීමක් නොවෙයි කරන්නේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම කැමැතියි, ඔබතුමාට උත්තර දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීවරු අහන්නේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා අවසර දෙන්න. මම උත්තර දෙනවා, ඔබතුමාට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී දෙන්න බැහැ නේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

එහෙමනම් ඔබතුමා මොකද අපට සභාවේ බලපෑම් කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බලපෑමක් නොවෙයි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමාගේ ගම්පහ කලාපයේ අර මල්ලවාරච්චි හිටියා. උදේ ඉඳන් හැන්දෑ වෙනකන් - එයාව අයින් කරලා දැන් දැම්මා වෙන කෙනෙක්. දැන් එයා හොඳ නැහැයිලු. හොටු ගෑණි දීලා කැහි ගෑණි දැම්මා. දැන් එයා හොඳ නැහැයිලු. අද ලංකාවේ එහෙම අධ්‍යක්ෂවරු මාරු කරන්න බැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දණ ගස්සන්න ඇමතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතැන ඒ ගැන කථාවක් කළේ නැහැ නේ? පිළියන්දල මූලික රෝහල ගැන මෙතුමාගේ අවස්ථාව.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම ගැන ස්තූතිවන්ත වෙනවා. මම පිළියන්දල මූලික රෝහලේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නයක් සම්බන්ධව කථා කරන්න උත්සාහ ගන්නේ. ප්‍රථමයෙන් කියන්න ඕනෑ, ගරු ඇමතිතුමාව දැනුවත් කිරීමක් කරන්නේ. උපදේශක කාරක සභාවකදී කියන්නත් බැරි වුණා. පෞද්ගලිකව උත්සාහ ගත්තා. ඒ ප්‍රශ්නය සංසිඳුවා ගන්න බැරි වුණා. මම සන්තෝෂ වෙනවා. ගරු මහ ඇමතිතුමාත් ඉන්නවා. මේ කාටත් මතක ඇති පසුගිය කාල වකවානුවේ ඩෙංගු ප්‍රශ්නය උඩ රෝහල් කිහිපයක් අතිගරු ජනාධිපතිතුමා, සෞඛ්‍ය ඇමතිතුමා මැදිහත් වෙලා රෝහල් කිහිපයක් නම් කරලා, ඩෙංගු නිවාරණය කරන්න මූලික රෝහල් වශයෙන් නම් කරලා. එයින් එකක් තමයි පිළියන්දල රෝහල. දැන් ඒ රෝහලට අංගසම්පූර්ණ ලැබ් එකක් දීලා, විශේෂඥ වෛද්‍යවරයෙක් දීලා සියලුම දේ අපි බොහොම පැහැදිලිව කරගෙන ගියා. ගරු ඇමතිතුමා දන්නවා.

මම ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමතිතුමා දැනුවත් කරන්න හදන්නේ. අපි මේ රෝහල හරහා බොහොම දක්ෂ විධියට ඩෙංගු මර්දනය කර ගත්තා. පසුගිය කාලයේ මරණ සංඛ්‍යාව අඩු කර ගත්තා. ඒ පහසුකම් උඩ තමයි අපි ඒක කර ගත්තේ. මෙහෙම කරගෙන යන කොට, දැන් පිළියන්දල කියන ප්‍රදේශයේ හැමදාම ඩෙංගු තිබෙනවා. මේ රෝහලේ මම දැක්කා, ඒ ඩෙංගු මර්දනය වෙනවාත් එක්කම නේවාසිකව ප්‍රතිකාර ලබන්න රෝගීන්ට ඇඳන් 100 ක් විතර උඩ තට්ටුවේ තිබෙනවා. නමුත් මෙහි ඒ කාලයේ ලෙඩ්ඩු admission තිබුණේ 10 ක්, 15 ක්, 06 ක්, 07 ක් පමණයි. විශේෂඥ වෛද්‍යවරයෙක් ඇවිල්ලා, ලැබ් එකක් ක්‍රියාත්මක වෙන කොට ඩෙංගු නොමැති වුණත්, දැන් මේ රෝහල අංග සම්පූර්ණ රෝහලක් බවට පරිවර්තනය වෙලා තිබෙන්නේ. ඔබතුමා පරීක්ෂා කරලා බලන්න. මම හිතන්නේ සෞඛ්‍ය නිලධාරීන් ඉන්නවාද මන්දා. ඒ කෙසේ වෙතත් ඔබතුමා අද ගිහින් සොයා බැලුවොත් ඒ රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන්, 50 ක්, 60 ක්, 70 ක් අතර ඉන්නවා. ඒ මොකද, අර පහසුකම් ලැබුණාම - විශේෂඥ වෛද්‍යවරයෙක් ලැබුණා. ලැබ් එකක් තිබෙනවා. ඒ රෝහලේ කාර්ය මණ්ඩලය ඉන්නවා. වෛද්‍යවරු ඉන්නවා. බොහොම හොඳට පැහැදිලිව කරගෙන යනවා.

මේ අතරතුරේ රජයෙන් එනවා අනුමැතියක්, මම හිතන්නේ පළාත් අධ්‍යක්ෂකට. අර Lab Assistant මාරු කරන්න. ආපසු release කරන්න. තාවකාලික පත්වීමක් අපට ලබා දුන්නේ. අපි පිළිගන්නවා. මම අහන්නේ, මගේ තර්කය මේකයි. තාවකාලික පත්වීමක් දීලා MLT ලා දෙන්නෙක්ව දාලා දුවන ලැබ් එකේ රජයෙන් මේ දෙන්නාව මාරු කරන්න කියලා ලියුමක් එවනවා. ලියුම එවපු ගමන් අපේ පල්ළෙහා ඉන්න නිලධාරීන් කරන්නේ මොකක්ද? කෙලින්ම වාචිකව දෙනවා. ලිඛිතව නොවෙයි. මේ Lab Assistant ලා වහාම එක රාත්‍රියෙන් release කරන්න, නිදහස් කරන්න හිටපු තැනට කියලා. දෙන්නාම. මම ඔබතුමාගෙන් උදාහරණයක් අහනවා. මේ කථාව මැද. ඔබතුමාගේ හොඳම වාහනය රිලීක්ස් කරන්න කියලා, ඔයා ඩබල් කැබ් එක ගන්න. Prado එක දෙන්න කියලා ගරු මහ ඇමතිතුමා ඔබතුමාට ලියුමක් දුන්නොත්, දුන්න ගමන් ඔබතුමා Prado එක දෙන්නේ නැහැ නේ, ඩබල් කැබ් එක ගන්න. අපි පෘතග්ජන මිනිස්සු ඔක්කොම ඉන්නේ. අපි මේ Prado එක තියාගෙන ට්‍රයි කරනවා මහ ඇමතිතුමාත් එක පොඩි ඩීල් එකක් දාලා, ඒක ආපහු තියාගන්න. එහෙම නේ වෙන්න ඕනෑ.

දැන් මේක එහෙම වුණාම, නිලධාරීන් දන්නවා අපේ ගරු ඇමතිතුමා ඉන්නේ කළුතර. අපට මේ MLT ලා පහසුකම් ඔක්කොම ලැබුණේ මහ ආණ්ඩුවෙන්. අපේ රාජිත සේනාරත්න ගරු ඇමතිතුමාත් එක්කත් සාකච්ඡාවක් කරලා අපට විසඳගන්න බැරි දෙයක් නැහැ. පෞද්ගලිකව ඔබතුමාට පුළුවන්. පෞද්ගලිකව යහපාලනය හදපු හවුල්කාරයෙක් වශයෙන් අපට එතුමාට කථා කරන්න පුළුවන්. මේ සියල්ල විසඳාගන්න පුවවන්. රාජ්‍ය නිලධාරියා ලියුමට යට වෙලා ආව ගමන් දෙන්නාම නිදහස් කරන්න කියලා කියනවා. හරිද? මේ දෙන්නාම නිදහස් කරනවා. මේ නිලධාරීන් හිතන්න ඕනෑ. දෙන්නාම නොවෙයි අපි නිදහස් කරන්න ඕනෑ. අපි එක්කෙනෙක් ඉස්සෙල්ලා බිල්ලට දීලා බලමු. අනික් එක්කෙනා තියා ගනිමු. මානසික ආතතිවලින් පෙළෙන නිලධාරීන් මේකේ ඉන්නේ. දැන් අපි හොඳ PD කෙනෙක් ගෙනැල්ලා තිබෙනවා. කොහොම හරි පළාතේ වාසනාවට මම විශ්වාස කරනවා හොඳ දක්ෂ අධ්‍යක්ෂවරයෙක් ඇවිල්ලා ඉන්නවා කියලා. එතුමාට සහයෝගය දෙන්න - එතුමන්ලාට මේක ගැන කථා කළාට ගරු සභාපතිතුමනි, රාජ්‍ය නිලධාරීන් එක්කෙනෙකුට එක්කෙනෙක් විරුද්ධව කථා කරන්නෙත් නැහැ. වගඋත්තර

බඳින්න එන්නේ නැහැ. හැබැයි, ඔබතුමා කොන්ද කෙළින් තියාගෙන වැඩ කරන්න ලැහැස්ති වෙමු. ඊළඟට ඉන්න එවුන් ඔක්කොම ශුද්ධ කරන්න. මහ ඇමතිතුමාගේ සහයෝගය ඉල්ලන්න. එතුමාත් උදව් කරයි. ඊට පස්සේ ඔබතුමා දන්නවාද මම කරපු වැඩේ. මම රාජිත සේනාරත්න ඇමතිතුමාට කථා කළා. ගමේ මිනිස්සු පිළියන්දල උද්ඝෝෂණයකට දැන් ලැහැස්ති වෙනවා. මොකද, දැන් මේ රෝහලේ නැවතුනාම ලෙඩ්ඩු හුරු වෙලා ඉන්නේ - දුප්පත් මිනිස්සු ගමේ ඉන්නේ. වටේම පරීක්ෂණ ආයතන ඇති කරලා තිබෙන්නේ. පරීක්ෂණ වාර්තාවක් ගන්න ආපසු ඒවාට යන්න වෙනවා. මම කිව්වා කළබල වෙන්න එපා. මොකද, මේක අපි හදපු ආණ්ඩුව නේ? ඔය කාටත් අමාරු නැහැ. අපි බොහොම දුක් විඳලා හදා ගත්තු දේ අපි නැති කරගන්න ඕනෑ නැහැ. අපට ජනාධිපතුමා ආරක්ෂා කරගන්න ඕනෑ. අගමැතිතුමා ආරක්ෂා කරගන්න ඕනෑ. අපේ කැබිනට් එක ආරක්ෂා කරගන්න ඕනෑ තත්ත්වයක අපි ඉන්නේ. එතකොට මෙහෙම යන කොට රාජිත සේනාරත්න ඇමතිතුමාව මට සම්බන්ධ කර ගන්න බැරි වුණා. මම සුජාතා සේනාරත්න මැතිනියට කථා කළා. මම කථා කරලා කිව්වා, අපේ පිළියන්දල රෝහලට උදව් කරන්න. ඇයි කියපු ගමන් මාරු කළේ කියලා ගත් කටටම ඇහුවා. ඊට පස්සේ එතුමිය කථා කළා. අනිල් ජයසිංහ අධ්‍යක්ෂතුමා මට කෝල් එකක් දුන්නා. දුරකථන ඇමතුමක්. මම කිව්වා මේ වාගේ ප්‍රශ්නයක් තිබෙන්නේ. උද්ඝෝෂණයකට යන්න ලැහැස්ති වෙන්නේ. අපි ඒක නවත්තා ගත්තා. අපට උදව් කරන්න කියලා. මම ආපසු දෙන්නෙක් අනුයුක්ත කරනවා කිව්වා.

මම මේ කියන්න උත්සාහ ගන්නේ ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමතිතුමනි, මේක සොයා බලන්න ඕනෑ. ඔබතුමා හොඳට වැඩ කරනවා. අපි දන්නවා. නැත්නම් ඔබතුමාටත් අපි ඇඟිල්ල දික් කරනවා නේ? මේක ඔබතුමා අමාරුවේ දාන්න කියන දෙයක් නොවෙයි. සභාව හරහා මේ නිලධාරීන්ව මෙල්ල කරන්න. මේ කියපු ගමන් දඟලන්න දෙන්න එපා. ඒ මනුස්සයාගේ වාහනය මාරු කරන්න හදන්න කෝ ඔබතුමා. ඔය නිලධාරීන්ගේ. පස්සෙන් එන හැටි බලන්න. ඒකට ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා ඔබතුමා මේ ගැන සොයා බලලා වහාම තීරණයක් අරගෙන මේ පිළියන්දල රෝහලට කුඩම්මාගේ සත්කාර කරන මානසික ආතතියෙන් පෙළෙන නිලධාරීන්ගෙන් බේරගන්න කියලා ඉල්ලමින් මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ ප්‍රකාශය කරන්න සූදානම් වන්නේ, නීති ප්‍රශ්නයක් වාගේම රීති ප්‍රශ්නයක් සම්බන්ධයෙනුත් කථා කරමින් ඔබතුමා සතු වගකීම ඉෂ්ට කරලා දෙන්න කියන ආරාධනය කරන්නයි. ගරු සභාපතිතුමනි, පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ආරක්ෂා කිරීම සඳහා වරප්‍රසාද ඇතුළත් රීති අංක 36(1), (2), (3) කියලා වගන්ති ගණනාවක් ලියලා තිබෙනවා. නමුත් මේ දවස්වල අපි වරප්‍රසාද බරපතළ විධියට උල්ලංඝණය වෙනවා. ගරු සභාපතිතුමනි, මම දන්නේ නැහැ, අපේ සම්මත කරපු වරප්‍රසාද, චක්‍රලේඛ වලින් සම්මත කරලා දෙන්න පුළුවන්කම තිබෙනවාද කියලා. මම මේ කියන්නේ ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ බස්නාහිර පළාතේ විතරක් නොවෙයි. රටේම පාසල්වල 1 වසරට දරුවන් ඇතුළත් කිරීමේ උත්සව තිබුණා. සාමාන්‍යයෙන් සම්ප්‍රදායක් විධියට - ගරු සභාපතිතුමා මම හිතනවා මට ඇහුම්කන් දෙයි කියලා. ගරු සභාපතිතුමනි, සම්ප්‍රදායක් විධියට මේ 1 වසර ශිෂ්‍යයෝ ඇතුළත් කරන උත්සවවලට පළාත් සභා මන්ත්‍රීවරු පළාත් සභා පාසල්වලට සම්බන්ධ වුණා. එහෙම සම්බන්ධ වුණේ අපට විදුහල්පතිවරු ආරාධනය කරනවා. එකක් ඒ අයගේ උත්සවය යම් ගාම්භීරත්වයක් ගන්න. ඒ වාගේම ඒ උත්සවය හරහා ඒ අය පාවිච්චි කරනවා ඒ දරුවෝ ඇතුළත් කරන පාසලේ ගොඩනැගිලි ප්‍රශ්නයක්. එහෙම නැත්නම් උපකරණ ප්‍රශ්නයක්. එහෙම නැත්නම් පන්ති කාමරවල ඉඩකඩ ප්‍රශ්නයක්. එවැනි ප්‍රශ්න කියන්නත් ඒ අවස්ථාව පාවිච්චි කරනවා. ඒ නිසා අපි ඒ උත්සව වලට සහභාගි වුණා. හැබැයි පසුගිය දවස්වල මැතිවරණ කොමසාරිස්තුමා ගහපු චක්‍රලේඛ නිසා, නිලධාරීන් තුළ ඇති වුණු බිය නිසා විදුහල්පතිවරු අපට ආරාධනය කරන්න කටයුතු කළේ නැහැ. දැන් මේ වරප්‍රසාදවල කියන්නේ, අපට නිදහසේ කටයුතු කරන්න තිබෙන ඉඩ ආරක්ෂා කරලා දෙන්න කියලා.

දැන් ඒ වාගේම හෙට අනිද්දා වෙද්දී ගරු සභාපතිතුමනි, අපේ පළාත් පාසල්වල ක්‍රීඩා උත්සව තිබෙනවා. දැන් මේ ක්‍රීඩා උත්සවවල ප්‍රධාන අමුත්තෝ වෙන්නේ පළාත් සභා මන්ත්‍රීවරු. ඒකේ පක්ෂ මන්ත්‍රීවරු, විපක්ෂ මන්ත්‍රීවරු, ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු, වෙන පක්ෂ නියෝජනය කරන මන්ත්‍රීවරු, සියලු

[ගරු මහේෂ් අල්මේදා]

මන්ත්‍රීවරු සහභාගි වෙනවා. සියලු අයට පොදුවේ ආරාධනය කරනවා. දැන් මේ මැතිවරණ කොමසාරිස්තුමාගේ චක්‍රලේඛ නිසා මේ උත්සවවලට සම්බන්ධ වීමේ අවස්ථාවත් පළාත් සභා මන්ත්‍රීවරුන්ට අහිමි වෙලා තිබෙනවා. පළාත් සභා මන්ත්‍රීවරු මැතිවරණ සටනේ නැහැ. පළාත් සභා මන්ත්‍රීවරු ගිහිල්ලා මේවායේදී මැතිවරණ ප්‍රවර්ධන කටයුතු කරන්නෙත් නැහැ. බොහෝ වෙලාවට තෑග්ගක් දෙන එක තමයි කරන්නේ. ඒ අයගේ අභිමානය රකින්න උත්සවයේ වාඩි වෙලා ඉන්න එක තමයි අපි කරන්නේ. ඉතින් මේ අවස්ථාව නැති වුණු නිසා, දැන් ක්‍රීඩා උත්සවයේදී විශේෂයෙන් අංකුර ක්‍රීඩකයන් අඳුර ගන්න එක, ක්‍රීඩාවට තිබෙන පහසුකම්වල ප්‍රශ්න, ගැටලු සාකච්ඡා කරන එක මේ සියල්ල අපි කර ගන්නේ, අපේ පාසල් ක්‍රීඩා උත්සව වලදී. ක්‍රීඩා උත්සව වලට සහභාගි නොවුණාම අපේ වරප්‍රසාදය උල්ලංඝණය වෙනවා වාගේම පළාත් පාසල්වල ඉන්න විදුහල්පතිවරුන්ට සහ පරිපාලනයට තමන්ගේ ගැටලුවක්, ප්‍රශ්නයක් සාකච්ඡා කරන්න මන්ත්‍රීවරයෙකුට කියන්න තිබෙන අවස්ථාව නැති වෙලා යනවා. ඒ නිසා ඔබතුමා මැදිහත් වෙලා කරුණාකරලා මැතිවරණ කොමසාරිස්තුමා මුණගැසිලා පළාත් සභා මන්ත්‍රීවරුන්ට තමන්ගේ රාජකාරී කටයුතු කරන්න කරන මේ බාධාව නතර කරන්න කියලා උපදෙස් ඉල්ලා ගන්න කියන ආරාධනය මම කරනවා. එහෙම උපදෙසක් පල්ලෙහාට නාවොතින් අධ්‍යාපනයේ නිලධාරීන් සහ විදුහල්පතිවරුන් අපට ආරාධනය කරන එක කරන්නේ නැහැ. අපට ඒවාට සහභාගි වෙන්න තිබෙන අවස්ථාව නැති වෙලා යනවා. අවුරුද්දකට සැරයක් තමයි ක්‍රීඩා උත්සව, දරුවෝ ඇතුළත් කිරීමේ උත්සව වාගේ මෙවැනි උත්සව පළාත් පාසල්වල තියන්නේ.

ඒ නිසා පළාත් සභා මන්ත්‍රීවරුන්ට තමන්ගේ රාජකාරී කටයුතු කරදරයකින්, හිරිහැරයකින් නැතුව ගෙනියන්න අපේ පළාත් සභා ප්‍රඥප්තියේ ලියලා තිබෙන නීතිමය, අපි සම්මත කරලා තිබෙනව නීතිමය තත්ත්වයන් චක්‍රලේඛනවලින් උල්ලංඝණය කරන්න බැහැයි කියන කාරණය මැතිවරණ කොමසාරිස්තුමාට පැහැදිලි කරලා දීලා මේ උපදෙස පහළ නිලධාරීන්ට යවන්න අවශ්‍ය කටයුතු කරලා දෙන්න. එහෙම නැත්නම් ඉතුරු සති දෙකේ මේ අවස්ථාව, වරප්‍රසාදය අපට අහිමි වෙලා යනවා. ඒ නිසා ඔබතුමා මැදිහත් වෙන්න. අපට පළාත් සභා මන්ත්‍රීවරු විධියට යම් ප්‍රශ්නයක් තිබෙනවා නම් අපට කියන්න තිබෙන්නේ ඔබතුමාට. ඔබතුමා තමයි මැදිහත් වෙලා ඒක විසඳලා දෙන්න තිබෙන්නේ. ඒ නිසා ඔබතුමා මේ කටයුත්ත ගැන අවධානය යොමු කරලා අදම තීන්දුවක් අරගෙන කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඔබතුමා ප්‍රකාශ කරපු කාරණාව පිළිබඳව ඇත්ත වශයෙන්ම මම සොයා බලන්නම්. හැබැයි, ගම්පහ නම් අපට එවැනි ප්‍රශ්නයක් නම් නැහැ. පසුගිය දවස්වල ළමයින් ඇතුළත් කිරීමේ උත්සවවලට විදුහල්පතිවරු අපට ආරාධනා කළා. අපි ඒවාට සම්බන්ධ වුණා. ක්‍රීඩා උත්සවලටත් මේ අදවස්වල අපට ආරාධනා ලැබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නවත්තලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගම්පහ කලාපයෙන් -

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

කොළඹ කලාපයේ තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තිබෙනවා නේද? හරි. මම ඒක අදම සොයා බලන්නම් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා. අනිවාර්යයෙන්ම. ගම්පහ තවම අපට ගැටලුවක් නැහැ. අපට ආරාධනා කරනවා. මම ඒක අදම සොයා බලන්නම්.

පාසල් දරුවන් සඳහා වන පෙළ පොත් නියමිත පරිදි ලබා නොදීම හා පොහොර සහනාධාර ලබා නොදීම සම්බන්ධයෙන් - කරුණු දෙකක් තිබෙනවා නේ? පොහොරයි. පෙළ පොතුයි නේද? ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, මේ වර්ෂයේ පාසල් වර්ෂය ආරම්භ කරන අවස්ථාව වන කොට පාසල් දරුවන්ට නියමිත පරිදි අලුත් පාසල් පෙළ පොත් ලැබිලා නැහැ. නියමිත පාසල් පෙළ පොත් ප්‍රමාණය පාසල්වලට ලබා දීලා නැති නිසා ඒ පාසල්වලට ලබා දීලා තිබෙන්නේ, ගොඩක් පරණ පොත්. පාසල් දරුවන්ගේ පෙළ පොත්, අච්චු පොත්වල තිබෙන්නේ පරණ පොත්. ඒ නිසා දරුවන් ඉතා අපහසුතාවයකට පත් වෙලා තිබෙනවා. මොකද, දරුවෝ අලුත් පන්තියකට යන කොට දරුවෝ බලාපොරොත්තු වෙන්නේ තමන්ට අලුත් පෙළ පොත් ටිකක් ලැබිලා, පාසලට ගිහින් අධ්‍යාපනය හරියාකාරව කරන්නයි. නමුත් මේ වර්ෂය තුළ නියමිත ප්‍රමාණයට පාසල් පොත් ටික නොලැබුණු නිසා දරුවන් ඉතා අපහසුතාවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම දෙමව්පියනුත් අපහසුතාවයට පත් වෙලා තිබෙනවා. සමහර දරුවන්ට ලැබිලා තිබෙන පොත්වල ඇතුළත පිටු නැහැ. සමහර දරුවන්ට ලැබිලා තිබෙන පොත්වල පිටු ඉරිලා. අග පිටු නැහැ. මොකද ඒ අවශ්‍යතාවය හරියාකාරව ඉටු වී නැහැ. අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පාසල් දරුවන් අතට අලුත් පෙළ පොත් ලැබිලා නැහැ. ඒ නිසා මේ පිළිබඳව නියමිත බලධාරීන්ව ඔබතුමා හරහා දැනුවත් කරලා, ඒ අවශ්‍ය කරන පොත් ප්‍රමාණය පාසල් දරුවන්ට ලබා දීලා දරුවන්ට හරියාකාරව අධ්‍යාපනය කරගන්න අවස්ථාව ලබා දෙන්නය කියන ඉල්ලීම තමයි අපි කරන්නේ. ඒ වෙනුවට අධ්‍යාපන අමාත්‍යාංශය තුළ පොත් කඩ දාලා දරුවන්ගේ දෙමව්පියන්ට පුළුවන් ගිහින් අද පාසල් පෙළ පොත් ටික මිලදී ගන්න. සල්ලි දීලා පෙළ පොත් ටික, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පුළුවන්. අධ්‍යාපන අමාත්‍යාංශයේ කඩයක් දාලා. ඇත්තටම මේ කරගෙන යන්නේ මොකක්ද කියන එක අපට පැහැදිලිව තේරෙනවා. මේ කරන්නේ දරුවාට දෙන පෙළ පොත් ටිකටත් තිත තියන්න. තිත තියලා මිලට පොත් ටික ගන්න අවශ්‍යතාවය වන තැනට කටයුතු කරන්නයි දැන් මේ රජය කටයුතු කරන්නේ.

ඒ වාගේම අද පාසල්වල බැලුවාම ඩෙස් බංකු නැහැ. හෝමාගම කලාපයේ දරුවන්ට විශාල ප්‍රමාණයක ඩෙස් බංකු ටික අඩුයි. සමහර පාසල්වලට නියමිත පරිදි ගුරුවරු ටික ලැබිලා නැහැ. අපට නිල ඇඳුම් පිළිබඳවත් විශාල ගැටලුවක් තිබෙනවා. හැබැයි මේ ආණ්ඩුව ගනිද්දී කථා කළේ, අධ්‍යාපනයට 6% ක මුදලක් වෙන් කරනවා. නමුත් අපි අහන්නේ, පසුගිය අවුරුදු තුන තුළ කිසිම දෙයක් අධ්‍යාපනයට නොලැබුණු වකවානුවක මේ පෙළ පොත් ටිකටත් මේ තත්ත්වය උදා කරනවා නම්, නිදහස් අධ්‍යාපනය ගැන අපට බලාපොරොත්තු තියා ගන්න පුළුවන්ද?

ගරු සභාපතිතුමනි, ඒ එක්කම දාලා තිබෙනවා පොහොර සහනාධාර ලබා දෙනවාය කියලා. අපි රුපියල් 350/- ට දීපු පොහොර සහනාධාරය වව්චර් මගින් ගොවීන්ට ගෙවනවා කිව්වා. දැන් මේ වන කොට ගොවීන් කුඹුරු වපුරලා, පොහොර දාලා සියල්ල ඉවරයි. නමුත් ගොවියාට ගෙවිය යුතු පොහොරවලට අදාළ මුදල් බැංකු ගිණුම්වලට දාලා නැහැ. මේ රටේ ගොවියත් ඉතාම අපහසුතාවයට ඇතුළත් කරලා. පාසලට යන දරුවාගේ පොත් ටික දෙන්නේ නැහැ. අර පැත්තෙන් ගොවියාගේ පොහොර මුදල් ටික බැංකුගත කරලා නැහැ. දැන් කුඹුරු පීදෙන්න ළඟයි. දැන් පීදෙන්න පටන්ගෙන. නමුත් පොහොර මුදල් ටික තවම බැංකුවට ලැබිලා නැහැ. ඒ නිසා මේ පිළිබඳව දැනුවත් කිරීමක් කරන්න ඕනෑ. ඉතාම ගැටලු තත්ත්වයක් මේ සම්බන්ධයෙන් පවතින්නේ. මේ මුදල් ලබා දෙන්න අවශ්‍ය කටයුතු දැනුවත් කරලා ගොවියන්ට මේ මුදල ලබා දෙන්නේ ගොයම් කැපුවාට පස්සේද කියන එක පිළිබඳව අපට විශාල ගැටලුවක් තිබෙනවා. මොකද, අද හාල් රුපියල් 120/- යි. ඒ හාල් ටික ගන්න විධියක් නැහැ. ගොවියෝ තවත් අකර්මණ්‍ය වෙනවා, කුඹුරු වපුරන්න යන්න. මොකද වපුරන කුඹුරට අවශ්‍ය කරන මුදල් ටික ලැබෙන්නේ නැති නිසා. මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තූතියි ඔබතුමාට. සපුගස්කන්ද පොලිස් ස්ථානයේදී සිදු වූ මානව හිමිකම් උල්ලංඝණය වීම පිළිබඳව අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක කාලයක් ලබා දෙනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත විධියටත්, රටක් විධියටත්, රටක නීතිය හා සාමය ආරක්ෂා කරන්න තිබෙන

[ගරු අසෝක සපුමල් රන්වල]

ආයතනයක් තමයි ශ්‍රී ලංකා පොලිසිය. ඊටත් එහාට ගිහිල්ලා පොලිස් නිලධාරීන්ගේ තව වගකීමක් තිබෙනවා, සාම නිලධාරීන් විධියටත් කටයුතු කිරීම. හැබැයි, මේ තත්ත්වය ඉක්මවා ගිහිල්ලා අද වන කොට මේ ශ්‍රී ලංකා පොලිසිය තුළ ප්‍රවණතාවයක් විධියට ගොඩනැහෙමින් පවතිනවා. මීට පෙරත් මේක තිබුණා. ගෝත්‍රික විධියට පොලිසිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමයක්. පොලිස් කොමිසමත් එක්ක ඒක යම් මට්ටමකට වෙනස් වෙලා තිබුණා. නමුත් ඒ තත්ත්වය වෙනස් වෙලා නැවත ප්‍රවණතාවක් විධියට ගොඩනැගෙමින් පවතිනවා. යම් ප්‍රදේශයක ජනතාව පැමිණිල්ලක් කළාට පස්සේ, ඒ පැමිණිල්ල විභාග කරලා, ඒකට අදාළ නීතිය හා සාමය අනුව ක්‍රියාත්මක වෙන්න, සාම නිලධාරියෙක් විධියට ක්‍රියාත්මක වෙනවා වෙනුවට, ශ්‍රී ලංකා පොලිසිය ඒක විභාග කරලා, ඒකේ චූදිතයා බවට පත් කරලා, ඔහුට දඬුවම් පමුණලා, ඒ දණ්ඩය ශාරීරික හිංසනයක් බවට පත් කරලා, ප්‍රදේශය තුළ නැවතත් ඔහුට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් නිර්මාණය කරන ප්‍රවණතාවයක් පොලිසිය තුළ ගොඩනැගෙමින් පවතිනවා. මේක පසුගිය දින කීපය තුළම අපට දකින්නට ලැබුණා. විවිධ තැන්වලින් මතු වෙමින් පවතිනවා. මේ කාරණයට අදාළ වන සේ ශ්‍රී ලංකා පොලිසියේ සපුගස්කන්ද පොලිස් ස්ථානය තුළ අපරාධයක් සිද්ධ වෙලා, ඒ අපරාධය වහගන්න තවත් අපරාධයක් කරලා, ඒ අපරාධය වහගන්න තවත් කුමන්ත්‍රණයක් කරලා තුන් ඇඳුම් කථාවක් විධියට මේක දිග හැරුණාට පස්සේ ඉතාමත් පැහැදිලියි, පොලිසිය මෙන්න මේ දේවල් සිද්ධ කරන්නේ කොහොමද කියන කාරණය. ඒක නිසා මට ඉඩ දෙන්න. ඒ සම්බන්ධව කාරණා ටික එකින් එක පොඩ්ඩක් පැහැදිලි කරගත්තොත් ඉතාමත් පැහැදිලි වෙයි. පුරවැසියෙක් සතු මානව අයිතිවාසිකම් උල්ලංඝනය වීම ඊටත් එහාට ගිහිල්ලා, පළාත් සභා මන්ත්‍රීවරයෙක් විධියට ප්‍රදේශයේ ජනතාව නියෝජනය කරන්න අයිතිය අහිමි කිරීම සම්බන්ධව පැහැදිලි කරන්න. මෙන්න මේ තත්ත්වය මෙන්න මේ ආකාරයට සිද්ධ වෙන්නේ.

2018 ජනවාරි මාසයේ 03 වැනිදා මධ්‍යම රාත්‍රිය පහු වෙලා පැය දෙකක් ගිය තැන සපුගස්කන්ද පොලිසිය විසින් ප්‍රදේශයේ තරුණයෙක් අත්අඩංගුවට ගන්නවා. මේ අත්අඩංගුවට ගැනීමෙන් පස්සේ ඒ තරුණයාට විවිධ වද හිංසා පමුණුවලා, ඒ වාගේම විවිධ අඩත්තේට්ටම් කරලා, ලිංගික හිංසනයන් කරලා ඒ සම්බන්ධව ඒ තරුණයාගේ පියා බරපතළ කම්පනයට පත් වෙලා, විවිධ දේශපාලන අධිකාරියන්වලින් යම් පිහිටක් බලාපොරොත්තුවෙන් ඔවුන්ව සොයාගෙන යනවා. අවසානයේදී ඔහු මා වෙත එනවා. මගෙන් බැගපත්ව ඉල්ලා සිටිනවා. මගේ දරුවාට ඉතාමත් බරපතළ හිංසනයන් සිද්ධ කරලා තිබෙනවා. ඔහු ඉතාමත් වේදනාවෙන් කෑ ගහනවා. ඔහුට අඩුම තරමින් ප්‍රතිකාරයක් අරන් දෙන්නය කියලා. මේ අවස්ථාවේදී පොලිසිය තුළ අත්අඩංගුවට ගත්ත පුද්ගලයෙකුට ප්‍රතිකාර කරන්න මට අයිතියක් නැහැ. ඒක නිසා මම අදාළ නීතිඥ මහත්මයෙකුට යොමු කරනවා. ලාල් කුමාර පේළි කියන නීතිඥ මහත්මයෙකුට. මෙන්න මේ සම්බන්ධව සොයා බලලා, ඔහුත් සමග කටයුතු කරලා, යම් නීතිමය සාධාරණයක් ඉෂ්ට කරන්නය කියලා. ඒ අවස්ථාව වන විට තුන්වැනිදා පාන්දර හය හත වෙන කොට දෙවන අවස්ථාව විධියට නැවත සැරයක් මට වාර්තා කරනවා, ඒ ප්‍රදේශවාසීන් විධියට, ඒ පියා. මන්ත්‍රීතුමා, මේ තත්ත්වය සමනයට පත් වෙලා නැහැ. තමන්ගේ දරුවා ඉතාමත් බරපතළ විධියට රොගාතුරව පොලිසිය තුළ කෑ ගහනවා. ඔබතුමා මන්ත්‍රීවරයෙක් විධියට මැදිහත් වෙලා මේ තත්ත්වය සොයා බලන්න, මොකද වෙලා තිබෙන්නේ කියලා. ප්‍රතිකාරයක් අරන් දෙන්න කියලා තමයි ඔහු ඉල්ලා සිටියේ. ඉතාමත් බරපතළ වේදනාවකට පත්ව. ඒ වෙලාව වන කොට, 03 වැනිදා 10 වන කොට, මම ඒ වෙලාවේදී කියනවා තව පැය කිහිපයක්, පැය 24 පිරෙන්න තිබෙන්නේ. තව පැය කීපයකින් උසාවියට ඉදිරිපත් කරලා ඇප දෙන්න ඕනෑ. එහෙම නැත්නම් බන්ධනාගාරයට යයි. ඒ අවස්ථාවේ ඉදිරිපත් කළා, නීතිඥ මහත්මයා මගින් මේ රෝගයට ප්‍රතිකාර ගැනීම සඳහා රාගම රෝහලට ඇතුළත් කරන්න කියලා.

හැබැයි 03 වැනිදා රාත්‍රී 10 වන කොටත් මේ තත්ත්වය වෙනස් වෙනවා. ඒකට අදාළව කටයුතු කරන්නේ නැහැ. දිගින් දිගටම පොලිසිය තුළ තරුණයා වේදනාවෙන් කෑ ගහනවා. මම විශ්වාස කරනවා. ඒ වෙලාවේදී නීතිඥ මහත්මයා මැදිහත් වෙලා යම් විසඳුමක් අරන් දුන්නාය කියලා. හැබැයි පසුවැනිදා, 04 වැනිදා උදේ 09.00 වන කොට නැවත සැරයක් මාව මුණගැසිලා ඉතාමත් බැගෑපත්ව ඉල්ලා සිටිනවා. මන්ත්‍රීතුමා ඒ කාරණය එහෙම නොවෙයි සිද්ධ වුණේ. ඉතාමත් බරපතළ අගතියක් සිද්ධ වුණා. බන්ධනාගාරගත කරලා තිබෙනවා. ඒ මොහොතේම

බන්ධනාගාරගත කරන්න සිද්ධ කරලා තිබෙනවා කියලා. මම වහාම ක්‍රියාත්මක වෙලා පොලිස් ස්ථානයට යනවා. ඒ වෙලාව වන කොට පැය 24 පැනලා. අනීතික බලය පාවිච්චි කරලා ඔහුව අත්අඩංගුවට අරගෙන සපුගස්කන්ද පොලිසිය පැය 24 පැනලා නිසා මම ඒ ස්ථානයට යනවා. මහජන නියෝජිතයෙක් විධියට මට අයිතියක් තිබෙනවා. පොලිසිය අපරාධයක් සිද්ධ කරනවා නම්, පොලිස් ස්ථානය ඇතුළේ පැය 24 ක් පැන්නා නම්, DCA සීමා මායිම් වෙනස් වෙලා නම් ඒ සම්බන්ධව මැදිහත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සෞඛ්‍ය ගරු ඇමැතිතුමා, කරුණාකර මේ ප්‍රකාශය අහගන්න. බරපතළ ප්‍රකාශයක් එතුමා කරන්නේ. ඔබතුමා වෙන වෙන සංවාදවලට යන්න එපා. ඔබතුමා පළාත් සභාවේ ඇමැතිවරයෙක්.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒක නිසා මේ සම්බන්ධව මම සපුගස්කන්ද පොලිස් ස්ථානයට ගිහිල්ලා පොලිස් ස්ථානය ඉස්සරහාදී පොලිස් ස්ථානයේ වැඩ බලන ස්ථානාධිපති ලින්ටන් සිල්වා මහත්මයාගේ කාමරය ඉස්සරහා ඒ තරුණයා වාඩි වෙලා සිටියා. මම ඇසින් දුටු සාක්ෂියක් මේ. ඒ තරුණයාගේ කකුල් දෙකම ඉතාමත් බරපතළ විධියට ඉදිමිලා තිබුණා. ඔහුගේ පියා මට ඔහුව හඳුන්වා දෙනවා. මෙන්න මේ තරුණයා මගේ දරුවා. එකම දරුවාට තමයි මේ අපරාධය කරලා තිබෙන්නේ. අනේ මහත්තයෝ, කවදාවක්වත් කිසිම වරදක් කරන මනුස්සයෙක් නොවෙයි. අල්ලපු ගෙදර කෙනෙක් පැමිණිල්ලක් දාපු නිසා ඒ පැමිණිල්ලට දඬුවම් කරලා තිබෙන ආකාරය කියලා මට පැහැදිලි කරලා දෙනවා. මම දරුවා ළඟට යනවා. ගිහිල්ලා අහනවා, මොකද සිද්ධ වුණේ කියලා. ඔහු පැහැදිලි කරලා දෙනවා සිද්ධ වුණු දේ. රෑ එළිවනකන්, තුන් වැනිදා පාන්දර දෙකේ සිට හය වෙනකන් පුටුවක වාඩි කරලා යටි පතුළට ගහලා වරලුකර ඇට බිඳිලා ඉතාමත් බරපතළ වේදනාවෙන් කෑ ගහනවා. ඒ මොහොතේම මම යනවා, පොලිස් ස්ථානාධිපතිතුමා හම්බ වෙන්න. වැඩබලන ස්ථානාධිපති, අපරාධ අංශය. ඔහු මට පැහැදිලි කරලා දෙනවා, මොකක්ද මේ සිද්ධ වුණේ? ඔව් අපි දකිනවා. යම් දෙයක් සිද්ධ වෙලා තිබෙනවා. මොකක්ද ඔබතුමා ඉල්ලන්නේ කියලා. මම කියනවා, මම නීතිය පැත්තෙන් මොනවත් නොවෙයි ඉල්ලන්නේ. අඩුම තරමේ මොහුට ප්‍රතිකාරයක් අරන් දෙන්න කියලා. එහෙම නැත්නම් මේ තරුණයා මගේ හිතවතෙක්වත්, ඥාතියෙක්වත්,අපේ පාක්ෂිකයෙක්වත් නොවෙයි. මම පැහැදිලිව කියනවා. මොහු මිය ගියයි කියලා මට කම්පනයක් නැහැ. හැබැයි, ගමම ඇවිස්සෙයි. ගමම පොලිසියට එයි. ඒ වෙනුවෙන් තමයි මම ආවේ. ඒ නිසා මොහුට ප්‍රතිකාරයක් අරන් දෙන්න. මොහු පොලිසිය ඇතුළේ මියගියොත් ඔබතුමාට තමයි ප්‍රශ්නය වෙන්නේ කියලා මම පැහැදිලි කරලා දෙනවා. ඒ වෙලාවේදී වැඩ කරන ස්ථානාධිපතිතුමා ඉතාමත් පැහැදිලිව මේ කාරණය තේරුම් අරගෙන ඔහු තීරණය කරනවා, මම ඉස්සරහා මට ස්ථිරවම පොරොන්දු වෙනවා. පුළුවන්තරම් ඉක්මණින් රාගම රෝහලට මොහුව අරන් යනවා කියලා. ඒ පොරොන්දු වුණාට පස්සේ, මම ඒ ස්ථානයෙන් නික්ම යනවා. මොකද, මගේ වගකීම එතැනින් ඉවරයි. ඔවුන් ඉල්ලා සිටියේ, මගෙන් ප්‍රතිකාර අරන් දෙන්න. මම ඒකට නීත්‍යානුකූලව කටයුතු සූදානම් කළා. මම එතැනින් නික්මුණා.

මේ සිද්ධිය සිද්ධ වෙලා 04 වැනිදා උදේ නැවත කථා කරනවා අර කණ්ඩායම මට. එහෙම නොවෙයි මන්ත්‍රීතුමා සිද්ධ වුණේ. ඒ වෙලාවේ අත්අඩංගුවට ගත්ත විධියට B වාර්තාවක් හදලා, පොලිස් පහරදීමකින් නොවෙයි. උඩකින් වැටිලා අත්අඩංගුවට ගන්න ගිහිල්ලා පස් කණ්ඩියකින් වැටිලයි මේ කකුල් බිඳුණේ. එහෙම B වාර්තාවක් හදලා තමයි අධිකරණයට දාලා ඉවර වෙලා අවසානයේදී බන්ධනාගාරගත කරන්නේ. කිසිම ප්‍රතිකාරයක් නැතිව බන්ධනාගාරගත කරනවා. ඒ වෙලාවේදී තවදුරටත් මේ සම්බන්ධව පොලිස් ස්ථානාධිපතිතුමාත් එක්ක සාකච්ඡා කරන්න තමයි රාත්‍රී 09 ට පමණ මම පොලිස් ස්ථානයට යන්නේ. පොලිස් ස්ථානාධිපතිතුමාගෙන් මම අහන්නේ මෙන්න මේ කාරණය. මම ඇසින් දුටු සාක්ෂියක්. ඒ තරුණයා පාන්දර 02 කට ගෙනාවා. 06 වෙනකන් පොලිසියේ සිටියා. පහර දීලා තිබුණා. කුකුල් ඉදිමිලා තිබුණා. මම ඇසින් දුටුවා. මම ඉතාමත් බරපතළ ලෙස පොලිස් ස්ථානාධිපතිතුමාගෙන් ඉල්ලා සිටියා. ඔහුව රෝහල්ගත කරන්නය කියලා. ඒකේ සාක්ෂියක්. ඒක නිසා ඔබතුමා විසින් මේ කරන ලද අපරාධයට මම ඇසින් දුටු සාක්ෂියක් විධියට ඔහුගේ අයිතිවාසිකම් වෙනුවෙන් ඉදිරිපත් වෙනවා

[ගරු අසෝක සපුමල් රන්වල]

කියලා පොලිස් ස්ථානාධිපතිතුමාට ප්‍රකාශ කළාත් එක්කම පොලිස් ස්ථානාධිපතිතුමා වියරු වැටිලා, මගේ ඇඟෙන් අල්ලලා, මගේ බෙල්ලෙන් අල්ලලා, බිත්තියට හේත්තු කරලා මට දැඩි ප්‍රහාර එල්ල කරලා, මාව කූඩුවට දාලා, ඔහුගේ කෝට් එක ඉරුවයි කියලා බොරු චෝදනාවක් ගොනු කරලා පොලිසියේ රාජකාරියට බාධා කළා, පොලිස් නිලධාරීන්ට පහර දුන්නා කියලා චෝදනා ඉදිරිපත් කරලා, මාව රාගම රෝහලට ඉදිරිපත් කරලා රෝහලෙන් බන්ධනාගාරගත කරලා, බන්ධනාගාරයේ දින කිහිපයක් ඉන්න සිද්ධ වුණා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

පොලිස්පතිතුමා නීතිය හොඳට නවලා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මේ සම්බන්ධව පරීක්ෂණ කළාට පස්සේ මේ සභාවේ කියන්න බැරි අයුතු ලිංගික ක්‍රියාවලියන්වල යෙදෙන්න කියලා බල කරලා තිබුණා. සපුගස්කන්ද පොලිසියේ ඉහළ මාලයට තරුණයා අරගෙන ගිහිල්ලා තරුණයාට බල කරනවා, ඇඳුම් ඔක්කොම ගලවන්න කියලා. ඊට පස්සේ කියනවා, තමුන්ගේ පුරුෂ ලිංගය ප්‍රාණවත් කරන්න කියලා. ප්‍රාණවත් කරපු පුරුෂ ලිංගය පිරිමැදලා, ශුක්‍රධාතු පිට කරන්න කියලා බල කරනවා. ඒ පිට කරන ශුක්‍ර ධාතු පිහදමන්න කියලා කාන්තා යට ඇඳුමක් දීලා, පිහදාන්න කියනවා. ඒ අනුව පොතේ ලියනවා, කාන්තාවක් දූෂණය හෝ ඔහු අයථා ලිංගික ඇසුරක් පවත්වලා. ඒක නිසා ශුක්‍ර ධාතු පිට වුණා කියලා රස පරීක්ෂකට යවනවා, වාර්තාව. මේවා ඉදිරිපිට, ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන්, මහජන නියෝජිතයෝ වෙනුවෙන්, පොලිසියෙන් ප්‍රශ්න කරන්න අපට අයිතියක් නැද්ද? මේ සියලු මන්ත්‍රීවරුන්ට ඒ අයිතිය තිබෙනවා. පොලිසිය ඇතුළේ අපරාධයක් සිද්ධ වෙන්න පුළුවන්ද? නීතිය හා සාමය ආරක්ෂා කරන්න, ඒ වාගේම සාම නිලධාරීන් විධියට ඉන්න පොලිසිය තමන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කරනවා නම් ඒ සම්බන්ධව මහජන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිමල් ආර්. පීරිස් ගරු මන්ත්‍රීතුමා කරුණාකර ඔබතුමා මේ පැත්තට අවධානය යොමු කරන්න කෝ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒක නිසා ඉතාමත් පැහැදිලියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතාමත් ඛේදනීය කථාවක් එතුමා කියන්න හදන්නේ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මහජන නියෝජිතයින්ට ඒ අයිතිය තිබෙන්න ඕනැ. ඒක ශ්‍රී ලංකාද? යූ.ඇන්.පීද? ජේ.වී.පී ද? කියලා නොවෙයි. සෑම මහජන නියෝජිතයෙකුටම තමන්ගේ ප්‍රදේශවාසීන් පෙළෙන පීඩාවකට විරුද්ධව පොලිසිය කටයුතු කරනවා නම්, ඒ සම්බන්ධව ගිහිල්ලා ප්‍රශ්න කරන්න, ඒ සම්බන්ධව කථා කරන්න තිබෙන අයිතිය තිබෙනවා. ඒ අයිතිය මගෙන් උල්ලංඝනය කළා. ඒ නිසාම 2018 මුල් සැසි වාරයට මේ සභාවේ මට සහභාගි වෙන්න බැරි වුණා. බන්ධනාගාරය මගින් මම රෝහල්ගතව සිටි නිසා මට සහභාගි වෙන්න බැරි වුණා. ඊටත් එහාට ගිහිල්ලා ඒ කාලපරිච්ඡේදය ගම්පහ දිස්ත්‍රික්කයේ, බියගම ආසනයේ බලයලත් නියෝජිතයා විධියට මැතිවරණයට සහභාගි වෙන මට මගේ මැතිවරණ කාර්යාවලිය ඉෂ්ට කරන්න බැරි වුණා. ඒක නිසා පොලිසිය මගේ පුද්ගල සතු මානව අයිතිවාසිකම් බින්දා වාගේම, ඒ වාගේම පළාත් සභා මන්ත්‍රීවරයෙක් විධියට මට තිබෙන අයිතිවාසිකම් බින්දා වාගේම ප්‍රදේශයේ ජනතාවට අපරාධයක් සිද්ධ කළා. මෙයින් මේක ඉවර වෙන්නේ නැහැ.

තුන්වැනි කථාව තමයි මගේ අයිතිවාසිකම් වෙනුවෙන් මාගේ නීතිඥ මහත්මයා රාත්‍රියේ පොලිසියට ආවාට පස්සේ ඒ පොලිසිය මාව පෙන්වන්නේ නැතිව ඉන්දැද්දී ඒ වෙනුවෙන් නීත්‍යානුකූලව තර්ක කළාට පස්සේ ඔහුවත් මේකට පටලවලා ඉවර වෙලා පොලිසියට බලපෑම් කළයි කියලා ඔහුවත් විත්ති පාර්ශවය නියෝජනය කරලා අත්අඩංගුවට ගන්න කටයුතු කළා. අවසානයේදී මම වෙනුවෙන් කථා කරන්න ආපු නීතිඥයාට මාත් සමග කූඩුවේ ඉන්න සිද්ධ වුණා. බලන්න විත්තියේ මොකක්ද සිද්ධ වෙන්නේ කියලා. මේක දේශපාලන හස්තයකින් ක්‍රියාත්මක වෙනවා කියලා නොවෙයි. මේ පොලිස් නිලධාරීන් කටයුතු කරන ආකාරය. ඒක මටත් එකයි. ඔබටත් එකයි. මේ රටේ පුරවැසියාටත් එකයි. ඒක නිසා

පළාත් සභාවක් විධියට මේක සංවාදයට ලක් කරන්න ඕනෑ. මේක සම්බන්ධව විපරම් කරන්න ඕනෑ. කොහොමද පොලිසියක් මෙහෙම හැසිරෙන්නේ කියලා. මෙන්න මේ කාරණා ටික මම සියලුම මන්ත්‍රීවරුන් මඟින් ඔබතුමාට දැනුම් දෙනවා. මේක පළාත් සභා මන්ත්‍රීවරයෙක් සතු අයිතිවාසිකමක් විතරක් නොවෙයි. ප්‍රදේශයේ ජනතාව සතු අයිතිවාසිකමක්. නීතිඥ මහත්වරුන්ගේ අයිතිවාසිකමක්. ඒ වාගේම අනික් පැත්තෙන් ගත්තාට පස්සේ මහජන නියෝජිතයෙකුගේ අයිතිවාසිකමක් උල්ලංඝනය වෙන්නේ. ඒ නිසා මේ සම්බන්ධව ඔබතුමාගේ අධීක්ෂණය යටතේ යම් සොයා බැලීමක් කරලා, ඒ සම්බන්ධව සාධාරණය ඉෂ්ට කරන්නය කියලා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. දැන් මට සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාත් උදේ ලියුමක් එවලා තිබුණා. එතුමාටත් මේ නිර්නාමික තර්ජන කෝල් එනවා කියලා. එතුමාට නිර්නාමිකව. ඊළඟට අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාටත් නිලධාරීන් නිර්නාමිකව කෝල් දීලා තිබෙනවා. මේ සම්බන්ධව පොලිස්පතිතුමා අපි දැනුවත් කළා. නමුත් මේ සම්බන්ධව අපට කිසිම උත්තරයක්වත් පොලිස්පතිතුමාගෙන් එන්නේ නැහැ. අපි ඒ ගැන කනගාටු වෙනවා. කිසිම දෙයක්. පාර්ලිමේන්තුවේ නම් කථා නායකතුමාට ඒ බලතල තිබෙනවා. මම කනගාටු වෙනවා. පළාත් සභාවේ සභාපතිවරයාට ඒ කිසිම බලයක් නැහැ. වරප්‍රසාද ආරක්ෂා කරන්න මට බලයක් නැහැ. ඔබතුමාගේ කථාව ඇත්තමයි හරිම ඛේදනීය කථාවක් ඒක. නමුත් සභාපතිවරයා වශයෙන් මට ඒ ගැන මොකුත්ම පොලිස් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේ අවුරුදු තුනම පොලිස්පතිකම භාර දුන්නේ එක්සත් ජාතික පක්ෂයට හින්දා හෙට අනිද්දා ජනාධිපතිතුමා ඒක ගැන මොනවා හරි බලයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ නිසා පොලිස්පතිතුමාට අපි කාරණා කියනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මට අවසරයි. වරප්‍රසාද ප්‍රශ්නයක් සම්බන්ධව. මම ඉතාම සහයෝගය සම්පූර්ණයෙන්ම අපේ ගරු මන්ත්‍රීතුමාට අපි ලබා දෙනවා. අපි සම්පූර්ණයෙන්ම ලබා දෙනවා. මේවා තමයි කථා කරන්න ඕනෑ ප්‍රශ්න. කොහෙවත් යන කුණු ගොඩවල් නොවෙයි. මේවයි කථා කරන්න ඕනෑ. ගරු මන්ත්‍රීවරයෙකුට හිරිහැර කරලා මේ රටේ තරුණයෙකුට හිරිහැර කරලා මේවා වෙන්න දෙන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අමානුෂික හිරිහැර කිරීම් නේ?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔව්. අපි සම්පූර්ණ සහයෝගය පළ කරනවා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු මහ ඇමතිතුමාට ඉදිරිපත් වීමේ හැකියාව හදාගන්න ඕනෑ. පොලිස්පතිතුමාත් එක්ක සාකච්ඡාවක් ගෙනැල්ලා මේක කථා කරන්න ඕනෑ. ගරු සභාපතිතුමා, ගරු මහ ඇමතිතුමා ඉදිරිපත් වෙන්න ඕනෑ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු ඇමතිතුමා පළ කරන සහයෝගය මොකක්ද කියලා මේ සභාව දැනගන්න කැමැතියි. අපට දැනගන්න ඕනෑ මේ ගරු ඇමතිතුමා දෙන සහයෝගය මොකක්ද කියලා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පොලිස්පතිගෙන් ඉල්ලීමක් කරනවා. වහාම පරීක්ෂණ කරන්න කියලා.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ඒක තමයි 13 වැනි සංශෝධනය ගේන්න කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මහ ඇමතිතුමාට නීතිය හා සාමය තිබුණාට පොලිස් බලතල නැහැ නේ?

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

නැහැ. නැහැ. මහ ඇමතිතුමාට තිබෙනවා.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ඒක තමයි 13 වැනි සංශෝධනය ගෙන්න කිව්වේ. 13 වැනි සංශෝධනය ගෙනාවා නම් මේවා කරන්න බැරි වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මහ ඇමතිතුමා නීතිය හා සාමය ඇමතිතුමා වුණාට එතුමාට බලයක් නැහැ, පොලිසියට -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඇමතිතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි .මේ නිලධාරියාගේ මානසික ප්‍රශ්නයක්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මේ කාරණයට අදාළව මහ ඇමතිතුමා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පොලිස් නිලධාරියාගේ මානසික ප්‍රශ්නයක්. වහාම පරීක්ෂණයක් කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එක්කෙනෙක් කථා කරන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මහ ඇමතිතුමාට ඊට අදාළ බලය තිබෙනවා. නීතිය හා සාමය විෂයය යටතේ තමුන්නාන්සේට පුළුවන් පොලිස්පතිවරයාගෙන් විමසන්න. මේ විධියේ ප්‍රශ්නයක් වුණාද කියලා. මහ ඇමතිතුමාගේ විෂයය පථය.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, අපි දන්න හැටියට නම් මේකේ තවම ඒ පොලිස් ස්ථානාධිපතිතුමා ස්ථාන මාරු කිරීමක් විතරයි කරලා තිබෙන්නේ. අඩුම තරමේ වැඩ තහනම් කරලා පරීක්ෂණයක්වත් පටන්ගෙන නැහැ, පොලිස් කොමිෂන් එකෙන්. හරි නම් පොලිස් කොමිෂන් එකට බලපෑමක් කරන්න ඕනෑ. මේ පිළිබඳව ඒ නිලධාරියාගේ වැඩ තහනම් කරලා පරීක්ෂණයක් කරලා ඒ මිනිහා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඔබතුමා පොලිස් කොමිෂන් එකට යන්න ඕනෑ. අපිත් යන්න එනවා. පොලිස් කොමිෂමට ඔබතුමා යන්න ඕනෑ අද. අපිත් එනවා මන්ත්‍රීතුමාත් එක්ක යන්න. පොලිස් කොමිෂමට පැමිණිලි කරන්න ඕනෑ. එහෙම පොලිසියට හැසිරෙන්න බැහැ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

පොලිසිය භාර ඇමතිවරයාට ඒ ගැන වාර්තා කරන්න ඕනෑ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

පොලිස් කොමිෂමට යන්න අපට පුළුවන්. ඔබතුමා යන්න. අපිත් එනවා, ඔබතුමාත් එක්ක යන්න. මන්ත්‍රීවරයෙකුට වෙලා තිබෙන්නේ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

සභාව කල් තියලා අපි යමු.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි ඔබතුමාට නිල වශයෙන් මේ සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය ආරක්ෂා කිරීමේ වගකීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ දේ කරනවා. අපි අනිවාර්යයෙන් ඒ දේ කරනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

කරුණාකරලා ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කරනවා, ඔබතුමා මගින්. නීතිය හා සාමය විෂයය යටතේ තිබෙන ප්‍රතිපාදන යටතේ පොලිස්පතිතුමා හම්බ වෙලා ක්‍රියාත්මක වෙන්න කියලා. මොකද, මේ මන්ත්‍රීවරුන්ගේ ජීවිත පිළිබඳව මහා තර්ජනයක් තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එක කාරණයක් නොවෙයි. කීපයක් වුණා නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සමහර නිලධාරීන් වැදගත් විධියට රාජකාරිය කරනවා. සමහරු පිස්සෝ වාගේ ඉන්නවා. ඒ අයව ගෙදර අරින්න ඕනෑ.

# පළාත් සභාවේ රැස්වීම
PROVINCIAL COUNCIL MEETING

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

*"ගරු සභාපතිතුමනි, අද දින (2018.01.23 වන දින) විසිර යෑමෙන් අනතුරුව මෙම සභාව, 2018.02.20 දින පෙ.ව. 09.30 ට රැස් විය යුතු අතර, 2018.02.06 වන (අඟහරුවාදා) දිනය, සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් විය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතු ය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ කටයුතු
PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

*"ගරු සභාපතිතුමනි, අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතු ය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය : දෙවනවර කියැවීම
PAWNBROKER'S (AMENDMENT) STATUTE : SECOND READING

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ 2018 අංක... දරන බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන)ප්‍රඥප්තිය දෙවනවර කියැවීම සඳහා ඉදිරිපත් කරමි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

# පූර්ණ කාරක සභාව
COMMITTEE OF THE WHOLE COUNCIL

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2017 අංක .. දරන බඩු උකස් ගන්නන්ගේ සංශෝධන ප්‍රඥප්තිය[1] දෙවන වර කියැවීමේ වැඩ සටහන ආරම්භ කිරීමට මේ අවස්ථාවේදී සභාව පූර්ණ කාරක සභා අවස්ථාවට පත් කරනවා.

***ඊට අනුකූලව පළාත් සභාව පූර්ණ කාරක සභාව බවට පරිවර්තනය විය.***
*Accordingly, the Provincial Council resolved itself into a Committee of the whole Council.*

---

[1] 2018.01.23 වන දින න්‍යාය පත්‍රය පළ කර ඇත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න. ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ 2017.12.07[2] වන දින ප.ව. 02.00 ට බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි සභා රැස්වීම් ශාලාවේ පැවැති කාරක සභා රැස්වීම් වාර්තාව අනුව එම අවස්ථාවට ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා කාරක සභාවේ සභාපති. සුමිත් විජයමුණි ද සොයිසා ගරු මන්ත්‍රීතුමා, කාරක සභාවේ සාමාජික. කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා කාරක සභාවේ සාමාජික, ජනක දීපාල් වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා කාරක සභාවේ සාමාජික, ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා කාරක සභාවේ සමාජික. එතුමන්ලා මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව මේ සම්බන්ධව මම හිතන්නේ අපි කාරක සභාවේ සංශෝධනවලට යටත්ව මේ සභාවේ සම්මත කිරීමට ඔබතුමන්ලාගේ එකඟතාවය මට ලබා දෙන්න.

ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ සම්බන්ධයෙන් මොකුත් අදහස් තිබෙනවාද? විපක්ෂයෙන් එහෙම. ප්‍රශ්නයක් නැහැ. එහෙමනම් ඒ සම්බන්ධව ගරු සභාවේ කිසිම බෙදීමක් නැහැ. ඒ නිසා එම සංශෝධනයන්ට යටත්ව මෙම ප්‍රඥප්තිය සභා සම්මත වූ බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.***
*The question, having been moved, was adopted by the Council subject to amendments of the Committee on Statutes and Laws.*

# බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය : තුන්වන වර කියැවීම
## PAWNBROKER’S (AMENDMENT) STATUTE : THIRD READING

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, “*බස්නාහිර පළාතේ 2018 අංක... දරන බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන)ප්‍රඥප්තිය තුන් වන වර කියැවීම සඳහා සංශෝධිතාකාරයෙන් ඉදිරිපත් කරමි.*”

[2] 2018.01.23 වන දින න්‍යාය පත්‍රය පළ කර ඇත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙමනම් එම තෙවන වර කියැවීමේ අවස්ථාවත් සංශෝධනයන්ට යටත්ව සභා සම්මත වූ බව මේ ප්‍රකාශ කර සිටිනවා.

***ප්‍රශ්නය සංශෝධිතාකාරයෙන් විමසන ලදින්, සභා සම්මත විය.***
*Question, as amended was put and adopted*

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී පූර්ණ කාරක සභාව පළාත් සභාවක් බවට පත් වෙනවා.

***ඊට අනුකූලව පූ.භා. 10.32 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***
*Accordingly at 10.32 a.m. the Provincial Council resolved it self in to a committee of the whole Council.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රය අනුව මීළඟට තිබෙන්නේ පෞද්ගලික මන්ත්‍රී යෝජනා. ඒ අනුව නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉදිරිපත් කිරීමට එතුමාට මම ආරාධනා කරනවා. ඒත් එක්කම ගරු නියෝජ්‍ය සභාපති යසපාල කෝරලගේ මැතිතුමාට මූලාසනයේ අසුන් ගන්නා ලෙසට ඉතාමත් ගෞරවයෙන් ආරාධනා කරනවා.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***
*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"ශ්‍රී ලංකාව තුළ විවෘත ආර්ථික වෙළඳපොළ හඳුන්වාදීමත් සමග පරිභෝජනවාදය සීඝ්‍රයෙන් වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස බැහැර කරන කැළි කසළ ප්‍රමාණය සීඝ්‍රයෙන් ඉහළ ගියේ ය. එසේ බැහැර කරන කැළි කසළවල දිරාපත් නොවන ලන්ච් ෂීට්, සිලි බෑග්, රෙජිෆෝම්, පොලිතින් විශාල වශයෙන් එක් වූ අතර, එහි ප්‍රතිඵලයක ලෙස දිරාපත් වන කසළ දිරාපත්වීම ප්‍රමාදවීමට මෙය හේතු වූ අතර, පරිසරයටත්, සමාජයටත් මානව පැවැත්මටත් වෙනත් සත්ව කොටස්වලටත් බහුවිධ බලපෑමක් එක් කළ අතර, දිරාපත් නොවී කුණු කඳු ගොඩගැසීම නිසා විශාල ඛේදවාචකයක් සහ ජීවිත හානි ද සිදු විය.*

*කසළ බැහැර කිරීමට, දිරාපත්වීමට, ප්‍රතිචක්‍රීකරණයට හා කොම්පොස්ට් නිෂ්පාදනයට ලන්ච් ෂීට්, සිලි බෑග්, රෙජිෆෝම්, පොලිතින් විශාල ප්‍රමාදයක් හා බාධකයක්, ව්‍යසනයක්, ඇති කරන බැවින් ඒවා නිෂ්පාදනය කිරීම, විකිණීම හා භාවිතය තහනම් කරමින් අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජය ගනු ලැබූ තීරණය අපේ රටේ අනාගතය, අනාගත පරපුර හා පරිසරය සම්බන්ධ ඵලදායි ප්‍රතිපත්ති තීරණයක් ලෙස පැසසුමට හා අගය කිරීමට ලක් කරන අතර රට වෙනුවෙන් මෙම පොලිතින් තහනම ක්‍රියාත්මක කිරීමටත් ඊට අදාළ නීතිය ක්‍රියාත්මක කිරීමටත්, බස්නාහිර පළාත් සභාවේ සහය පළ කළ යුතු යැයි යෝජනා කරමින්, මෙම ප්‍රතිපත්ති කවර බලපෑමක් නිසාවත් ආපස්සට නොහැරවිය යුතු යැයිද, පරිසර හිතකාමී විකල්ප ආදේශන ප්‍රවර්ධනය කිරීමටත්, ජනගත කිරීමටත් කඩිනමින් කටයුතු කළ යුතු යැයිද, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයෙන් ඉල්ලා සිටියි."*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

*[විසින් ස්ථිර කරන ලදී. ]*
*[Seconded]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

යෝජනාව සම්බන්ධව කථා කරන්න ඔබතුමාට අවස්ථාව තිබෙනවා.

[පූ.භා. 10.36]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කැළි කසළ පිළිබඳ ප්‍රශ්නයේදී ඉතාමත් බරපතළ ප්‍රශ්නයක් බවට පත් වුණේ - විශේෂයෙන්ම මේ පොලිතින්, සිලිසිලි බෑග්, ඒ වාගේම රෙජිෆෝම් වැනි දේවල් අපේ පරිසරයට එකතුවීම නිසා විශාල පාරිසරික බලපෑමක්, ඒ වාගේම පාරිසරික ව්‍යසනයක් ඇති කරලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ තත්ත්වය ඇති වුණේ 1977 විවෘත ආර්ථිකය මේ රටට හඳුන්වා දීමත් සමගයි. විවෘත ආර්ථිකය මේ රටට හඳුන්වා දීමට ප්‍රථම අපේ රට තුළ අපේ රටේ ජනතාව තමන්ගේ එදිනෙදා අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා කඩපොළට ගියාම, ඒ වාගේම වෙළඳපොළට ගියාම, කඩේට ගියාම, තමන්ගේ භාණ්ඩ සහ අවශ්‍ය කරන එළවළු, පළතුරු, මස්, මාළු සහ අනිකුත් දේවල් රැගෙන ඒම සඳහා බෝහෝ වෙලාවට භාවිතා කළේ රෙදි බෑග්. ඒ වාගේම විශේෂයෙන්ම අපි කියන්න ඕනෑ, කඩදාසිවලින් සහ සිමෙන්ති බෑග් වලින් සකස් කරපු බෑග් තමයි මේ භාණ්ඩ තමන්ගේ නිවසට ගෙන ඒම සඳහා භාවිතයට ගත්තේ.

ඒ වාගේම කෙසෙල් කොළ, හබරල කොළ වැනි පරිසරයට කඩිනමින්, ඉක්මණින් දිරාපත් වන දේවල් තමයි විශේෂයෙන්ම පාවිච්චි කරනු ලැබුවේ. නමුත් 77 විවෘත ආර්ථිකයත් සමග අපේ රටේ මේ වෙළඳ පොළ ආර්ථිකය හඳුන්වා දීමත් එක්ක සුපර් මාර්කට් සංකල්පය පැමිණීමත් සමග වේගයෙන් පරිසර හිතකාමීව තිබුණු ඇසුරුම් සහ පරිසර හිතකාමීව භාවිතයට ගත හැකි බෑග් වර්ග ඉවත් වෙලා, ඒ වෙනුවට පොලිතීන් වර්ග, විශේෂයෙන්ම සිලි සිලි බෑග් සහ කෑම ඇසිරීම සඳහා ලන්ච් ෂීට් භාවිතය වැඩි වුණා. මෙහි ප්‍රතිඵලයක් විධියට විශේෂයෙන්ම මේවා බැහැර කිරීමේදී මේවා කුණු ලෙස අපි බැහැර කරපු අවස්ථාවලදී, ඒවා දිරාපත් වීම සඳහා දීර්ඝ කාලයක් ගත වෙනවා. ඇත්ත වශයෙන්ම සමහර වෙලාවට ඒවා දිරාපත් වෙන්නේ නැහැ. ඒ නිසා කුණු කඳු එකතු වුණත්, ඒ කුණු කඳු දිරාපත් වීමටත් විශාල බාධකයක් බවට පත් වුණා මේ ලන්ච් ෂීට් ඒ වාගේම පොලිතීන් සහ සිලි සිලි බෑග් කියන ඒවා. ඉතින් මේක විශාල වසංගතයක්, ව්‍යසනයක් බවට පසුගිය කාලය පුරා පත් වුණා

විතරක් නොවෙයි. විශේෂයෙන්ම විශාල බෙදවාචකයන් පවා නිර්මාණය වුණා. මීතොටමුල්ල කුණු

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

කන්ද ආශ්‍රය කරගෙන. මීතොටමුල්ල කුණු කන්ද ඇත්ත වශයෙන්ම දිරාපත් නොවීමටත්, එය එන්න එන්න ඉහළ යෑමට ප්‍රධාන වශයෙන්ම හේතු වුණොත් මේ පොලිතීන්, ලන්ච් ෂීට් සහ සිලි සිලි බෑග්. මොකද, මේවා දිරිපත් වෙන්නේ නැහැ. ඒ දිරාපත් නොවීම නිසා විශේෂයෙන්ම මේවා කුණු කඳු අතර දිගටම පැවතීම නිසා කුණු කඳු චලනය වෙන්නත්, ඒවා ලිස්සා යන්නත් කිසියම් විධියකට හේතු වෙනවා. අපි දැක්කා, මේ කුණු කන්ද අවස්ථා ගණනාවකදී නාය යනවා. ඒ නිසා මෙන්න මේ කරුණු පිළිබඳව විශේෂයෙන්ම අවධානය යොමු කරලා පසුගිය කාලය පුරා අපේ සමාජය තුළ විශාල සාකච්ඡාවක්, සංවාදයක් ඇති වුණා. මේ පොලිතීන් තහනම පිළිබඳව. නමුත් මේ පොලිතීන් තහනටම විරුද්ධව ක්‍රියාත්මක වන බලවේග ටිකක් තිබෙනවා. නමුත් ඔවුන්ට ඇත්ත වශයෙන්ම හේතු වෙලා තිබෙන්නේ මේකත් කර්මාන්තයක්. විශාල කර්මාන්තයක් බවට පත් වෙලා තිබුණා. පොලිතීන් නිෂ්පාදනය කරන එක. ලන්ච් ෂීට් නිෂ්පාදනය කරන එක. සෑප්ෆෝම් නිෂ්පාදනය කරන එක. ඒ වාගේම පොලිතීන් ආශ්‍රිත නිෂ්පාදන විශාල වශයෙන් කර්මාන්තයක් විධියට පසුගිය කාලයේදී වර්ධනය වෙලා ආවා. ඒ ආශ්‍රිතව විශාල රැකියා ප්‍රමාණයකුත් නිර්මාණය වුණා. ආදායම් මාර්ග නිර්මාණය වුණා. ඒ නිසා මෙය තහනම් කිරීම පිළිබඳව විශාල ගැටළුවක් පසුගිය කාලය පුරාම මතු වෙලා තිබුණා. නමුත් අතිගරු ජනාධිපතිතුමා පරිසර අමාත්‍යවරයා විධියට මේ ගැන විශේෂ අවධානය යොමු කළා. අවධානය යොමු කරලා පොලිතීන් තහනම් කිරීමේ වැදගත්කම පෙන්වා දුන්නා. ඒ අනුව අතිවිශේෂ ගැසට් පත්‍රයක් යටතේ තහනම් කරනු ලැබුවා. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත. ඒ පනත යටතේ ඉදිරිපත් කළා

*"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වන වගන්තිය සමග එක් විය යුතු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම මෙම නියමය මගින්,*

1. දේශීය භාවිතය සඳහා ඝණකමින් මයික්‍රෝන 20 හෝ ඊට අඩු පොලිතීන් හෝ යම් පොලිතීන් නිෂ්පාදන නිපදවීම හෝ ඝණකමින් මයික්‍රෝන 20 හෝ ඊට අඩු පොලිතීන් හෝ යම් පොලිතීන් නිෂ්පාදන රට තුළ විකිණීම. විකිණීම සඳහා අර්පනය. ප්‍රදර්ශනය. නොමිලේ ලබා දීම හෝ භාවිතය තහනම් කරමි" කියලා.

දැන් මේ ගැසට් පත්‍රයට අමතරව ජනාධිපතිතුමා තවත් අතිවිශේෂ ගැසට් නිවේදයක් නිකුත් කළා. ඒ අනුව දේශීය භාවිතය සඳහා පොලිතීන් අමුද්‍රව්‍යයක් වන ආහාර දවටන නිපදවීම සහ පොලිතීන් අමුද්‍රව්‍යයක් ලෙස යොදා නිෂ්පාදිත ආහාර දවටන රට තුළ විකිණීම, විකිණීම සඳහා අර්පණය, නොමිලේ ලබා දීම, ප්‍රදර්ශනය හෝ භාවිතය. මේ නියමයේ කාර්යය සඳහා ආහාර දවටන යන්නෙන් ලන්ච් ෂීට් අදහස් වේ. පොලිතීන් යන්නට වැඩි ඝණත්වයෙන් යුතු පොලිඑතලීන් අඩු ඝණත්වයෙන් යුතු පොලිඑතිලීන් සහ පොලිප්‍රොපිලින් ඇතුළත් වේ. මේ දෙවැනි ගැසට් නිවේදනය ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

ඊළඟට තවත් ගැසට් නිවේදයක් නිකුත් කළා. ඒ 1980 අංක 48 දරන ජාතික පාරිසරික පනත යටතේ. එම අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් තහනම් කළා දේශීය භාවිතය සඳහා වැඩි ඝණත්වයෙන් යුතු පොලිඑතිලීන් අමුද්‍රව්‍යක් වන යම් මළු නිෂ්පාදනය සහ වැඩි ඝණත්වයකින් යුතු පොලි එලිතීන් අමුද්‍රව්‍යයක් ලෙස යොදා නිෂ්පාදිත යම් මළු රට තුළ විකිණීම, විකිණීම සඳහා අර්පනය, නොමිලේ ලබා දීම හෝ භාවිතය මේ උපලේඛනයේ කාර්ය සඳහා වැඩි ඝණත්වයෙන් යුතු පොලි එලිතීන් අමුද්‍රව්‍යයක් ලෙස යොදා නිෂ්පාදිත මළු යන්නෙන් සිලි සිලි බෑග් - සිලි සිලි බෑග් සම්පූර්ණයෙන්ම තහනම් කළා. පොදුවේ හඳුන්වනු ලබන පාරිභෝගිකයන්ගේ මළුද ඇතුළුව නිෂ්පාදන හෝ භාණ්ඩ රැගෙන යෑමේ කාර්යය සඳහා අතළු සහිත හෝ රහිත වන කුමන හෝ පරිමාණයකින් යුතු මළු අදහස් වේ. 2017.09.01

ඊළඟට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තවත් අතිවිශේෂ ගැසට් නිවේදනයක් කළා. ඒ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ. එමගින් ජනාධිපතිතුමා

නියෝග කර සිටියා. මෙම නියෝගය 2017 අංක ...... දරන ජාතික පාරිසරික නියෝග ලෙස හඳුන්වනු ලැබේ කියලා. ඒ යටතේ ප්ලාස්ටික් අඩංගු කසළ හෝ පහසුවෙන් දැවෙන වෙනත් ද්‍රව්‍ය එළිමහනේ පිළිස්සීම. අපි දන්නවා අපේ ගම්වලට ගියාම විශේෂයෙන්ම අපේ ජනතාව පුරුදු වෙලා තිබෙනවා මේ ප්ලාස්ටික්, පොලිතීන් ඒ වාගේම සිලි සිලි බෑග්, ලන්ච් ෂීට් සහ සෑජුෆෝම් මේවා ඔක්කෝම එකට ගොඩ ගහලා ගිනි තියනවා. ඇත්ත වශයෙන්ම දැන් WHO එක පැහැදිලිවම කියලා තිබෙනවා මේවා ගිනි තැබීමෙන් විශාල පාරිසරික හානියක් විතරක් නොවෙයි, පිළිකා රෝග ඇති වෙන්නත් මේකේ පැහැදිලිවම බලපෑමක් ඇති කරනවා කියලා. දැනටම ලෝක සෞඛ්‍ය සංවිධානය මේ පිළිබඳව වාර්තාවක් නිකුත් කරලා තිබෙනවා. ඒ අනුව මේවා ප්‍රසිද්ධියේ හෝ රහසිගතව හෝ ඕනෑම ආකාරයකින් පිළිස්සීම සම්පූර්ණයෙන්ම තහනම් කරලා තිබෙනවා. කිසිදු තැනැත්තෙකු ප්ලාස්ටික් අඩංගු කසළ හෝ පහසුවෙන් දැවෙන වෙනත් ද්‍රව්‍ය එළිමහනේ පිළිස්සීම, පිළිස්සීමට සැලැස්වීම, ඉඩ දීම හෝ අවසර දීම සිදු නොකළ යුතුය. ඉහත නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන යම් තැනැත්තෙකු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ වරදකට වරදකරු වන අතර 31 වන වගන්තිය යටතේ දඬුවමකට යටත් විය යුතුය.

මේ විධියට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අතිවිශේෂ ගැසට් නිවේදන 04 ක් නිකුත් කරලා තිබෙනවා. ඒ වාගේම තවත් ගැසට් නිවේදනයකින් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා නියෝග කර තිබෙනවා, දේශීය භාවිතය සඳහා ප්‍රසාරිත පොලිස්ටයරින්වලින් ආහාර සැපයුම් පෙට්ටි, පිඟන්, කෝප්ප සහ හැඳි නිෂ්පාදනය සහ ප්‍රසාරිත පොලිස්ටයරින්වලින් නිෂ්පාදිත ආහාර ඇසුරුම් පෙට්ටි, පිඟන් කෝප්ප, හැඳි රට තුළ විකිණීම. විකිණීම සඳහා අර්පනය නොමිලයේ ලබා දීම, ප්‍රදර්ශනය හා භාවිතය. මෙහිදී මේ නියමයේ කාර්යය සඳහා ආහාර ඇසුරුම් පෙට්ටියක් යන්නෙන් ආහාර බහාලන පෙට්ටි, ඒ කියන්නේ ලන්ච් බොක්ස් අදහස් වේ. දැන් මේවා පැහැදිලිව අද තහනම් කරලා තිබෙනවා. ඒ නිසා මෙය නීතියක් විධියට අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක විය යුතුයි. මොකද, අපි දන්නවා මේ පොලිතින් භාවිතය නිසා අපේ රට තුළ අද කුණු කඳු 62 ක් ගොඩ ගැහිලා තිබෙනවා. රට පුරා කුණු කඳු 62 ක් තිබෙනවා. මේ කුණු කඳුවලින් මහජනයා විතරක්, මානවයා විතරක් නොවෙයි පීඩාවට පත් වෙන්නේ. මේ කුණු කඳු ආශ්‍රිතව මේ කුණු ආහාරයට ගැනීම සඳහා පැමිණෙන සතුන්ද අද විශාල වශයෙන් මේ නිසා අනතුරට, අවදානමට ලක් වෙලා තිබෙනවා. අපි දැක්කා පසුගිය කාලයේ මේ කුණු කඳු ආශ්‍රිතව ඉන්න අලි සහ වෙනත් සතුන් ඇවිල්ලා මේවා ආහාරයට ගැනීම නිසා ඔවුන්ගේ ආහාර ජීර්ණ පද්ධතිය තුළ මේ පොලිතීන් දිරාපත් නොවීම නිසා ඔවුන් මරණයට පත් වන ආකාරය. එහෙම නම් මේක අද විශාල පාරිසරික ප්‍රශ්නයක්. එසේ නම් මේ නීතිය බලාත්මක විය යුතුයි. මේක ක්‍රියාත්මක විය යුතුයි. මේක මැතිවරණ සමයක්. මේ මැතිවරණ සමයේත් අතිගරු ජනාධිපතිතුමා විශේෂ ගැසට් නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියා මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා කිසිසේත් පොලිතින් භාවිතා නොකළ යුතුයි කියලා නියෝගයක් පැනෙව්වා. ඒ නිසා මේක අද අපේ රටේ ව්‍යසනයක් බවට පත් වෙලා තිබෙනවා. අපට විවෘත ආර්ථිකය තුළ හිමි වුණු මේ විනාශකාරී මෙවැනි දේවල් අපේ සමාජයෙන්, අපේ වෙළඳ පොලෙන්, අපේ පාරිභෝගික ජීවිතයෙන් ඉවත් කරන්න, බැහැර කරන්න අපි කටයුතු කරන්න ඕනෑ.

ඒ වාගේම අද වන විට විකල්ප විශාල ප්‍රමාණයක් මේ සඳහා ආදේශන විශාල ප්‍රමාණයක්, මේ වන කොට හඳුන්වා දීලා තිබෙනවා. ඒවා ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ඒ වාගේම අපි කියන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක සිලි සිලි බෑග් එකක් නොවෙයි. දින 180 ක් ඇතළත මේක නැවත වතාවක් පොළොවට දිරාපත් වන පොලිතින් වර්ගයක්. දින 180 ක් ඇතුළත නැවත මේ බෑගය පාවිච්චි කරලා බැහැර කළාට පස්සේ නැවත වතාවක් මේක මහ පොළොවට දිරාපත් වෙනවා. ඒ වාගේම තමයි මේ ලන්ච් ෂීට්. මේවා නිෂ්පාදනය කරලා තිබෙන්නේ බඩ ඉරිඟුවලින් සහ මඤ්ඤොක්කාවලින් තමයි මේ ලන්ච් ෂීට් නිෂ්පාදනය කරලා තිබෙන්නේ. ඒ නිසා මේවා කිසිසේත් පරිසරයට හානිකර නැහැ. දැන් සමහර රටවල්වලට අපි ගිහිල්ලා බැලුවාම, විශේෂයෙන්ම වියට්නාමය, චීනය වාගේ රටවල්වල හාල්වලින් ලන්ච් ෂීට් නිෂ්පාදනය කරලා තිබෙනවා. කෑම එක කාලා ඉවර වෙලා අවශ්‍ය නම් මේ ලන්ච් ෂීට් එකත් කාලා දාන්න පුළුවන්. කිසි ප්‍රශ්නයක් නැහැ. වියට්නාමයේ ඒ විධියට නිෂ්පාදනය කරලා තිබෙනවා. එහෙම නම් රට ඇතුළේ දැන් නිෂ්පාදනය කරලා තිබෙන නිෂ්පාදනයක්. මේ ලන්ච් ෂීට් කිසිසේතම

පරිසරයට හානිකර නැහැ. මෙවැනි නිෂ්පාදන අද වෙළඳ පොළේ තිබෙනවා. මේ තවත් එවැනිම නිෂ්පාදනයක්.

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

මේකේ සිලි සිලි ගතියක් නැහැ. මේක ඉතාම ඉක්මණින් දින 80 ක් 180 ක් ඇතුළත මහ පොළොවට දිරාපත් වන නිෂ්පාදන. එහෙම නම් මේවා ප්‍රවර්ධනය කළ යුතුයි. නමුත් මේවා වෙනදා ලබාගත් මිලට ලබා ගන්න බැහැ. එදා ලන්ච් ෂීට් එකක් ශත 50 කට ලබා ගත්තා නම් අද ඒක රුපියල් 1.50 යි. සමහර විට රුපියල් තුනක් විතර වෙන්නත් පුළුවන්. පරිසරයට අපි යම්කිසි ආකාරයකට ආදරය කරනවා. අපි පරිසරයට යම්කිසි වටිනාකමක් දෙනවා. ඒ වෙනුවෙන් අපි මිලක් ගෙවන්න ඕනෑ. අපට බත් එකකට රුපියල් 150 ක්, රුපියල් 200 ක් ගෙවන්න පුළුවන් නම් ඇයි අපි රුපියල් දෙකක්, එහෙම නැත්නම් රුපියල් තුනක් මේ පරිසරයට බැහැර කරන ලන්ච් ෂීට් එක වෙනුවෙන් අපට ගෙවන්න බැරි? ඒක නිසා මේ පිළිබඳව අපේ සමාජය තුළ අලුත් සාකච්ඡාවක්, සංවාදයක් ඇති කරලා මේවා ප්‍රවර්ධනය කරන්න කටයුතු කරන්න ඕනෑ. අපට පේනවා ඇතැම් පිරිස් මේ නීතිවලට අභියෝග කරමින් අද ඇවිල්ලා කියනවා පොලිතීන් කර්මාන්තය මේකෙන් විශාල අඩාලවීමක් වෙනවා. මේකෙන් මෙපමණ රැකියලා ප්‍රමාණයක් අහිමි වෙනවා. නමුත් අපි බලන්න ඕනෑ සමස්තයට කරන බලපෑම කුමක්ද කියලා. පාරිසරික වශයෙන් සමස්තයට මොනතරම් මිලක් ගෙවන්න වෙලා තිබෙනවාද කියලා. ගෙවී ගිය අවුරුදු 20, 30 ඇතුළත අපේ රට ඇතුළේ ගොඩ ගැහිලා තිබෙන මේ පොලිතීන්, ප්ලාස්ටික් සහ පරිසරයට දිරාපත් නොවන මේ නිෂ්පාදන ඇති කරලා තිබෙන බලපෑම අනාගතයටත් විශාල හානිකර තත්ත්වයක් ඇති කරනවා. ඒ නිසා මේ පිළිබඳව අපි සාකච්ඡාවක් ඇති කරලා, සංවාදයක් ඇති කරලා මේවා ප්‍රවර්ධනය කරන්න කටයුතු කරන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. අපේ ජීවිත ඇතුළේත් මේවා අපි භාවිතයට ගන්න කටයුතු කරන්න ඕනෑ කියන ඉල්ලීම කරමින් මේ තීරණ බලාත්මක කිරීම සඳහා රජයට අපි සම්පූර්ණ සහාය ලබා දෙන අතර, බස්නාහිර පළාත් සභාව විධියටත් මේක ප්‍රවර්ධනය කිරීම සඳහා අපේ අමාත්‍යවරුන්ගේත්, අදාළ ආයතන, සංස්ථා, දෙපාර්තමේන්තුව ඇතුළු සියල්ලගේම අවධානය යොමු කරමින් මේ සඳහා ආදර්ශයක් ලබා දිය යුතුයි කියලා මම මේ අවස්ථාවේ ඉල්ලා සිටිමින් මගේ අදහස් දැක්වීම නතර කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමා. එම යෝජනාව සම්බන්ධව පැහැදිලි කිරීම පිළිබඳව. දැන් සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[පූ.භා. 10.50]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන් බෙහෙවින්ම කාලෝචිත සහ අපේ අවධානයට ලක් විය යුතු විෂයක් පිළිබඳව මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධව විශේෂයෙන්ම නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ කාරණයේදී ඇත්තටම අපේ අතේ මහ දැවැන්ත අතපසුවීමක්, අපි අතින් දැවැන්ත වරදක් සිද්ධ වෙලා තිබෙනවා. මම හිතන්නේ අඩුම ගණනේ මේ වෙලාවේදීවත් එතුමා කියපු විධියට අපේ ඒ වරද නිවැරදි කරගත යුතුයි. ඇත්ත වශයෙන්ම ඒක වරදක්. මම හිතන්නේ 2017 ජූලි 11 වැනිදා මේ පිළිබඳව කැබිනට් යෝජනාව එන්නේ. ඒ අනුව 2017 සැප්තැම්බර් 01 වැනිදා වර්ග කිහිපයක පොලිතීන් සහ ප්ලාස්ටික් නිෂ්පාදනය මුළුමනින්ම තහනම් කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට මතකයි ඉස්සර කිරි ආවේ වීදුරු බෝතලේ. දැන් අපට එහෙම වීදුරු බෝතලේ කිරි එනවා දකින්න නැහැ. එතකොට අපි බඩු ගෙනාවේ කඩදාසි බෑග් එකේ. අපි ඒකට කිව්වේ අර සිමෙන්ති බෑග් කියලා. දැන් එහෙම ඒවා නැහැ. දැන් කිරි ටික ගේන්නේ, වතුර ටික ගේන්නේ, එතකොට සෝඩා බෝතලේ මේ සියල්ල වීදුරු වෙනුවට අපි දැන් ප්ලාස්ටික්වලට නැඹුරු වෙලා. මේ ළඟකදී මම ගියා වැඩ බිමකට. එතැන කම්කරුවෝ ගණනාවක් වැඩ කරනවා. ඉනිමගක් තියලා තිබුණා. ඒ ඉනිමගේ එළියට පැනපු ලීයේ රතු පාට ෂොපින් බෑග් එකක් එල්ලලා තිබුණා. බැලූ බැල්මට මට එක පාරට ඒක අඳුර ගන්න බැරි වුණා. නමුත් ටික වෙලාවක් යනකොට මට තේරුණා ඒ තිබෙන්නේ බෑග් එකක් පිරෙන්න ප්ලේන් ටී ගෙනැල්ලා කම්කරුවෝ අතරේ බෙදා ගන්නවා. මේක හරි බරපතළ තත්ත්වයක්, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපි මේ ගැන අවධානය යොමු කරන්න හේතුව මේකේ බරපතළකම මෙන්න මෙහෙමයි.

මොකක්ද? අවුරුද්දකට අපේ රටේ ප්ලාස්ටික් සහ පොලිතීන් මෙට්‍රික් ටොන් ලක්ෂ 05 ක් පමණ ආනයනය කරනවා. අවුරුද්දකට මෙට්‍රික් ටොන් ලක්ෂ 05 ක් අපි ආනයනය කරනවා. මේකෙන් 70% ක් අපි දේශීයව භාවිතයට ගන්නවා. මෙට්‍රික් ටොන් ලක්ෂ 05 න් 70% ක්. එතකොට මේකෙනුත් 30% ක් අපි පරිසරයට එකතු කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දවසකට ලංකාවේ කසළ මෙට්‍රික් ටොන් 8000 ක් පරිසරයට මුදා හරිනවා. අපද්‍රව්‍ය ටොන් 8000 ක් ජනනය වෙනවා. ඒකෙන් මෙට්‍රික් ටොන් 480 ක් මොනවාද කියලා දන්නවාද? ප්ලාස්ටික් අපද්‍රව්‍ය. එතකොට හිතාගන්න පුළුවන් නේද සාමාන්‍යයෙන් මේ පොලිතීන්, ප්ලාස්ටික් දිරන්න අවුරුදු 500 ත්, 1000 ත් අතර කාලයක් ගත වෙනවා. එතකොට දවසකට මෙට්‍රික් ටොන් 480 ගණනේ නොදිරන ඒවා අවුරුදු 500 ක් එකතු වුණොත් මොනවා වෙයිද? ඒ ගණන් ටික ඇති මේකේ බරපතළකම තේරුම් ගන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා මේක අපි වෙනස් කරන්න නම් පැහැදිලිවම පොලිතීන් තහනම් කරන්න ඕනෑ. එතකොට පොලිතීන් තහනම් කරන්න ගියාම සමහරු විවිධ විවේචන ගෙන ආවා. එහෙම කොහොමද කරන්නේ? ජනාධිපතිතුමා කිව්වාට ඒක කරන්න බැහැ. ව්‍යාපාරිකයෝ අමාරුවේ වැටෙනවා. හැබැයි අපට සමහර තීරණ ගන්න වෙනවා. රටට බරපතළ වරද්දක් වෙනවා. දැන් බලන්න කෝ ඉදි කිරීම් ක්ෂේත්‍රයේදී කෑම ටික ඔතන්න ගත්තත්, සැරසිල්ලක් කරන්න ගියත් මේ සියල්ලම පොලිතීන්. හැබැයි මම මේකේ පොඩි වැරද්දක් දකිනවා. ජනාධිපතිතුම මේ යෝජනාව ගෙනැල්ලා, ගැසට් නිවේදනයක් නිකුත් කරලා මේක තහනම් කළා. අපට බැරි වුණාම අඩුම ගණනේ මේ ඡන්දයේදී අපේ දේශපාලඥයින්ට කියන්න ඒගොල්ලන්ව බලගන්වන්න ඔබලා කිසිම විධියකින් අපේක්ෂකයින්ටවත්, ඡන්දදායකයින්ටවත් පොලිතීන් දාන්න දෙන්න එපාය කියලා. අපට ඒක නවත්ත ගන්න බැරි වුණා. දැන් ඊයේ මම ගියා මෙගොඩ කොලොන්නාවේ මගේ කොට්ඨාශයේ. ඇත්තටම වෙනත් පක්ෂයකින් නොවෙයි. අපි නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂයෙන් මුළු පාරවල් වැහෙන්න පොලිතීන් දාලා. ඇත්තටම මට කනගාටුවක් ඇති වුණා. අපට බැරි වුණා, මේක නතර කර ගන්න. අපි අද රටේ පාලක පක්ෂය නියෝජනය කරන්නේ. ආණ්ඩුව දරන පක්ෂය නේ? ජනාධිපතිතුමා නියෝජනය කරන්නේ ඒ කණ්ඩායම නේ? අපට බැරි වුණා, ඒ පොලිතීන් ටික නතර කර ගන්න. ඒ නිසා මේක අපි එතැනින් පටන් ගන්න ඕනෑ. මේකෙන් අපි පරිසරයට හානි කරන්නේ. දැන් බලන්න අපේ පැතිවල කාණු වැසි වතුරෙන් පිරෙනවා. වැඩිපුර මේකේ තිබෙන්නේ පොලිතීන් හිර වෙලා. පොලිතීන් තමයි වැඩිපුර තිබෙන්නේ. ඒ විතරක්ද? අපි දැන් එළියේ පොලිතීන් දහනය කරනවා. මෙතුමා කිව්වා වාගේ පිළිකා කාරක දුම ඉතාම බරපතළයි. සෞඛ්‍ය ප්‍රශ්න විතරක් නොවෙයි. අනෙකුත් ප්‍රශ්න. ජල පෝෂක ප්‍රදේශවලට හානියක් වෙනවා. එතකොට ජල මූලාශ්‍රවලට, ගංගා, ඇළ දොළවලට. ඒ විතරක් නොවෙයි, තෙත් බිම් සහ ජෛවය විවිධත්වය මේ පොලිතීන් සම්පූර්ණයෙන්ම විනාශ කරනවා. මේකේ රටක් හැටියට අපි ඉන්නේ දූපතක් ඇතුළේ. මෙහෙම පොලිතීන් එකතු කරලා මේ හානිය සිද්ධ කරගත්තොත් අපි මොකක්ද කරන්න හදන්නේ? තව අවුරුදු 50 ක් 60 ක් යනකොට මේක කාන්තාරයක් වෙයි. අපි මේ රටේ අනාගතයට මොනවාද ඉතුරු කරන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ නිසා මේකට අපි විකල්ප හොයන්න ඕනෑ. අපේ රට විකල්ප හොයපු රටක්. අපි ආසයි දැන්න කෙසෙල් කොළේ බත් එකක් කන්න. දැන් නෙළුම් කොළේ බත් කියලා බර ගාණක් කියලා විකුණන්නේ. මම කියන්නේ කර්මාන්තයක් හැටියට අපේ හාමුදුරුවනේ මේක දියුණු කරන්න පුළුවන් නේ? ගමේ කර්මාන්තයක් හැටියට දියුණු කරන්න පුළුවන්. දැන් බත් ඔතන්න කෙසෙල් කොළේ කල් තියා ගන්න පුළුවන් ක්‍රම තිබෙනවා සකස් කර ගන්න. ඇයි අපට කරන්න බැරි? අපි ඒ වාගේ කොපමණ නිෂ්පාදන - දැන් පන්මල්ල තිබෙනවා. කෝ පන්මල්ල? පන්මළු නැහැ. ඔබතුමා කිව්වා දිරන පොලිතීන් විතරක් නොවෙයි, අපට දේශීයව අපේ කර්මාන්තයක් එහෙම තිබුණා. ජපන් ජබරවලින් හදන්න පුළුවන්. පන්වලින් හදන්න පුළුවන්. එතකොට පොල් ගසේ නිෂ්පාදන තිබෙනවා. කෙසෙල් කොළේ. මේවායෙන් විකල්ප නිෂ්පාදනවලට යන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් ඉන්දියාවේ යන්ත්‍ර හදලා තිබෙනවා කෙසෙල් කොළ ටික එකතු කරලා කෑම ගෙනියන්න පුළුවන් පෙට්ටිය හදනවා. ඒක පීඩනයකට ලක් කරලා කෑම ගෙනියන්න පුළුවන් පෙට්ටියක් හදනවා. ඒගොල්ලෝ සමහර කඩවලට ගියාම කෙසේ කොළෙන් හදපු - ලංකාවේත් දැන් හදනවා නේ? කෙසේ කොළෙන් හදපු පිඟානක් දෙන්නේ. ඒක දැන් පෙට්ටියක් වාගේ

හදනවා. කෑම ටික දාලා ඒක වහලා ගෙනියන්න පුළුවන්. ඉතින් මේ වාගේ නිෂ්පාදනවලට අපට ලෙහෙසියෙන් යන්න [ගරු සුසිල් කිඳෙල්පිටිය]

පුළුවන්. ඒ නිසා මේක ඉතාම කාලෝචිත පියවරක්. මිනිසාට, සත්ව සංහතියට, පරිසරයට කරන ලද මහඟු සේවයක් විධියට මම දකිනවා. හැබැයි මේක සක්‍රිය කරන්න ඕනෑ. මේක යථාර්ථයක් කරන්න ඕනෑ. මේකේ ප්‍රතිඵල අපට දැනෙන්න ඕනෑ. මේකේ ප්‍රතිඵලය දැනෙන්න නම් අපි බලය දරන කණ්ඩායම මේක ක්‍රියාත්මක කරන්න ඇත්තටම කැප වෙන්න ඕනෑ කියලා මම විශ්වාස කරනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපට විකල්ප අවශ්‍යයි. හැබැයි අපි දන්නවා එක රාත්‍රියකින් මේ වැඩේ කරන්න බැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දැන් Mobile Phone එක උස්සගෙන යනවා. හැබැයි අපට රෙදි බෑග් එකක් - Mobile Phone එක තරම් බරද රෙදි බෑග් එක. රෙදි බෑග් එකක් අරගෙන යන්න අපි හරි අකැමැතියි. අපි මේකට පුරුදු වෙන්න ඕනෑ.

ඊළඟට මෙතුමා කිව්වා වාගේ ස්වභාවිකව දිරන ප්ලාස්ටික් ඕනෑතරම් තිබෙනවා. අර විකිරණශිලී සාන්ද්‍රණ එකතු කරලා, ස්වභාවිකව දිරන ප්ලාස්ටික් හදනවා. ප්ලාස්ටික් පාවිච්චියට ගන්න පුළුවන්. පොලිතීන් පාවිච්චියට ගන්න පුළුවන්. ඊළඟට දියර ලී කියන ජාතිය. Biopolymer. ඒවා පාවිච්චියට ගන්න පුළුවන්. ඒවා ලෝකයේ දියුණු රටවල ජනප්‍රියයි. මේ සම්බන්ධව අපට වඩා පල්ලෙහාන් ඉන්න රටවල් අපට වඩා ඉදිරියෙන් ඉන්නවා. අපි මීට වඩා වේගයෙන් ඉස්සරහාට යන්න ඕනෑ. දිරාපත්වන දේවල් පාවිච්චි කරලා. මෙතුමා කිව්වා වාගේ තිරිඟු පිෂ්ඨයෙන්, සීනිවලින් දිරාපත්වන ප්ලාස්ටික් වර්ග හදනවා. සමහර වර්ග දින 40 න් දිරනවා. මේවා අපට පාවිච්චියට ගන්න පුළුවන්. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ බරපතළකම තේරුම් අරගෙන ඇත්තටම පළාත් සභාවක් හැටියට අපටත් පුළුවන් මේ වැඩේට වෙනම අතගහන්න. අපට පරිසර ප්‍රඥප්තියක් තිබෙනවා. අපට වෙනම මේ වැඩේට අතගහන්න පුළුවන්. ඒ නිසා අපි මහජන නියෝජිතයෝ හැටියට අපි මේකේ නායකත්වය අරගෙන, මූලිකත්වය අරගෙන වැඩ කරන්න ඕනෑ කියන එකත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[පූ.භා. 11.00]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ගෙනාපු ඉතා වැදගත් යෝජනාවට අදහස් පළ කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධව ප්‍රණාමය. නමුත් මම කනගාටු වෙනවා. වෙනදා යෝජනා දාපුවාම කථා කරන්න ලැයිස්තුවට, නම දාගන්න බැහැ. අද කථා කරන්න කථිකයෝ නැතුව අපේ ආයතනයේ ඉන්න අය තමයි ඇවිල්ලා අහන්නේ මන්ත්‍රීතුමා කථා කරනවාද කියලා. මේ පළාත් සභාව ගැන කනගාටුයි. වෙනදාට නම දාගන්න ගියාම වදින්න ඕනෑ, අපටත් අවස්ථාවක් දෙන්නය කියලා. කොහොම වුණත් කමක් නැහැ, මහජන ඡන්දයෙන් අපි ආවේ පළාත් සභාව නියෝජනය කරන්න. අපේ වගකීමයි අපි ඉටු කරන්නේ. ඒ නිසා මේ කසළ සම්බන්ධයෙන් හිතන කොට මම පළාත් පාලන ආයතනයකින් ආපු සභාපතිවරයෙක්. කසළ කියන එක සම්බන්ධව ඇත්තටම සමාජයේ ප්‍රශ්නයක් නැහැ. නමුත් මේක අපි ඇති කරගෙන තිබෙන කාරණාවක්. මේ කාරණාව කියන්නේ අපට අවබෝධයක් නැහැ. ඒ නිසා මම හිතන්නේ මේ හැම දෙයක්ම කරන්න පෙර පුද්ගලයින්ගේ මනසයි නිර්මාණය කරන්න ඕනෑ. කොහොමද මේ කාරණාව වෙනුවෙන් ජනතාව යොමු කරන්නේ කියන එක. ඉතින් අද අපේ හැම කෙනාම කිව්වා ජනතාව කෑගහනවා. අපේ කර්මාන්ත බිඳ වැටෙනවා. කර්මාන්ත නැති වෙලා යනවා. ඇයි බුදු අම්මේ මේ මිනිස්සුන්ට කෑගහන්න බැරි වුණේ. 77 මේ රටට විවෘත ආර්ථිකය ගේන කොට රටේ දේශීය කර්මාන්තය විනාශ වනකොට, පන් කර්මාන්තය නැති වනකොට, වේවැල් කර්මාන්තය නැති වනකොට, එහෙම නැත්නම් වෙනත් කර්මාන්ත නැති වනකොට මිනිස්සුට මහ පාරට බහින්න තිබුණා. අපේ දේශීය කර්මාන්ත බිඳ වැටෙනවා. රටට නොගැළපෙන දේවල් ගේන්න එපා කියලා කෑගහන්න තිබුණා. කෑගැහුවා නම් ඉටිකොළ එන්න විධියක් නැහැ. කෑගැහුවා නම් නොගැළපෙන දේවල් එන්න තිබුණේ නැහැ. නමුත් අද මේ සියල්ලන්ගෙන්ම මේ රට වෙලාගෙන. අද මේවා මාෆියාවන් බවට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපට නැවත ආපහු යන්න වෙලා තිබෙනවා. ආපහු යන්න නම් ගැටළුවක් තිබෙනවා. මිනිස්සුන්ගේ මනස හදන්න ඕනෑ. පන් තිබුණු කුඹුර අද

ගමේ නැහැ. ගමේ තිබුණු වැටකෙයියා පඳුර අද කපලා විසි කරලා දාලා. අද ගමේ රම්පෙ ගහක් තියාගන්න විධියක් නැහැ. ඩෙංගු වසංගතය නිසා. අද පොල් කර්මාන්තයෙන් නිෂ්පාදනය කරපු වට්ටිය, පෙට්ටිය මේවා එකක්වත් නැහැ. ඒ නිසා අද කෘෂිකර්මය ගත්තත්, කෘෂිකර්මාන්තයට ගත්තු වී පෙට්ටියේ ඉඳලා සියල්ල අද සමාජයෙන් විනාශ වෙලා ගිහිල්ලා තිබෙනවා. මේ සිල්ලටම නවීන නිෂ්පාදනවලින් කරපු ප්ලාස්ටික්වලින් තමයි මේ කාරණා කරන්නේ. අවසානයේ මේවා අතිරික්තයක් වශයෙන්, මේවා ශේෂයන් බවට පත් වනකොට සමාජයට හානිකර තත්ත්වයන් ගණනාවක් ඇති වී තිබෙනවා. අපේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ සතා සිවුපාවාට වාගේම, පරිසරයට වාගේම අපේ සමාජයේ ඩෙංගු වසංගතයට මූලික කාරණය මෙන්න මේ ඉටිකොළ භාවිතය. මෙන්න මේ පොලිතීන් භාවිතය කියන එක අපි පැහැදිලි කරන්නට ඕනෑ. ඒ නිසා මේ තත්ත්වයන් පිළිබඳව ජනතාවට දැනුවත් කරන්න ඕනෑ. තමන් කොහොමද තමන්ගේ ගෘහය තුළ මේ පොලිතීන් ටික පාලනය කර ගන්නේ. පුළුවන්න බැහැ. ගෙදර ඉන්න වැඩිහිටි අම්මා මේ දැනුමෙන් සන්නද්ධ නැති වුණාට අම්මා වගකීමකින් කටයුතු කළා. මිදුල අතු ගෑවා නම් කොළ ටික දැම්මේ කෙසෙල් ගසක් යටට. එහෙම නැත්තනම් ගොම ටික දැම්මේ තමන්ගේ ගෙවත්තට. ඒක බෙදලා. පොල් කුඩු ටික වෙන තැනකට. එහෙම දෙයක් කළා. අද අපට එහෙම දෙයක් කරන්න උවමනාවක් නැහැ. එකක් මනාප දේශපාලනය. කුණු ට්‍රැක්ටරය එවන්න කිව්වාම අර හද්ද පිටිසර ගමට කොහොම හරි කුණු ට්‍රැක්ටරය යවනවා. මිනිස්සු පුරුදු වෙනවා ගෙදර තිබුණු ලට්ට ලොට්ට ටිකයි, කරවල ඔළු ටිකයි, පොල් කුඩු ටිකයි ඔක්කෝම මිටියට ගැට ගහලා පාර අයිනෙන් තියන්න. මේක ඇදගෙන යනවා.

ඒ නිසා අපි ආකල්ප වශයෙන් සංවර්ධනය වෙන්නට ඕනෑ. ආකල්ප වශයෙන් සංවර්ධනය වුණොත් මේ කසළ ප්‍රශ්නයට අපට උත්තරයක් සොයන්න පුළුවන්. ඒකට ප්‍රධාන කාරණාව මේ පොලිතීන්. පොලිතීන් නොගැළපෙනවා කියන එක අපි හැමෝම දන්නවා. ඒ නිසා මේ පොලිතීන් සම්බන්ධයෙන් අපේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ යම් සීමා කිරීම් කරන්නට ඕනෑ. මේ සීමා කිරීම් කරන කොට අපි පෙර පාසලට යන්නට ඕනෑ. දරුවාගේ කෑම පෙට්ටියේ ඉඳලා, දරුවාගේ වතුර බෝතලයේ ඉඳලා අපි දරුවා හුරු කරන්නට ඕනෑ. සමාජයේ ඇති වෙලා තිබෙන මේ ව්‍යසනය සම්බන්ධව. පාසල් දරුවන් පාසලට කසළ ගෙන එන්න විධියක් නැහැ. දරුවන්ට කෑම පෙට්ටිය හුරු කළා නම්, කෑම ටික ගෙන එන්න පුරුදු කළා නම්. කාර්යාලයට එන නිලධාරියාගෙන් කසළ ගේන්න විධියක් නැහැ. ඔහු කෑම පෙට්ටියකට හරි වෙනත් දෙයකට හුරු වුණා නම්. නමුත් හැම කෙනාම කථා කරනවා විතරයි. අපි වගකීමක් කරලා නැහැ. ඉස්සර ගෙදර ඉන්න කොට අම්මා කියනවා පුතේ සීනි ටිකක් අරගෙන එන්න, හාල් ටිකක් අරගෙන එන්න කියලා අම්මා මල්ලක් දුන්නා. සමහර විට ඒක තාත්තා ඇඳපු කලිසමෙන් මහපු එක වෙන්න පුළුවන්. පරණ රෙද්දකින් මහපු එකක් වෙන්න පුළුවන්. එක්කෝ නැත්නම් පන් මල්ලක් වෙන්න පුළුවන්. මේක අරගෙන තමයි අපි මේ කාරණා වෙනුවෙන් යොමු වුණේ. අද එහෙම නොවෙයි. ගමේ ඉන්න අහිංසක - (බාධා කිරීම්) ඒ නිසා හුරු කරන්නට ඕනෑ. ඒ වාගේම ශිල්ප සභාවට කථා කරලා, දේශීය කර්මාන්තවලට කථා කරලා කාන්තාවෝ ගෙන එන අත්බෑග්, එහෙම නැත්නම් තමන් පාවිච්චි කරන බෑග් ඉතා නවීන ආකාරයට ගොනු කළා නම්, යම් යම් හුරු කිරීම් කරන්න පුළුවන්. ඒ නිසා මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. අපේ PHI ලා ඉන්නවා. මේ PHI ලා හරහා අපට පුළුවන් අවම කරන්න. බත් පැකට්වලින්, පොලිතීන් පැකට්වලින්, එහෙම නැත්නම් ඉටි කොළ පාවිච්චි කරන එක අඩු කරලා, ඒ අය දැනුවත් කිරීම් කරලා පොලිතීන් සම්බන්ධයෙන් තිබෙන කරුණු කාරණා පිළිබඳව ඒ අවබෝධය ඒ අයට ලබා දෙන්න පුළුවන්. ඒ නිසා අපි රටක් වශයෙන් ගන්න කොට විනාශය කරා ගිහිල්ලා, සතා සිව්පාවා පවා විනාශ වන තත්ත්වයක් මේ පොලිතීන් නිසා ඇති වෙලා තිබෙනවා.

ඒ නිසා අද මේවාට විසඳුම් සොයන්න අමාරුයි. මේවාට විසඳුම් සොයන්න ගියාම ගැටුම් බවට පත් වෙලා තිබෙනවා. රටේ නායකතුමා වශයෙන් එතුමා හොඳ තීන්දුවක් ගත්තා තමයි. නමුත් මේවා ක්‍රියාත්මක කරන්න බහුජාතික සමාගම් එක්ක ලෙහෙසි කාරණයක් වෙන්නේ නැහැ. ඒ නිසා සමාජය දිහා බලනකොට මිනිස්සුන්ට ඇස් පෙනීමේ රෝග තත්ත්වය වැඩි වෙලා තිබෙනවා. ඇස්වල ලප, ඇස්වල සුද ඇති වීම, පිළිකා තත්ත්වයන්, හමේ රෝග මේ සියල්ලටම පොලිතීන් හේතු වෙනවා. පොලිතීන් පිළිස්සීම නිසා ඇති වෙන්නා වූ පාරිසරික ප්‍රශ්න නිසා ඕසෝන් ස්ථරය තුනී වීම තුළින් අපට නොගැළපෙන කිරණ වර්ග හිරු හරහා

ඇවිල්ලා මිනිසුන්ගේ සම මතු පිට ඇති වෙන්නා වූ රෝගී තත්ත්වයන් ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා අපට නොපෙනෙන මහ බලපෑමක් - ජේන්නේ කුණු කන්ද

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]

තමයි. නමුත් නොපෙනෙන මහ බලපෑමක් මේ සමස්ත පරිසරයටම සිදු වෙනවා. ඒ නිසා අපි හැම කෙනාගේම වගකීමක් තමයි මේ සමාජයට ඒ පොලිතීන් සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන ප්‍රශ්නය. අපේ ගෘහය තුළින්, අපේ කුටුම්බය තුළින් ආරම්භ කරන්නට ඕනෑ. දරුවා හුරු කරන්නට ඕනෑ. අනාගතය වෙනුවෙන් මේවායෙන් මිදිලා මුතු ඇටයක් වාගේ තිබෙන සුන්දර වූ ශ්‍රී ලංකාව අනාගතය වෙනුවෙන් ආරක්ෂා කරන්න ඔබ අප හැම කෙනාටම වගකීමක් තිබෙනවා කියන එක මතක් කරමින්, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ගෞරවය පුද කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.07]

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ඉතාමත්ම කාලෝචිත ඒ වාගේම අපි කැමැති වුණත්, අකැමැති වුණත් අපි ප්‍රවිෂ්ට විය යුතු අනිවාර්ය කාරණයකට මේ සභාව තුළ යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. ඉතාමත් හොඳ යෝජනාවක් කියලා ප්‍රථමයෙන්ම සඳහන් කරනවා. මේ කසළ අපහරණය, එහෙම නැත්නම් කසළ කළමනාකරණය සම්බන්ධව කථා කරද්දී, එහි ප්‍රධාන මූලධර්මයක් තමයි ප්‍රතිචක්‍රීකරණය. මේ ප්‍රතිචක්‍රීකරණය කියන එකත් අපට ප්‍රධාන කාරණා දෙකකට බෙදා ගන්න පුළුවන්. එක පැත්තකින් තමන් භාවිතා කරපු භාණ්ඩය ඒ විධියටම නැවත භාවිතා කිරීම. කෑම පෙට්ටිය වෙන්න පුළුවන්, එහෙම නැත්නම් අපි පාවිච්චි කරන මල්ල වෙන්න පුළුවන්, නැවත නැවතත් ඒ මල්ල පාවිච්චි කිරීම, කෑම පෙට්ටිය පාවිච්චි කිරීම එක අංශයක්. ඒක අපේ ඉතිහාසයේ අපට අලුතෙන් උගන්වන්න ඕනෑ දෙයක් නොවෙයි. අපේ පැරැණ්නන් තුළම මේ ගුණය තිබුණා. පාවිච්චි කරලා විසි කරන ගුණය නොවෙයි. අපි පාවිච්චි කරපු භාණ්ඩයක්, ඒ පාවිච්චි කරපු විධියටම නැවත නැවතත් සමහර විට ප්‍රතිසංස්කරණය කරමින් වෙන්න පුළුවන්. ඒක පාවිච්චි කිරීම. පන් මල්ල වෙන්න පුළුවන්. රෙදි මල්ල වෙන්න පුළුවන්. එක දවසක් අපි කඩයට අරගෙන ගිහිල්ලා, නැවත නැවතත් එය කඩයට අරගෙන යෑම. ඒක දහ ගමනද, සිය ගමනද කියලා තීරණය කරන්නේ ඒ භාණ්ඩයේ තිබෙන කල් පැවැත්මත් එක්ක. මේ විධියට භාණ්ඩ නිෂ්පාදනය කරපු රටක් අපේ රට. හැබැයි මීට වෙනස් ක්‍රමයකට භාණ්ඩ නිෂ්පාදනය කරපු රටවල් තිබෙනවා. ලාභයේ පැවැත්ම වෙනුවෙන්, අර මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව තුළම සඳහන් වෙලා තිබෙනවා 1977 විවෘත ආර්ථිකයට ප්‍රවිශ්ට වීමත් සමගම භාණ්ඩ නිෂ්පාදනය කළේ, ඒ භාණ්ඩය කෙටි කාලයකින් පාවිච්චි කරලා ඉවර කරන්න. ඒ විපත්තියේ ආදීනව අද අපි භුක්ති විඳිනවා. ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ එක මූලධර්මයක් තමයි ඒක.

ඊළඟ මූලධර්මය තමයි අපි පාවිච්චි කරන භාණ්ඩයක තිබෙන මූලද්‍රව්‍ය ටික නැවත ඒ තත්ත්වයට පත් කරගෙන නැවත ඒ භාණ්ඩ නිෂ්පාදනය කිරීම. ඒ අවස්ථාවේදී භාණ්ඩය සම්බන්ධයෙන් තිබෙන ගැටළුවක් තමයි බලශක්තිය, ඒ වාගේම මූලද්‍රව්‍යවලින් නිකුත් වන කිරණ වර්ග, ඒ වාගේම වෙනත් රසායනික ද්‍රව්‍ය නිසා අපේ ජල ගෝලයටත්, වායු ගෝලයටත්, පාංශු ගෝලයටත් සිදු වන හානි. ඒක නිසා අපට පළමුවැනි අවස්ථාවට බැරි නම් තමයි ප්‍රතිචක්‍රීයකරණයේ දෙවන අවස්ථාවට ප්‍රවිශ්ට වෙන්නේ. ප්‍රතිචක්‍රීයකරණයේ දෙවැනි අවස්ථාවේදී, ඒ දෙවැනි අවස්ථාව අනුගමනය කරන්න මූලධර්ම තුනයි ලෝකයේ තිබෙන්නේ. එකක් තමයි

BIO DEGRABABLE SYSTEM එක. ජීව ජීර්ණ ක්‍රියාවලිය.

දෙවැනි එක තමයි CHEMICAL DEGRABABLE. රසායනික ජීර්ණ ක්‍රියාවලිය.

තුන්වැනි එක තමයි INCINERATOR SYSTEM එක.

යම් දෙයක් දවා අවසන් කිරීමේ ක්‍රමවේදය. මේ ක්‍රමවේද තුනෙන් පළමුවැනි ක්‍රමවේදය විතරයි ලෝකයේ දැනට ඉතාමත් තිරසර ක්‍රමවේදයකට යන්න පුළුවන්කම තිබෙන්නේ. අපේ ලෝකයේ පවතින දේවල් ඊළඟ පරම්පරාවට උරුම කරන්න නම් ජීව ජීර්ණ ක්‍රියාවලියට ප්‍රවිශ්ට වෙන්න ඕනෑ. මම විශ්වාස කරනවා, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගෙනාපු යෝජනාව පළමුවැනි ගණයේ පිහිටා කරපු යෝජනාවක් විධියට. රජයක් විධියටත්, ජනතාවක් විධියටත් ජීව ජීර්ණ ක්‍රියාවලියට බාධා මොනවාද කියලා අපි හඳුන ගන්න ඕනෑ. ඒකට ප්‍රධාන

බාධාවක් තමයි, ජීර්ණයට බාධා කරන ද්‍රව්‍ය, ජීර්ණ ද්‍රව්‍යයත් සමග එකට සම්මිශ්‍රණය නොකිරීම. යම් කාබනික ද්‍රව්‍යයක් ජීර්ණයට බාධා කරන්නේ මොනවාද, ඒක බාධා කිරීම් ඉවත් කරන්න තිබෙන ක්‍රමවේදය තමයි ඒවා වෙන් කිරීම. ප්‍රතිචක්‍රීයකරණයේ දෙවැනි පියවරේ පළමුවැනි අංකය යටතේ අපි අවධානය යොමු කළ යුතුයි. යම් කාබනික ද්‍රව්‍යයක් ජීර්ණයට බාධා කරන්නේ මොනවාද? ඒ බාධාව මැඩ පවත්වා ගන්නේ කොහොමද කියන එක. එතැනදී පොලිතීන්, සෘජුෆෝම්, ඒ වාගේම ප්ලාස්ටික් වර්ග ඉතාමත් බරපතළ විධියට තට්ටු තට්ටුමය වශයෙන් ඔක්සිජන් ලබා දීම. ඒ වාගේම ක්ෂුද්‍ර ජීවී ක්‍රියාවලියට ඉතාමත්ම බරපතළ විධියට බාධා කරනවා, මේ ජීව ජීර්ණ ක්‍රියාවලිය. එහෙම නම් ජීව ජීර්ණ ක්‍රියාවලිය පස තුළ, ජෛව ගෝලය තුළ, ඒ වාගේම ජල ගෝලය තුළ, පාංශු ගෝලය තුළ නිවැරැදිව ක්‍රියාත්මක වෙන්න නම් අනිවාර්ය සාධකයක් තමයි ඒකට බලපෑම් කළ හැකි පොලිතීන්, ප්ලාස්ටික්, සෘජුෆෝම් ඒ වාගේම ජීර්ණ ක්‍රියාවලියට බාධා කරන ද්‍රව්‍ය ඉවත් කිරීම. මේක පමණක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඊළඟට ඒ හා සමානවම තිබෙනවා අපි භාවිතා කරන ද්‍රව්‍යවල තිබෙන රසායනික ද්‍රව්‍ය. මේ රසායනික ද්‍රව්‍යයත් ජීව ජීර්ණ ක්‍රියාවලියට බලපෑම් කරනවා. විශේෂයෙන්ම බැටරිවල අන්තර්ගත රසායනික ද්‍රව්‍ය, ඒ වාගේම කර්මාන්ත ශාලාවල අපද්‍රව්‍ය, ඒ වාගේම අනෙක් පැත්තෙන් ගත්තොත් නිවස තුළ අපි පාවිච්චි කරන විවිධ රසායනික ද්‍රව්‍ය. අපි එකට සම්මිශ්‍රණය කළොත්, ජීව ජීර්ණ ක්‍රියාවලියට බාධා කිරීම් කරනවා.

තුන්වැනි ක්‍රියාවලිය විධියට අපට ගන්න පුළුවන් මේ සියලු කාරණා එකට මිශ්‍ර වුණත්, මිශ්‍ර නොකළ යුතු කාරණයක් තිබෙනවා. ඒ තමයි සායනික අපද්‍රව්‍ය. මේ සායනකි අපද්‍රව්‍ය මිශ්‍ර වුණාට පස්සෙත් සමහර වෙලාවට ඒවායේ ඖෂධ වර්ග තිබෙන්න පුළුවන්. ඒ ඖෂධවල ඇන්ටිබයොටික් වර්ග තිබෙන්න පුළුවන්. ඒ නිසාම ජීව ජීර්ණ ක්‍රියාවලියට බාධා කරනවා. රෝගයක් වැළඳුණු කෙනෙකුගේ තිබෙන ක්ෂුද්‍ර ජීවී ක්‍රියාවලිය යහපත් ක්ෂුද්‍ර ජීවී ක්‍රියාවලියට BENIFECIAL MICROS ලාට බාධා කරන්න පුළුවන්. ඒක නිසා අපි අනිවාර්යයෙන්ම පරිස්සම් වෙන්න ඕනෑ. සායනික අපද්‍රව්‍ය. මම මේ පැහැදිලි කරලා දුන්නේ, ජීවී ජීර්ණ ක්‍රියාවලියට බාධා වන ද්‍රව්‍ය වෙනම පරිහරණය කරන්නේ කොහොමද? වෙනම සංරක්ෂණය කරන්නේ කොහොමද? වෙනම පවත්වාගෙන යන්නේ කොහොමද කියන කාරණයයි. එතැනදී ඉතාම වැදගත් මේ කාරණා ටික වෙන වෙනම ජනතාව දැනුවත් වෙන්න ඕනෑ. මේ කාරණා ටික අනුව රජයේ වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. වෙන් කරන ලද ප්‍රතිචක්‍රීයකරණ ද්‍රව්‍ය එක් තැනකට ගෙන එනවා නම් ඒ ද්‍රව්‍ය වෙන් වෙන්ව ගෙන්න ගන්නේ කොහොමද කියලා.

දැනටමත් යම් යම් තැන්වල, ආයතන මට්ටමෙන් විවිධ ක්‍රම අනුගමනය කරලා තිබෙනවා. හැබැයි, ඒක අපේ හොඳම ක්‍රමය විධියට, රටක් විධියට ආකල්පමය වශයෙන් අනුමත කරන්න බැරි තැන් තිබෙනවා. එහෙම වෙනෙනම ළදරු පාසලේ ඉඳන් මේ ආකල්පමය තත්ත්වය ගෙඩ නඟලා නැහැ. තවම ළදරු පාසල තුළ දරුවා හැඩ ගස්වන්න අපි සමත් වෙලා නැහැ. දරුවා ළදරු පාසලට දැම්මාට පස්සේ දෙමව්පියෝ බලාපොරොත්තු වෙන්නේ අවසානයේ පවත්වන CONCERT එකට දරුවා වෙනුවෙන් කොපමණ වියදම් කරලා අත්පොඩි ගහලා වේදිකාවෙන් බස්සන්න පුළුවන්ද කියන කාරණයට විතරයි. ගහ කොළ, සතා සිව්පාවා, ඇළ දොළ, ඒ වාගේම පරිසරය සමාජයත් එක්ක දරුවාගේ මොළේ තිබෙන ගැග්ලියම් සෛල කොතරම් හොඳට වර්ධනය කරලා සූදානම් කරලා තිබෙනවාද ඒ ළදරු පාසල තුළ. පූර්ව ළමාවිය සංවර්ධනයේදී අංක එකේ කාරණයක් තමයි මේක. ඒක නිසා බරපතළ විධියට දියුණු රටවල්වල ළදරු පාසල භාවිතා කරනවා මේ කාරණය සාක්ෂාත් කරගන්න. ඒක නිසා ජපානය වාගේ රටක ළදරු පාසලේ ගුරුතුමිය හෝ ගුරුතුමා වැඩ තහනමට ලක් වන වාර අනන්තයි. අනෙක් කිසිම ගුරුවරයෙක් වැඩ තහනමට ලක් වෙන්නේ නැහැ. හැබැයි, ඒ අය දන්නවා. අනාගත ජපනා නිර්මාණය කරන්න නම්, ඒ ජපනා නිර්මාණය කරන්න මූලික කාලය තමයි අවුරුදු 01 සිට අවුරුදු 04 දක්වා වූ ඒ දරුවාගේ මානසික වර්ධනය උච්චතම අවස්ථාවට පත් වන අවුරුදු 04 දී ඒ දරුවා නිර්මාණය කර ගැනීම වෙනුවෙන් කටයුතු කිරීම අත්‍යවශ්‍ය බව.

ඒ වාගේම ඇමරිකාවත් එහෙමයි. අනාගත ඇමරිකානුවන් නිර්මාණය කිරීම. ඒ වාගේම ජර්මානුවන් නිර්මාණය කිරීම. ප්‍රංශුවා නිර්මාණය කිරීමට ඒ රටවල් මැදිහත් වුණත් ශ්‍රී ලංකාව තුළ අනාගත ශ්‍රී ලාංකිකයන් නිර්මාණය කිරීම වෙනුවෙන් මේ කාර්යයට තවම අත ගහලා නැහැ. ඒක නිසා අනිවාර්යයෙන්ම කසළ ප්‍රතිචක්‍රීයකරණ ක්‍රියාවලිය සම්බන්ධව ප්‍රායෝගිකව දරුවාට හඳුනා ගැනීමේ අවදියේදී දරුවා මේ තත්ත්වයට යොමු කරන්න ඕනෑ. මෙය ප්‍රධාන

කාරණයක් විධියට තිබෙනවා. ඊළඟ කාරණය විධියට කසළ වෙන් කිරීම සම්බන්ධව ප්‍රායෝගික වැඩ පිළිවෙළක් අවශ්‍යයි. ඒ වාගේම එතැනදී පොලිතීන් සම්බන්ධව ගත්තාට

[ගරු අසෝක සපුමල් රන්වල]

පස්සේ එහෙම නැත්නම් ප්ලාස්ටික්, සෘජුෆෝම් සම්බන්ධව ගත්තාට පස්සේ අපේ රටට අලුත් දේවල් නොවෙයි, මේ සම්බන්ධ විකල්ප. අපේ රටේ සුවිශේෂී ශාක වර්ග ගණනාවක් තිබෙනවා. ෂෙරිරෝස් ප්‍රමාණය වැඩියි. බටහිර ශීත රටවල මේ ෂෙරිරෝස් වැනි ශාක නැහැ. උදාහරණයක් විධියට කෙසෙල් ශාකය. පොල්. වැටකෙයියා, ඒ වාගේම පන් වර්ග, මාන. මේවා අධික ලෙස ෂෙරිරෝස් තිබෙන නිසාම විවිධ BIO DEGRABABLE භාණ්ඩ නිෂ්පාදනය කරන්න භාවිතා කරන්න පුළුවන්. විශේෂයෙන්ම පොල් ශාකයේ කොහු, ඒ වාගේම ඉරටු. පොල් කොළ. ඒක නිසා තමයි අපි කප්රුක කියලා කියන්නේ. අද වනකොට විදේශ රටවල්වල විශාල වශයෙන් ඉරටු පටවන්න, ඒ වාගේම කොහු පටවන්න ක්‍රියාත්මක වෙලා තිබෙනවා. හැබැයි මේ වනකොට කොහු කර්මාන්තය ආශ්‍රිතව, පොල් කර්මාන්තය ආශ්‍රිතව දැවැන්ත බිඳ වැටීමකට පත් වෙලා තිබෙනවා. ඒක නිසා තමයි පොල් පිටරටින් ගෙන එන තත්ත්වයට ඇඳ වැටිලා තිබෙන්නේ. ඒක නිසා පොල් ශාකය අපි ආරක්ෂා කර ගත්තොත්, තව තවත් පොල් ශාකය සංවර්ධනය කළොත් ඒ පොල් ශාකයක් විධියට පොල් ගෙඩිය පමණක් නොවෙයි, කොහු, ඉරට ටික, ඒ වාගේම පොල් කොළේ ඉතාම වැදගත් වෙනවා මේ නිෂ්පාදනයන් බිහි කර ගැනීම සඳහා. ඒ වාගේම වැටකෙයියා ශාකයේ පත්‍ර, ඒ වාගේම පන් ශාකයේ පත්‍ර මෙන්න මේවා ප්‍රචලිත කිරීමේ වැඩ පිළිවෙළක් අත්‍යවශයයි. එකපැත්තකින් අපට පොලිතීන් නවත්වනකොට ඒ වාගේම ලන්ච් බොක්ස් එක, ලන්ච් ෂීට් එක නවත්වනකොට, ප්ලාස්ටික් බෝතල නවත්වනකොට අනෙක් පැත්තෙන් අපි මේ විකල්ප සංවර්ධනය කරන්න ගත්තු ක්‍රියා මාර්ග මොනවාද? පොල් ශාකයේ අතුරු ද්‍රව්‍යයන් ප්‍රවර්ධනය කිරීම සඳහා කර්මාන්තයක් විධියට ඒක සංවර්ධනය කරන්න රජයක් විධියට දීලා තිබෙන සහනාධාර මොනවාද? ඒ සම්බන්ධයෙන් මැදිහත්වීම් මොනවාද? ඒ වාගේම අනෙක් පැත්තෙන් කෙසෙල් ශාකයේ කඳන් ටික ප්‍රවාහනය කරගෙන පුංචි ක්‍රමවේදයක් අනුගමනය කරලා එහි තිබෙන ෂෙලිලෝස් ටිකත්, එහි තිබෙන දියරයත් වෙන් කර ගැනීමට යන්ත්‍ර සූත්‍ර තිබෙනවා. ඉතාම අඩු ගණනකින් මේවා නිර්මාණය කරන්න පුළුවන්. ඒ සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයත් උදව් කරගෙන රට තුළ අහක යන කෙසෙල් කඳන් ටික එක තැනකට ගෙනැල්ලා ඒකෙන් අදාළ භාණ්ඩ නිෂ්පාදනය කරන්නත්, ඒකෙන් ද්‍රවයන් නිෂ්පාදනය කරන්නත් ඒ සඳහා මැදිහත් වීමට අදාළ ප්‍රවර්ධන කටයුතු සිද්ධ වෙලා නැහැ. ඒ වාගේම වැටකෙයියා, අනෙක් පන් වර්ග ප්‍රචලිත කරන්න, කුඹුරු ලියැදි අස්වද්දන්නේ නැති තැන්වල පන් ශාකය අස්වද්දන්න ප්‍රචලිත වෙලා නැහැ. ප්‍රවර්ධනය කරලා නැහැ. ඒක නිසා අනෙක් පැත්තෙන් විකල්පයන් සංවර්ධනය කිරීම සඳහා තිබෙන මංමාවත් විවර කරන්න පළාත් සභාව විධියට රජයේ මැදිහත් වීම ඉල්ලා සිටිනවා. මේ යෝජනාවට එකඟ වෙමින්, ඒ වාගේම 2017.09.01 වැනිදා ඒ විශේෂ ගැසට් එක, ලාංකීය භූමියේ අනාගතයේ මේ තිබෙන ගැටළුවට විසඳුමක් සොයන්න බලාපොරොත්තු වන ගැසට් එක ක්‍රියාත්මක වෙද්දී ඒ සම්බන්ධව ආයෝජනය කරලා තිබුණු ව්‍යාපාරිකයින්ට තමන්ගේ ආයෝජන අහිමි වීම නිසා යම් දුෂ්කරතාවයකට මුහුණ දුන්නා නම් ඔවුන් කැඳවාගෙන, ඔවුන් සමග සාකච්ඡා කරලා, ඔවුන්ට විකල්පයක් යෝජනා කරන්න අවශ්‍යතාවය තිබෙනවා. අපි මෙතැනිදී බස්නාහිර පළාත් සභාව විධියට යෝජනා කරනවා. ඔවුන් මුහුණ දෙන අර්බුදයක් තිබෙනවා නම්, ඔවුන් ක්‍රමානුකූලව විකල්පයක් දක්වා යන්න අවශ්‍ය කරන සහන සපයන්න. ඔවුන්ව ස්ථාවර කරන්න.

ඒ වාගේම තව පැත්තකින් ඒ කර්මාන්තයන් අපට ලැබෙද්දීම, අර ඉතාමත් පැහැදිලිව පෙන්වා දුන්නා ලෝකයේ දියුණු රටවල්වල බඩ ඉරිඟු ශාකය, එහෙම නැත්නම් වී ශාකය තුළ තිබෙන ෂෙරිරෝස් ප්‍රමාණය වෙන් කරගෙන ඒකෙන් නිෂ්පාදයක් කරන්න. ඒ නිෂ්පාදනයන් කරද්දී දැන් අපි භාවිතා කරන භාණ්ඩවලට වඩා රුපියලක්, දෙකක්, තුනක් අතිරේක වැයක් දරන්න සිද්ධ වෙයි. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කළ ආකාරයටම අපි එකඟ වෙනවා අනාගත පරිසරය වෙනුවෙන් අපි සිද්ධ කරපු ඒ ආයෝජනය, යම් අයෝජනයක් බවට පත් වේවි කියලා. හැබැයි රජයක් විධියට එහෙම කියලා ඒ කාරණයෙන් වෙන් වෙන්න බැහැ. ජනතාව පත් වන අසීරුතාවයට යම් උත්තරයක් ඕනෑ. ඒ උත්තරයට යම් සහනයක් අවශ්‍යයි. ඒ නිෂ්පාදනයක් කරන්නේ කොහොමද? අතිරේක පිරිවැයක් දරන්න සිද්ධ වෙනවා නම් ඒ පිරිවැයට වෙන දෙයක් සම්බන්ධ කරලා ඒක ප්‍රචලිත කරන්නේ කොහොමද කියන

කාරණය අත්හදා බැලීමක්, Excies එකක් තිබෙනවා. ඒක කරන්න විවිධ සංවිධාන සූදානම් වෙලා ඉන්නවා. බඩ ඉරිඟුවල පොත්ත අරගෙන ඒ පොත්තෙන් ෂෙරිරෝස් නිර්මාණය කරන්න. විශේෂයෙන්ම ශාක වර්ග ගණනාවක පොත්ත තුළ තිබෙන ෂෙරිරෝස් වෙන් කර ගන්න ක්‍රමවේදය - මේකට පරීක්ෂණ කරන්න පරීක්ෂණ ආයතන ගණනාවක් ස්වෙච්ඡාවෙන් මේ සම්බන්ධව මැදිහත් වෙලා තිබෙනවා. ඒ ආයතනවලට දිරිගන්වන්න මොනවාද අපි කරලා තිබෙන්නේ? ඒ සම්බන්ධව පසු විපරම් කරලා තිබෙනවාද? තිරසාර සංවර්ධන අමාත්‍යාංශය විසින් වෙන් කරන ලද මුදල් ප්‍රමාණය එවැනි පරීක්ෂණ ආයතනවලට වෙන් කරලා තිබෙනවාද? ඒක නිසා අපි හුදු ප්‍රතිචක්‍රීයකරණ ක්‍රියාවලියකට පමණක් ලඝු කරලා මෙවැනි ගැසට් නිවේදන ක්‍රියාත්මක කිරීමෙන් පමණක් බලාපොරොත්තු වන ඉලක්කයන් සාක්ෂාත් කරගන්න බැහැ, ඒ සම්බන්ධව අපි සමස්ත වැඩ පිළිවෙළක් සැකසීම තුළින් මිසක්. ඒක නිසා එම වැඩ පිළිවෙළ සැකසීමට මධ්‍යම පරිසර අධිකාරිය ප්‍රමාණවත්ද? තිරසාර සංවර්ධන අමාත්‍යාංශයක් ගොඩ නැඟුවා. මේ ගොඩ නඟපු අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය සහ ව්‍යූහය කවරේද? ඒ සම්බන්ධව බඳවා ගැනීම් මොනවාද? ඒ සම්බන්ධව මැදිහත් වන අනෙක් ආයතන ටික කාබණික කෘෂිකර්මාන්තයේ ප්‍රතිපත්ති සම්පාදනය කරන වෙනම Control Unit එකක් හදලා තිබෙනවා. ලංකාවේ සභාපතිවරයෙක් පත් කරලා තිබෙනවා. තවම කාර්ය මණ්ඩලයක් නැහැ. ඔවුන්ට ඒ සම්බන්ධයෙන් තිබෙන අවදිය, ඒ සම්බන්ධව අයවැයෙන් වෙන් කරන මුදල් ප්‍රමාණය, ඒ සම්බන්ධව නිශ්චිත අදහසක් නැහැ. ආයතන තිබුණු පමණින්ම, ඒවායේ සභාපතිවරු පත් කරපු පමණින්ම මේ දේවල් සාක්ෂාත් කර ගන්න බැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒක නිසා අපි නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට ඉතාමත් ඉහළින් අපේ ප්‍රසංශාව යොමු කරවමින්ම මේ අඩුපාඩුකම් ටික ක්ෂණිකව වෙනස් කිරීම සඳහා රජයට බලපෑම් කළ යුතුයි කියන එක බස්නාහිර පළාත් සභාව විධියට යෝජනා කරනවා. ඒක නිසා නැවත නැවතත් නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගෙනාපු යෝජනාවට ප්‍රසංශාව ඉදිරිපත් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.21]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව පිළිබඳව මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කරන කොට අපට දැක ගන්න පුළුවන් එය ඉතාම කාලෝචිත යෝජනාවක් බව. පළාත් පාලන ආයතන ප්‍රධානීන් වශයෙන් අපි කටයුතු කරද්දී මනා ලෙස කළමනාකරණය කරලා, අපේ පළාත් පාලන ආයතනය පිළිබඳව ඉතාමත් වෙන් වෙන් ආකාරයෙන් අවශ්‍ය කරන අපද්‍රව්‍ය පිළිවෙළට අරගෙන ක්‍රියාත්මක කළත්, මෙවන් යෝජනා හැමදාම සභාව තුළට ආවත් මම හිතන්නේ, රජයක් විධියට, නීතිය ක්‍රියාත්මක කරද්දී නීතියට අවශ්‍ය විධියට කටයුතු නොකිරීම පිළිබඳව අපි කනගාටුව පළ කරනවා. මම හිතන්නේ මේ වනකොට කසළ කළමනාකරණය පිළිබඳව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් පාලන ආයතන තුළින් ප්ලාස්ටික් වෙන් කරන්න, ඒවා වෙන් කරලා තිබුණාට පසුව ඒවා අරගෙන යන්න, එහෙම නැත්නම් පොලිතීන් වෙන් කරලා ඩම්ප් කරලා වෙනත් තැනකට අරගෙන යන්න අවශ්‍ය කරන Facilities පළාත් සභාව තුළින් ලබා දුන්නා. නමුත් මේ වනකොට ඒ දීපු පළාත් පාලන ආයතනවල අද වනකොට කිසි දෙයක් වෙන්නේ නැහැ. අද කසළ ගොඩ ගැහිල්ලා. උදාහරණයක් විධියට මම බේරුවල ප්‍රාදේශීය සභාවට අවශ්‍ය කරන සියලු දේවල් දුන්නත්, අලුත්ගම සංචාරක පුරයක් බවට පත් වෙලා තිබෙන ඒ ප්‍රදේශය තුළ අලුත්ගම පොළ ළඟ භූමියේ පොලිතීන් ගෙනැල්ලා දිනපතාම ගිනි තියලා මේ පරිසරය විනාශ කරනවා. මේවා අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රධානීන්ට කිව්වත් ශත පහකට ගණන් ගන්නේ නැහැ. පළාත් පාලන ආයතනවල ඉන්න PHI මහත්වරුන්ට කියලා අවශ්‍ය කරන කටයුත්ත නිර්මාණය කළත්, ඒ PHI මහත්වරු කියන දේ අදාළ නිලධාරීන් ගණන් ගන්නේ නැහැ. අද කොම්පෝස්ට් ආයතනය තුළ ඒ ගෙන එන කසළ ටික ගෙනැල්ලා හරියාකාරයෙන් ක්‍රියාත්මක කරන්න කටයුතු කළත්, අද ඒවා ඉටු නොකිරීම තුළින් මෙන්න මේ විනාශයට අද පත් වෙලා තිබෙනවා.

මෙතුමා කථා කළා වාගේ වෙනදා අපි පොළට ගිහිල්ලා එළවළු ටික ගෙන ආවේ, පිළී වැස්සේ. අද ගෙන එන්නේ කොහොමද? එළවළු ජාති 10 ක් ගත්තොත් 10 ටම පොලිතීන් බෑග් 10 ක් දෙනවා. මේවා ගෙනැල්ලා ගෙදර ගොඩ කරලා, එහෙම නැත්නම් පැත්තකට දාලා තිබ්බාට පස්සේ අර කිව්වා වාගේ පරිසර හානි සිද්ධ වෙනවා.

ඒ නිසා මම හිතන්නේ මේවාට අවශ්‍ය කරන ශක්තිය නිර්මාණය කරන්න අපි කටයුතු කරද්දී, පළාත් පාලන ආයතනයක් තුළත් ක්‍රියාත්මක වෙන්න, මේවා පළාත්
[ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව]

පාලන ආයතනවලට ගෙනියන්න කවුරු හරි පළාත් සභාව තුළින් නම් කළා නම්, ඔවුන් මාසයකට සැරක් හරි ඇවිල්ලා ගෙනියන්න ඕනෑ. එහෙම නොගෙනීම තුළ තමයි අද ගොඩක් පරිසරය හානියට පත් වෙලා තිබෙන්නේ. ඊට අමරතව අද අපේ මතුගම ප්‍රදේශය තුළ ජපන් ජාතිකයොත් එක්ක එකතු වෙලා ලංකාවේ පුද්ගලයෙක් මුළු කළුතර දිස්ත්‍රික්කයටම විදුලිය දෙන්න පුළුවන් වැඩ සටහනක් නිර්මාණය කරගෙන යනවා. ඒක ජනාධිපතිතුමා දන්නවා. ඔබතුමන්ලාගේ පාඨලී චම්පික ඇමැතිතුමා දන්නවා. නමුත් මේ සියල්ල සාකච්ඡා කරලා අවසන් කරලා තිබ්බත්, අද අනුමැතිය දෙන්නේ නැහැ. හේතුව මොකක්ද? පළාත් පාලන ආයතනවල තිබෙන කුණු ටික ඔවුන්ට දෙන්නේ නැහැ.

අද මේ කළුතර දිස්ත්‍රික්කයේ තිබෙන කුණු ටික දෙනවා නම් අපට කළුතර දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, තවත් දිස්ත්‍රික්ක දෙකකින් විතර මේ කුණු අරගෙන මේ ව්‍යාපෘතිය ආරම්භ කරන්න පුළුවන්කම තිබෙනවා. මම දැන් ටිකකට කලින් ගරු ප්‍රධාන ඇමැතිතුමාත් එක්ක කථා කළා. ඒ අවශ්‍ය පුද්ගලයා ගෙනැල්ලා සාකච්ඡා කරලා මේක ඉක්මණින් ආරම්භ කරන්න කියලා. එහෙම ආරම්භ කළොත් තමයි මේ කටයුත්ත හරියට කරන්න පුළුවන් වෙන්නේ. උත්සාහ කළාට ඒ උත්සාහයේ ප්‍රතිඵලය ලබා ගන්න සමහර නිලධාරීන් හෝ දේශපාලන අධිකාරිය මේවා ක්‍රියාත්මක කරන්න දෙන්නේ නැහැ. ඇමරිකාවේ ඉන්න විදේශිකයන් ඇවිල්ලා දොඩංගොඩත්, බේරුවල නගර සභාවත් එකතු වෙලා මේ වාගේ ව්‍යාපෘති ආරම්භ කළා. නමුත් පවතින රජයන්වලින් මේවාට අනුමැතිය නොදී, විශාල ලෙස මුදල් ඉල්ලීම තුළින් ආපසු මේ කට්ටිය හැරිලා යනවා. අන්න ඒවා තමයි මේවාට තිබෙන බලපෑම්. ඒ නිසා මේ දේවල් හරියට කරන කවුරු හරි ඉන්නවා නම්, මේ ලංකාවට ආදරය කරන කවුරු හරි මේ කැළි කසළ ප්‍රශ්නය විසඳන්න කටයුතු කරනවා නම් ඔවුන්ට ඒ අවසරය දිය යුතුයි. එහෙම දුන්නොත් තමයි මම හිතන්නේ මේවා ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙන්නේ.

මම අද යෝජනාවක් ඉදිරිපත් කරමින් මෙතුමාගේ යෝජනාවටම සම්බන්ධ කරනවා. ජර්මන් ජාතිකයන් සමග එකතු වී මතුගම ඉදි කරන මෙම කර්මාන්ත ශාලාවලට විදුලිය ලබා දීලා ක්‍රියාත්මක කරන්න. අපද්‍රව්‍ය ඔක්කෝම එකතු කරලා මේ ටැංකියට දාලා තාපය නිෂ්පාදනය කිරීම තුළින් අපට විදුලිය ලබා දෙන වැඩ සටහන ක්‍රියාත්මක කරන්න. කළුතර දිස්ත්‍රික්කයේ තිබෙන සියලුම පළාත් පාලන ආයතනවල ගොඩ ගැහිලා තිබෙන කුණු ටික ඔක්කෝම ගෙනැල්ලා ඒ ආයතනයට ලබා දීලා කඩිනමින් මේක ආරම්භ කරන්න කටයුතු කරන්න. එතකොට මම හිතන්නේ මෙතුමාගේ යෝජනාවට අවශ්‍ය කරන - අපට එක දිස්ත්‍රික්කයක හරි මේ ප්‍රශ්නය විසඳගන්න පුළුවන් වනකොට ඉබේම මේ කටයුතු සාර්ථක වෙනවා. මම හිතන්නේ ඉදිරි කාලය තුළදී අනෙක් දිස්ත්‍රික්කවලටත් මේ වැඩ පිළිවෙළ දියත් වෙනවා. ඒක අතිගරු ජනාධිපතිතුමා දැනගන්න ඕනෑ. මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න. හැබැයි නීතිය එක දවසින් ක්‍රියාත්මක කරන්න කියලා, පොලිතීන් අයින් කරන්න කියලා කවුරු කිව්වත් ඒක එක පාරට කරන්න බැහැ. ඒකට අවශ්‍ය කරන යම්කිසි විසඳුමක් ඔවුන්ට ලබා දුන්නොත් සිද්ධ වේවි. එහෙම නොදුන්නොත් තමයි අපේ මිනිස්සු ඒ දේවල් ක්‍රියාත්මක නොකරන්නේ.

මම හිතන්නේ පොලිතීන් විතරක් නොවෙයි. පොලිතීන්, ප්ලාස්ටික්, ඒ වාගේම මෙතැන තිබෙනවා රෙජිෆෝම් වාගේ සියලු දේවලවලින් පරිසරයට හානි වීම තුළින් අර කිව්වා වාගේ අපේ බව භෝගවලට පවා විශාල හානියක් සිද්ධ වෙනවා. ඒ නිසා මේ ගැන කථා කරන්න තිබෙනවා නම් මම හිතන්නේ, අවුරුදු ගණන් කථා කරන්න පුළුවන්. හැමදාම මේ පළාත් සභාව තුළ නොයෙකුත් වැඩ සටහන් නිර්මාණය කරන්න යෝජනා ඉදිරිපත් කළත්, මේ යෝජනාව මෙතැනට සීමා කරලා පැත්තකට දාලා අවසානයේ වෙන්නේ තවත් මාස 06 කින් තවත් යෝජනාවක් ගෙනැල්ලා කථා කරන එක තමයි. ඒ නිසා මෙතුමාගේ යෝජනාවට අවශ්‍ය කරන ශක්තිය මන්ත්‍රීවරු හැටියට අපි උපරිමයෙන් ලබා දෙනවා. ඒ හා සමානව අපි මේවාට අදහස් ප්‍රකාශ කරලා මේවා ක්‍රියාත්මක කරන්න තිබෙන අවශ්‍යතාවය අනුව කටයුතු කරන්න ඔබතුමාගේ මාර්ගයෙන් අතිගරු ජනාධිපතිතුමා ප්‍රධාන ඇමැතිතුමාට

ඉදිරිපත් කරලා ඒවාට අවසරය ලබා දීලා මේ වැඩ පිළිවෙළ ශක්තිමත් කරන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

[පූ.භා. 11.27]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද 2018 වර්ෂයේ සභාවේ කටයුතු කරගෙන යන අතරතුර පරිසරය සම්බන්ධ වැදගත් යෝජනාවකට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංග ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන මේ යෝජනාවේදී ප්‍රායෝගිකත්වය පිළිබඳ ගැටළු රාශියකට අද ජන සමාජය මුහුණ දීලා ඉන්නවා කියන එක මම අවධානයට යොමු කරන්න කැමැතියි. ගැසට් එකක් හෝ යම්කිසි චක්‍රලේඛයක් හෝ නිකුත් කිරීම අපට විනාඩි 10 ක් 15 ක් වාගේ කාලයක් ඇතුළත කරන්න පුළුවන් වුණත්, ප්‍රායෝගිකව මේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේදී විශාල අපහසුතාවයකට අද මහජනතාව මුහුණ දීලා තිබෙනවා. ඉතින් මෙහිදී අපි සාකච්ඡා කළ යුතු කරුණ වන්නේ, මේ දෙක අතර සමතුලිතතාවයක් පවත්වාගෙන යෑම. නීතිය වාගේම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව ක්‍රමවේදයක් සකස් කිරීම, මහජන උනන්දුවත්, මන්ත්‍රීතුමන්ලාගේ උනන්දුවත්, පරිසරවේදීන්ගේ උනන්දුවත් ඇති කර ගැනීම අවශ්‍ය වෙනවා. ඇත්ත වශයෙන්ම මෙය ආපස්සට හැර නොවිය යුතු කාරණාවක් කියන එක අපි හැම දෙනාම පිළිගන්නවා. නමුත් අපි දන්න ආකාරයට කසළ කළමනාකරණය සම්බන්ධයෙන් ලංකාවේ ආදායමෙන් බරපතළ කොටසක් වැය කරලා විවිධ සංචාර කරලා ඇති. විවිධ වැඩ සටහන් පවත්වලා ඇති. නමුත් ප්‍රශ්නය එතැනමයි. උදාහරණයක් හැටියට කිව්වොත් අද පාරවල් අයිනේ කුණු දාන්න එපා කියලා සභාවලින් බෝඩ් ගහනවා. දැනුම් දෙනවා. ජනමාධ්‍යයෙන් දැනුම් දෙනවා. අද මේ පළාත් සභාවෙන් එළියට බැහැලා ගියොත් පාර අයිනේ ප්ලාස්ටික් බෝතල් තිබෙනවා. එහෙම නැත්නම් කෑම කාපු කොළ. දැනුත් පාර අයිනේ අපට දැක ගන්න තිබෙනවා. අතිභයානක විධියට ඩෙංගු වසංගතය ව්‍යාප්ත වෙන්නත් මේ ප්ලාස්ටික් අපද්‍රව්‍ය හේතුවක් වුණා. වතුර රැඳී තිබෙන ස්ථාන නිසා. විශාල වශයෙන් ජන ජීවිත මේ රටට අහිමි වුණා.

මේ තත්ත්වය යටතේ අපි ඊළඟට ක්‍රියාත්මක කරන්න සූදානම් වෙනවා නම් මෙහිදී මම හිතන්නේ පළමුවෙන්ම මහජන ආයතනවලින්ම ආරම්භ කරන්න ඕනෑ. විශේෂයෙන්ම පළාත් සභාව, පාර්ලිමේන්තුව, පාසල්, එතකොට ප්‍රාදේශී ලේකම් කාර්යාල, ප්‍රාදේශීය සභා යන මේ තැන්වල තමුන් වතුර බෝතලය බීලා හිස් බෝතලය දාන්න එකක් තිබෙනවා. ඒකේ කඩදාසිත් එක්ක දානවා. එහෙම නැත්නම් වෙනත් අපද්‍රව්‍යයත් එක්ක ඒවත් දානවා. එහෙම නැතිව නොදිරන අපද්‍රව්‍ය ටික ඒ අවස්ථාවේදීම වෙන් කරලා දාන්න යම්කිසි ක්‍රමවේදයක්, මහජනයාට මේක බලාගන්න හරි ඉස්සෙල්ලාම රාජ්‍ය ආයතනවල ඇති කරන්න ඕනෑ. දැන් එහෙම කරන්නේ නැතිව අපි මෙතැන මහපරිමාණ සාකච්ඡා තියලා, මහපරිමාණ විවාද තියලා ගෙදර ගියාම ඒක හරි විහිළුවක් වෙනවා. ඒක හරියට වෘක්ෂලතා ගැන, වනජීවීන් ආරක්ෂා කරන්න කථා කරලා හැන්දෑවේ පාටියට වල් ඌරු මස් දෙනවා වාගේ වැඩක්.

ඒ නිසා මම කියන්න කැමැතියි මේ කථිකාව ප්‍රායෝගික තත්ත්වයට පත් කිරීමට අපි හැම කෙනෙක්ම උනන්දු වෙන්න ඕනෑ. විශේෂයෙන්ම ගෙදර ගෘහණිය අතින් තමයි, ගම්මානයෙන් පටන් ගත්තොත් තමයි මේ පරිසරය ආරක්ෂා කර ගැනීම, නොදිරන අපද්‍රව්‍ය වෙන් කර ගැනීම කරන්න පුළුවන් වෙන්නේ. සමහර අවස්ථාවලදී අපි දැකලා තිබෙනවා, නවීන පන්නයේ පාරිභෝගික ද්‍රව්‍ය විකුණන ස්ථානවල සමහර දැන උගත් පුද්ගලයෝ මේ ගැන අවබෝධයක් අරගෙන එක බෑග් එකකට බඩු ටික දාගෙන යන්න පුළුවන් නම්, දෙකක් එපා එකක් ඇති කියලා කියනවත් මගේ කණට ඇහිලා තිබෙනවා. ඉතින් ඒ අවස්ථාවේදී අපට සතුටක් ඇති වෙනවා. එක පුද්ගලයෙක් හරි පටන් අරගෙන තිබෙනවා, එක බෑග් එකක් හරි වැඩිපුර ගෙන යන එක නවත්වන්න. ඉතින් මෙවැනි හැඟීමක් ඉස්සෙල්ලාම පාසල් සිසුන් අතර තමයි ඇති කරන්න ඕනෑ. අද පාසල පරිසර වැඩ සටහන් තිබෙනවා. ඒ වාගේම සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම අනුයුක්ත පරිසර නිලධාරියෙක් ඉන්නවා. නමුත් මේ අය වැටුපක් ගන්නවා. ගෙදර යනවා. තමන් ඉන්න ගම තුළ හරි මේ පරිසර හිතකාමී විධියට අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදයක් සකස් කර ගන්න ඔවුනුත් අසමත් වෙලා තිබෙනවා. මහ පරිමාණයෙන් මධ්‍යම පරිසර අධිකාරියක් තිබෙනවා. ලොකු ව්‍යාපෘතියක් අනුමත කරගන්න ගියාම කෝටි ගණනින් සල්ලි දීලා එය කොපමණ පරිසරයට

අහිතකර වුණත්, අනුමත කර ගන්නවා. හැබැයි, ඒකට ජනතා විරෝධයක් වුණාම පරිසරයට හානිකරයි කියලා නවත්වනවා. ඉතින් මේකේ තිබෙන වැරැද්ද මොකක්ද කියලා මේක අනුමත කරන්න කලින් කල්පනා කරන්නේ

[ගරු රෝස් ප්‍රනාන්දු]

නැහැ. සමහර ආයතන නිල තල අනුව පිහිටලා තියෙද්දී ඒ අය දන්නේ නැහැ ඒ අයගේ කාර්ය භාරය මොකක්ද කියලා. ඒ අය හිතන්නේ, අපි ඉගෙන ගත්තාම හොඳ රස්සාවල් ලැබුණා. කීයක් හරි හොයා ගන්න අවස්ථාවකුත් ලැබුණා කියලා ඒක ඒ විධියට පාවිච්චි කරනවා. ඒ නිසා මේ අය රට ජාතිය හෝ පරිසරය හෝ ජනතාව ගැන හිතලා වැඩ කරනවා නම් ඒක අපට ඉතාම වටිනවා. මේ මන්ත්‍රීවරයෙක් ජනතාව ගැන හිතලා මේ ගැන කථා කරනවා වාගේම, කැක්කුමකින් වැඩ කරනවා වාගේම රාජ්‍ය සේවකයින්, අපි මේවා නිරීක්ෂණය කන්න දාන පොලීසිය, එහෙම නැත්නම් සෞඛ්‍ය පරීක්ෂක මේ සියලු දෙනාම එක ස්ථානයකින් මාසයකට ගණනක් අරගෙන ගෙදර යන්නේ නැතුව සැබෑවටම පරිසර හිතකාමී ප්‍රශ්නය ගැන අවධානයක් යොමු කරනවා නම් මේක වඩාත් ප්‍රායෝගික බවට පත් වෙනවා.

ඒ නිසා මම මේ ජනාධිපතිතුමාගෙන්, අගමැතිතුමාගෙන්, අනෙකුත් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාගෙන් පවා පළාත් සභාවේ ඔබතුමන්ලා හරහා අවධානය යොමු කරනවා, නීති පැනවීම පමණක් ප්‍රමාණවත් වන්නේ නැහැයි කියලා. එය ක්‍රියාත්මක වීමේ ක්‍රමවේදය අපි පුංචි තැනින් පටන් ගන්න අවශ්‍යයි. ඉස්සෙල්ලාම රාජ්‍ය ආයතන ටික ආදර්ශයක් දුන්නොතින් මේ රාජ්‍ය ආයනවලට මිනිස්සු නිතරම එනවා. එතකොට මේක දකිනවා. දැක්කාම ටික කාලයකින් අපට කියන්න පුළුවනි ගෙවල්වලට අපි යම්කිසි ආකාරයකට - දැන් අපි මේ කථා කරන්නේ ප්ලාස්ටික්, පොලිතීන් ගැන විතරක් නොවෙයි. මේ විවෘත ආර්ථිකයෙන් මේක ආවා කියන එක වෙන්න පුළුවන්. නමුත් එදා විවෘත ආර්ථිකයේදී බලාපොරොත්තු වුණේ මොකක්ද? අඩු පිරිවැයකින් වැඩි වැඩක් කරගන්න ක්‍රමයක් තමයි ආර්ථික සංකල්පයක් හැටියට ක්‍රියාත්මක වුණේ. ඒ කියන්නේ, රුපියලයකින් ෂොපින් බෑග් එක අරගෙන බඩු ගොඩක් ගෙනියනවා. පම් මල්ලක්, රෙදි මල්ලක් ගන්න ගියාම රුපියල් පන්සියයක් යනවා. ඉතින් මේ ආර්ථිකයත් එක්ක තමයි මේ පරිසර සංසට්ටනය සිද්ධ වුණේ. ආර්ථිකයේ ලාභ ලබන්න යනකොට අපට එන හානිය වැඩි වෙනවා. ඒ නිසා මේ සඳහාත් කරන්න තිබෙන්නේ, ආර්ථිකයට ගැළපෙන ආකාරයට මෙය සකස් කරන්න සිද්ධ වෙනවා. සීනි කිලෝ එකක් ගන්න කඩේට යන මනුස්සයාට රුපියල් 500 කට බෑග් එකක් කඩෙන් ගන්න බැහැ. හැබැයි, එක පාරක් අරගෙන ගිහිල්ලා සමහර විට හදිසියේ අමතක වුණොත් ආපහු බස් එකේ ගිහිල්ලා බෑග් එක අරගෙන එන්නත් බැහැ. ෂොපින් බෑග් එකේ තමයි දාගෙන යන්නේ. ඉතින් මේ ප්‍රායෝගිකත්වය තේරුම් අරගෙන තමයි මේ සියලු නිර්මාණ කරන්න සිද්ධ වෙන්නේ.

ඒ වාගේම අද ගෘහණිය ගෙදර පාවිච්චි කරන සීනි පැකට් එක කඩලා දාන උරේ, පිටි පැකට් එක කඩලා දාන උරේ හැමදාම ගෙදර ඉතුරු වෙනවා. ඉතින් මේක නගර සභාවවත්, ප්‍රාදේශීය සභාවවත් හරියට ගෙනියන්නේ නැහැ. ඊට පස්සේ ගෙදර ගොඩ ගැහෙන කොට මොකද කරන්නේ? හොඳට තව උරයක ගැටගහලා මහත්තයාට දෙනවා වැඩට යන ගමන් විසි කරගෙන යන්න කියලා. අද ඒක සමාජය පුරාම ප්‍රචලිතයි. දැන් මෙතැන වැඩට ඇවිල්ලා බලාගෙන ඉන්න රාජ්‍ය නිලධාරීන් වුණත් බලනවා ඇති ඒ අය ගෙදර යන්නේ රෑ 8.00 ට විතර. උදේ පාන්දරින් එනවා. ගෙවල් අස් කරන්න වෙලාවක් නැහැ. ලෙහෙසිම දේ තමයි බෑග් එකේ දාගෙන ආවා. විසි කරගෙන ගියා. ඇළ දොළ පාර අයිනේ කොහේ හරි තැනකට තමයි දාන්නේ. ඉතින් මේක පොලීසියට අල්ලන්නත් බැහැ. සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ට අල්ලන්නත් බැහැ. මෙවැනි සිද්ධියක් අපේ ගම්මානයේ සිද්ධ වුණා. එක තැනක කුණු විසි කරගෙන යනවා. අපට අල්ලගන්න බැරි තැන එක දවසක් ඒ තැන සුද්ධ කරලා තිබ්බා. කුණු උරයක් විසි කරලා තියෙද්දී, අපි ඒක අරගෙන එකින් එක බැලුවා. ඒකේ ටෙලිකොම් බිල් තිබෙනවා. එහෙම නැත්නම් ගෙදරට ආපු විදුලි බිල්. එහෙම බලලා අපි Address එක හොයා ගත්තා. හොයාගෙන පොලීසියට දැනුම් දුන්නා මේ Address එකෙන් තමයි මේ කුණු මල්ල දාලා තියෙන්නේ කියලා. ඊට පස්සේ අපි ප්‍රසිද්ධ කරලා ඇරියා, අනන්‍යතාවය සොයා ගන්න දෙයක් කුණු මල්ලක තිබුණොතින්, අපි එයාලට විරුද්ධව නඩුවක් දානවා කියලා. පොලීසියට භාර දුන්නාට පස්සේ එතැන ඒ සිද්ධිය නතර වුණා. මම කියන්නේ මේකේ ප්‍රායෝගිකත්වය. අපට හැමදාම කුණු මළු ඇද ඇද ඉන්න බැහැ. සමහර වෙලාවට ඒවායේ තිබෙන අපද්‍රව්‍යයත් එක්ක අල්ලන්නත් බැහැ. නමුත් අපි සූක්ෂම ආකාරයෙන් ඒ කටයුත්ත කළා. ඒ කාලයේ ඩෙංගු වසංගතය තිබෙන

කොට. නමුත් මේක හැමදාම කරන්න පුළුවන් දෙයක් නොවෙයි. මනුස්සයා තුළ ආකල්පමය වෙනසක් එන්නට ඕනෑ. මේ කුණු ටික ලෙහෙසියට විසික් කරන්නේ නැතුව අපි රට ජාතිය වෙනුවෙන්, පරිසරය වෙනුවෙන් සහ අනාගත පරම්පරාව වෙනුවෙන් මේ දේ හරියට කරන්න ඕනෑය කියලා. ඒ නිසා මම මෙතුමාගේ යෝජනාවට එකඟ වන ගමන්ම මේක ප්‍රායෝගිකත්වයට පත් කරන්න නම් පාසල්වල මාසයක් හරි නොදිරන කුණු එක්කාසු කරලා, හරි දිනයක පළාත් පාලන ආයතනය ගෙනියන්න ඕනෑ. ගෙනිහිල්ලා ඒ අයත් එළිමහනේ ගොඩ ගහන්නේ නැතුව ප්‍රතිචක්‍රීයකරණ වැඩ සටහනකට සම්බන්ධ වෙන්න ඕනෑ. අඩු ගණනේ ප්ලාස්ටික් අපද්‍රව්‍ය ටොන් කීයක් එනවාද? මේ අලුත් අවුරුද්දේවත් ඒකට ක්‍රමවේදයක් නිල වශයෙන් සකස් කරන්න ඕනෑ.

ඊට අමතරව අපි දකිනවා ගෘහ භාණ්ඩ, කොම්පියුටර්, ටෙලිෆෝන් මේවා ඔක්කෝම එන්නේ නොදිරන සමහර ද්‍රව්‍යයත් එක්ක. මේ සිම් එක. පාවිච්චි කරලා විසි කරනවා නේ? පාරේ කොහේට හරි තමයි විසි කරන්නේ. ඉතින් මෙවැනි අපද්‍රව්‍යවලට ක්‍රමවේදයක් හදන්න ඕනෑ. මේ නිෂ්පාදන ආයතනයට ආපහු භාර දෙන්න හරි. එහෙම නැත්නම් එවැනි නිෂ්පාදන ආයතන මෙවැනි අපද්‍රව්‍ය භාර ගන්න ස්ථානයක් කොහේ හරි තියන්න ඕනෑ. ඒ අයගේ නිෂ්පාදන අංගනය අසලම මේ අපද්‍රව්‍ය භාර ගන්නවා. අපි හිතමු කෝ ප්ලාස්ටික් මේසයක් කැඩුනා නම් අපි භාර ගන්නවා. එතකොට කීයක් හරි දෙනවා. සමහර තැන්වල අපි දන්නවා තමන්ගේ වොෂින් මැෂින් එක දුන්නාම 20% ක වට්ටමක් එක්ක අලුත් එකක් ගන්න පුළුවන්. එතකොට ඒ භාණ්ඩය එතැනට අරගෙන එනවා. ඒ ක්‍රමවේදයත් දීර්ඝ කාලීන ප්ලාස්ටික් ද්‍රව්‍ය සම්බන්ධයෙන් පාවිච්චි කරන්න පුළුවන්. ඉතින් මෙවැනි සංකල්ප කථාවට විතරක් සංකල්පයක් විධියට තියා ගන්නේ නැතුව ප්‍රායෝගිකත්වයට නැඹුරු කිරීමෙන් තමයි මේ කටයුත්ත කරගෙන යන්න පුළුවන් වෙන්නේ. ඒ වාගේම මහජනතාව අපහසුතාවයට පත් නොවෙන්නත් ඕනෑ. නිකන් හරි අනුන් දාපු කුණු එකක් ළඟ හිටගෙන හිටියත් එයාව අල්ලගෙන ගිහිල්ලා පොලීසියෙන් නඩු දැම්මොත් මහජනතාව අපහසුතාවයට පත් වෙනවා. ඒ නිසා මෙහි නිවැරදි ක්‍රමවේදයට ගියේ නැත්නම් රජය කෙරෙහිත් එහෙම නැත්නම් මන්ත්‍රීවරු කෙරෙහිත් නීතිය ක්‍රියාත්මක කරන ආයතන කෙරෙහිත් වෛරයක් තමයි ජනතාවගේ ඇති වෙන්නේ. ඒ නිසා වැදගත් විධියට කටයුතු කරන ජනතාවත් අපහසුතාවයට පත් වන අවස්ථා තිබෙනවා. මේ සියල්ල සංකලනයක් කරගෙන හරි ක්‍රමවේදයකට යන්න. විශේෂයෙන් පළාත් පාලන ආයතනත්, අපිත් විශේෂ උත්සාහයක් ගත්තොත් මේක කරන්න බැරි වැඩක් නොවෙයි. ඒ නිසා මගේ යෝජනාව සම්බන්ධයෙන් අපේ එකඟත්වය ප්‍රකාශ කරන ගමන්ම සක්‍රීයව මේ සඳහා අපි දායක වෙමු කියන යෝජනාවත් කරමින්, මෙයට කැමැත්ත ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. ස්තූතියි.

[පූ.භා. 11.39]

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතාමත් සතුටු වෙනවා මට අවස්ථාව ලබා දීම ගැන. ඒ වාගේම අද කාලයට උචිත ඉතාම වටිනා යෝජනාවක් නිශාන්ත ශ්‍රී වර්ණසිංහල ගරු මන්ත්‍රීතුමා විසින් ගෙනැල්ලා තිබෙනවා. ඇත්තටම 2017 නොවැම්බර් මාසයේ අතිගරු ජනාධිපතිතුමා විසින් තහනමක් ගෙන ආවා ප්ලාස්ටික්වලට. ඊට පස්සේ එය සැප්තැම්බර් දක්වා දීර්ඝ කළා. ජනවාරි දක්වා දීර්ඝ කළා. නමුත් දැන් ජනවාරිවලින් පස්සේ මේක අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කරනවා කිව්වාට තවමත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. තවමත් පරණ ලන්ච් ෂීට් ටික, පරණ ප්ලාස්ටික් ටික ඒ විධියටම පාවිච්චි වෙනවා. හැබැයි අර වෙනදාට වැඩිය පුංචි අඩුවක් ඒකේ තිබෙනවා. අපට මිනිස්සුන්ව වෙනස් කරන්න නීතිවලින් විතරක් බැහැ. මිනිස්සුන්ව වෙනස් කරන්න ආකල්පයක් තිබෙන්න ඕනෑ. විශේෂයෙන්ම අපේ අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මෙතැන පටන් ගන්න ඕනෑ මොන්ටිසෝරියේ සිට. පරිසර හිතකාමී සමාජයට අහිතකර බලපෑම් කරන ශ්‍රී ලාංකිකයෙක් බිහි කරන්නේ කෙසේද? අද අපේ රටේ ඒක සිද්ධ වෙන්නේ නැහැ. අද අපේ මිනිස්සු ආත්මාර්ථකාමීත්වය තුළ ඉඳගෙන තමන් ගැන විතරයි සිතන්නේ. ගෙදර තිබෙන ප්ලාස්ටික් ටික ගෙනිහිල්ලා එළියට විසි කරනවා. කන ටොෆි කොළේ එළියට දානවා. මේකෙන් වන බලපෑම ගැන මිනිස්සුන්ට අවබෝධයක් නැහැ. මිනිස්සු හිතන්නේ මේ සියල්ල වුණාට පස්සේ අවසානයේ බලපෑම තමන්ට එන්නේ කියලා. මිනිස්සු දැනුවත් නොවුණු නිසා ගොඩක් වෙලාවට පරිසරයට අහිතකර බලපෑම් විශාල වශයෙන් සිද්ධ වෙනවා. ඉතින් ඒ නිසා අනිවාර්යයෙන්ම මිනිස්සුව දැනුවත් කිරීමේ වැඩ සටහනක් තිබිය යුතුයි. අනෙක් එක නීති ගෙන ආවාට

වැඩක් නැහැ. අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය කිව්වා වාගේ නීති ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ආයතනවල නායකයන්ට මේ ගැන දැනුවත්වීමක් තිබෙන්න ඕනෑ. ඉහළ සිට පහළටම ආදර්ශයක් දිය යුතුයි.

[ගරු නිරෝෂා අතුකෝරල]

ඉහළ සිට පහළටම ආදර්ශයක් දිය යුතුයි. සමහර ආයතනවලට අදටත් අපි ගියාම තේරෙනවා කිසිම කසළ කළමනාකරණයක් සිදු වෙනවා පේන්නට නැහැ. ඉතින් මේවා අනිවාර්යයෙන්ම එකින් එකට, එකින් එකට ගැට ගැහිලා තිබෙන දේවල් එකට එකතු විය යුතුයි. මේවා ගැන කළමනාකරණය උඩ ඉඳන් පල්ලෙහාට ආදර්ශයක් දිය යුතු වෙනවා. එම නිසා අපි සියලු දෙනාගේම වගකීමක් තිබෙනවා, මේවා ක්‍රියාවට නඟන්න. ඉතින් අපි යෝජනා ගේනවා. අදහස් ඉදිරිපත් කරනවා. ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. යෝජනාවන් විතරමයි. ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළක් ගැන කොහොමද ක්‍රියාත්මක වෙන්නේ කියලා අපි දන්නේ නැහැ. ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියන එක අද අපට තිබෙන ලොකුම ප්‍රශ්නයක් තමයි කසළ. ලෝකේ හැම රටකම කසළ ප්‍රශ්නයක් නොවෙයි. කසළ සම්පතක්, කසළ නිසා නිෂ්පාදන වැඩි වෙනවා.

අපට තිබෙන තවත් දෙයක් තමයි එකම දේ කිහිප වතාවක්ම භාවිතා කිරීම. හැබැයි අපි එකම දේ කිහිප වතාවක් භාවිතා කරන්නේ නැහැ. ලෙහෙසියට ලන්ච් ෂීට් එකේ බත් එක ඔතාගෙන යනවා. ඒක විසි කරනවා. හැබැයි අපි වීදුරු පෙට්ටියක් ගෙනිහින් ඒක නිතර නිතර පාවිච්චි කරන්නේ නැහැ. අද විවෘත ආර්ථිකය නිසා ලෝකයේ - සිංගප්පූරුව දියුණු වුණේ විවෘත ආර්ථිකයත් එක්ක. හැබැයි අපේ රටේ මිනිස්සු හැමදාම ගත්තේ නරක දේවල් විතරයි. විවෘත ආර්ථිකයේ නරක දේවල් විතරයි, අපි ගත්තේ. අපට අවශ්‍ය දේ නොවෙයි, අපි ගත්තේ. අපි රූපවාහිනිය බැලුවත් අපි ගන්නේ, නරක දේවල් මිසක හොඳ දේවල් නොවෙයි. අන්තර්ජාලයට ගියත්, ෆේස්බුක් එකට ගියත් අපි හැමදාම ගත්තේ නරක දේවල් පමණයි. හොඳ දේවල් ගත්තේ නැහැ. ලෝකයේ අනික් ගොඩාක් රටවල් මේ සෑම දේ තුළ, විවෘත ආර්ථිකය තුළ සහ Facebook, Internet හරහා, TV හරහා ගත්තේ හොඳ දේවල්. අපි හැමදාම නරක දේවල් තමයි ගත්තේ. අපි ප්‍රතික්ෂේප කරන හොඳ දේවල් ලෝකය වැළඳ ගන්නවා. අපි ලෝකය ප්‍රතික්ෂේප කරන නරක දේවල් වැළඳ ගන්නවා. අපි එහෙම ජාතිකයක්. නමුත් අපේ රටේ සිංහල මිනිස්සු මෙහෙම හිටපු ජාතියක් නොවෙයි. එදා කාලයේ අපි කෙහෙල් කොලයේ බත් එක ඔතලා, අපේ නිෂ්පාදන අපි ළඟ තිබ්බා. වැඩිහිටියන්ට මේ ගැන අවබෝධයක් තිබුණා. මේ දේවල් වැඩිහිටියන්ට විද්‍යානුකූලව, විද්‍යාත්මකව කියන්න බැරි වුණාට වැඩිහිටියන් දැනගත්තා, මේවාවල මොකක් හරි නරකක් තිබෙනවා කියලා. ඒ නරක අපලයක් හරි, නැත්නම් හොඳ නැහැ කියලා හරි, වෙන මොකක් හරි දෝෂයක් කියනවා, ඕක ඔහොම කරන්න එපාය කියලා. ඒගොල්ලන්ට ඒක විද්‍යාත්මකව කියන්න බැරි වුණාට. එතකොට අද ඒ දැනුම සම්පූර්ණයෙන්ම යට ගිහිල්ලා තිබෙනවා. නිර්මාණශීලී භාවය නැති වෙලා තිබෙනවා. මිනිස්සු ආත්මාර්ථකාමී වෙලා තිබෙනවා. මේක ආර්ථිකයේම විතරක් නොවෙයි. අද රුපියල් පන්දහසක් ගන්න මනුස්සයත් ජීවත් වෙනවා. රුපියල් පනස් දහසක් ගන්න මනුස්සයගේ ජීවන රටාවත් එකයි. රුපියල් ලක්ෂයක් ගන්න මනුස්සයාගේ ජීවිත රටාවත් එකයි. මිනිස්සුන්ගේ ආත්මාර්ථකාමී භාවය තුළ ඇති වුණු හානි තමයි විශාල වශයෙන්ම තිබෙන්නේ.

මිනිස්සුන්ට අනිත් මිනිස්සුන්ගේ ජීවිතත් එක්ක සහ රට, ජාතිය ගැන, පරිසරය ගැන හැඟීමක් නැති වෙලා. අනික මේ රටට ආදරය කරන ඕනෑ. මේ රට රැක ගන්නට ඕනෑ. පරිසරය රැක ගන්නට ඕනෑ. රටේ මිනිස්සුන්ට අලුත් ක්‍රම හඳුන්වා දෙන්නට ඕනෑ. ඇත්තටම දැන් පන් කර්මාන්තය ගත්තොත්, අපි පන් බෑග් එකක් රුපියල් 200/- කට ගත්තත් ඒක විසි පාරක් විතර පාවිච්චි කරන්න පුළුවන්. ප්ලාස්ටික් බෑග් එකට වැඩිය. එතකොට ඒකේ වටිනාකම අපට හඳුනා දෙන්න බැහැ. මිනිස්සුත් ක්ෂණිකව රුපියලයි ගත්තේ කියනවා. ඉස්සර අම්මා පොළට යනකොට ඉරටුවලින් වියපු මල්ලක් අරගෙන තමයි යන්නේ. දැන් කාලේ පොළට යන්නේ වෙන ගමනක් ගිහිල්ලා එන ගමන්. එක්කෝ පොළට යනවා කියලා ඔළුවේ තිබුණට වෙන දේවල් අදහස් වන්නේ, යන ගමන් බඩු ටික සිලි බෑග් එකින් ගේනවා. මම දන්නේ නැහැ මිනිස්සු ඔක්කෝටම නිකං මොකක්ද වෙලා වාගේ. දියුණු වෙන සමාජය තුළ, දියුණු වන ලෝකය තුළ වේගයෙන් දියුණුවට වැඩිය වේගයෙන් දුවනවා දෝ කියලා අපට හිතනවා.

ඒ එක්කම මේ බලපෑම් තමයි ඇත්තට දැන් සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ වාගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ

ඉන්න මේ පරිසර නිලධාරීන්ගෙන් මොකද්ද වන සේවය? පරිසර නිලධාරීන්ගෙන් සමාජයට සිද්ධ වෙන සේවය. අද කොට්ඨාශයක් තුළ සේවය කරන්න කීදෙනෙක් ඉන්නවාද? පරිසර නිලධාරි ඉන්නවා. ආර්ථික නිලධාරි ඉන්නවා. ග්‍රාම සේවක ඉන්නවා. සමෘද්ධි නිලධාරි ඉන්නවා. මේ ඉන්න අයගෙන් මේ සේවය හරියට සිද්ධ වෙනවාද? අද සෑම කෙනෙක්ම පුරුදු වෙලා තිබෙනවා දේශපාලඥයන්ට දොස් කියන්න. මේක දේශපාඥයන්ගේ වරදක් නොවෙයි. අපේම මේ පළාත් සභාවේ ඉන්නවා. මම හොඳටම දන්නවා අපේ අශෝක සපුමල් රන්වල මැතිතුමා ඉතාමත් වටිනා පුද්ගලයෙක්. එතුමා ළඟ ලොකු දැනුමක් තිබෙනවා. එතුමා විශාල ක්‍රියාවලියක් කරනවා. ඒවාගේම මේක ඇතුලේ තව ඉන්නවා. පරිසරයට ආදරය කරන, හොඳ දේවල් කරන, සමාජයට යම් හොඳ දෙයක් හඳුන්වා දෙන අය ඉන්නවා. නමුත් දේශපාලඥයන්ගෙන් නරක දේවල් කරන අය විතරයි කැපිලා පේන්නේ. ඒවා විතරයි ප්‍රචාරය වෙන්නේ. අමාත්‍යාංශවලත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලත්, සෑම තැනක රජයේ සේවකයන් අතරින්, රටට ආදරය කරන හොඳ පරිසරහිතකාමී මිනිස්සු ඉන්නවා. හැබැයි නරක පිරිසක් ඉන්නවා. මේ සියලු දෙනාගේ හොඳ අද යටපත් වෙලා තිබෙනවා. පිරිසක් ආත්මාර්ථකාමී වෙන කොට දෙන්නෙක් තුන්දෙනෙකුට මේ සියල්ල වෙනස් කරන්න ඉතාමත් අපහසුතාවයක් වෙලා තිබෙනවා.

මිනිසාව ගොඩනගන්න පුළුවන් මිනිසාටමයි. අපි පුරුදු වෙලා තිබෙන දේ තමයි අන් අයට ඇඟිල්ල දික් කරන්න. අපේ වගකීම අපි හරියටම සමාජ තුළ ඉෂ්ට කරනවා නම් මම හිතනවා මේ වන පරිසර හානි ඉතාමත් අඩු වෙයි කියලා. ඒවාගේම කවදා හරි මේ ලෝකේ තිබෙන සියලුම ගොඩනැගිලි කඩා වැටී දිරාපත් වුණත්, තව අවුරුදු දහස් ගණනකට අපි මේ ඉවත් කරන, පොළවට මුදා හරින පොලිතීන් ටික නම් දිරන්නේ නැහැ. ඒක පරිසරයට විශාල අහිතකරයි. සතා සිවුපාවා, වනාන්තර මේ ලෝකේ සියල්ලම නැති වීමටත් මේ අපි ඉවත් කරන පොලිතීන්වලින් පරිසරයට විශාල හානියක් සිදු වෙනවා. අතිගරු ජනාධිපතිතුමා ගෙනාපු යෝජනාව ක්‍රියාත්මක කරන්න, ක්‍රියාවට නගන්න අපි ඇතුලු සියලුම නිලධාරීන්ට වගකීමක් තිබෙනවා. ඒ වගකීම හරියටම ඉෂ්ට කරනවා නම් මම හිතනවා, ගොඩාක් දුරට අද මේ ප්‍රශ්න ඇති වෙන්නේ නැහැ. අපි සියලු දෙනාම එකතු වෙලා මේ යෝජනාව ගෙනාවා. අනාගත පරපුර වෙනුවෙන් ඉතාමත් වටිනා යෝජනාවක්.

අපි දන්නවා සමහර වෙලාවට කුණු ගෙනියන්න එන්නේ නැති වුණාම, අපේ කාන්තාවෝ ගෙදර තිබෙන ප්ලාස්ටික් ඔක්කෝම ගෙනත් පුච්චනවා. වායු ගෝලයට කොපමණ දුමක් පිට කරනවාද? ඒකින් මොන තරම් හානියක් වෙනවා ද කියලා ඒ කාන්තාවන් ඇත්තටම දන්නේ නැහැ. එම නිසා මේවාට ක්‍රියාමාර්ගයක් අනිවාර්යෙන් අරගන්න. මෙම යෝජනාව ඉතාම වටිනවා, මෙම යෝජනාව ඉතාම අගය කරනවා. මෙම යෝජනාව ක්‍රියාත්මක කරන්න සහයෝගය දෙන්න, ශක්තිය දෙන්න, පළාත් සභාව විධියට අපි ඔක්කෝමලාම ඒකට එකතු වෙලා එය ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[පූ.භා. 11.48]

**ගරු සමන්මලී සකලසූරිය**
Hon. Samanmalee Sakalasooriya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම යෝජනාවට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මේ වන කොට මෙම පළාත් සභාව නියෝජනය කරන, මෙම යෝජනා පිළිබඳ උවමනාවක්, කැමැත්තක් දක්වන පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන් අදහස් ප්‍රකාශ කළා. සෑම කෙනෙකුගේම කථාව අහගෙන හිටියහම මම හිතනවා, එම සෑම මන්ත්‍රීවරයෙකුගේම, මන්ත්‍රීවරියකගේම ඒ තිබෙන අදහස් එකිනෙකාට වෙනස් වුණත්, මම හිතන්නේ, මේ යෝජනාවට අදාළ වන පරිදි හැමෝම අලුත් දෙයක් කථා කළා. විශේෂයෙන්ම මෙම ප්‍රශ්නය පිළිබඳව කථා කරන කොට මම හිතන්නේ පළාතින් පළාතට ලංකාවේ මෙම ප්‍රශ්නය වෙනස් වෙන්නට පුළුවන්. දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට මෙම ප්‍රශ්නය අදාළ වන විධිය වෙනස් වෙන්නට පුළුවන්. කෙසේ නමුත් මම හිතනවා, වසර ගණනාවකට, දශක ගණනාවකට පස්සේ කුණු කසළ ප්‍රශ්නය උඩු දුවලා, කුණු කසළ කන්දකින් යට වෙලා මිනිස් ජීවිත බිලිගත්තට පස්සේ හරි රටේ නායකත්වයක් කවුරු හරි - රටේ නායකත්ව ගණනාවක් බිහි වුණා. මෙම තීරණය ගැනීම පිළිබඳව අපි පක්ෂ භේදයකින් තොරව ප්‍රශංසා කළ යුතු වෙනවා. කොපමණ පරක්කු වුණත්, කමක් නැහැ. නිවැරදි දේ දැන් හරි කරන්නට පුළුවන් වීම පිළිබඳව මම හිතන්නේ අපි හැමෝම රටේ ජනතාව විධියට සතුටු වෙන්න අවශ්‍යයයි. විශේෂයෙන්ම ලී ක්වාන් යූ කියන සිංගප්පූරුව ගොඩනගපු නායකයා කිව්වේ, විවෘත ආර්ථිකය මතින්

සිංගප්පූරුව දියුණු වුණාට සමහර විට විවෘත ආර්ථිකය හැම රටකටම ගැළපෙන එකක් නැහැයි කියලා. එතුමා ලියපු පොත් කියවුවොත් අපට බලාගන්නට පුළුවන් එතුමා කියනවා, රටින් රටට මෙම ආර්ථික ක්‍රමවේදයන් බලපාන [ගරු සමන්මලී සකලසූරිය]

විධිය වෙනස් වෙන්නට පුළුවන්. ඉතින් ඒ නිසා සමහරවිට අපේ රටට නොගැළපෙන දේවල් එම ආර්ථික ක්‍රමවේද රටාව විතරක් නොවෙයි, තව බොහෝ දේවල් අපි ඉතාමත්ම ඉක්මනින් වැඩිදුර විමසා බලන්නේ නැතුව, ඒ පිළිබඳව මනා අධ්‍යයනයකින් තොරව වැළඳ ගැනීම නිසා මම හිතන්නේ අද මේ අපේ පුංචි දූපත මේ රට විශාල ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා.

විශේෂයෙන්ම මෙම පොලිතීන් ප්ලාස්ටික් අර්බුදය අපේ රටට විතරක් නොවෙයි. මුලු ලෝකයේම අර්බුදයකට ලක් වුණු මාතෘකාවක්. අද වෙනකොට අපි ගොඩාක් තොරතුරු රැස්කර ගන්නේ අන්තර්ජාලය හරහා. අන්තර්ජාලය බැලුවොත් අපි දකිනවා ලංකාවේ දේවල්වලට වැඩියෙන් අපි පිටරට දේවල් සොයා බැලීමේදී, අපි දකිනවා මුහුද විශාල වශයෙන් මේ පොලිතීන් ප්ලාස්ටික්වලින් වැසී ගිහින් තිබෙනවා. ඇතැම් රටවල්වල ගංගාවල් එහෙන් පිටින්ම පොලිතීන් ප්ලාස්ටික්වලින් වහගෙන ඉන්නවා. ඉතින් ඒ නිසා එම රටවල් දැන් උත්සාහ කරනවා ඒ දේවල් අයින් කරන්නත්, ඒවාගේම ජනතාවට මේ පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබා දෙන්නත්. කෙතරම් නීති පැණවුවත් අපේ නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමිය සඳහන් කළ ආකාරයට නීති පමුණුවපු පමණින්ම මේ දේවල් සාක්ෂාත් කර ගැනීමේ හැකියාවක් කිසිම රටක නැහැ. ඒ සඳහා මම හිතන්නේ අපේ ආචාර්ය අශෝක රන්වල ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ ආකාරයට කුඩා කාලයේ සිටම මෙම දරුවන්ට, රටේ අනාගත පුරවැසියන්ට, මොකද අපි අපේ කුඩා කාලය පහුකරලා ඇවිල්ලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමා ඇතුළු අපි සියලු දෙනාම අපේ ළමාවිය පහුකරලා ඇවිල්ලා ඉවරයි. අපි අපේ ළමාවියේ ලබපු හුරුව පුහුණුව තමයි අපි අපේ අනාගතයට මුහුණ දෙන්නේ. අපි දැනුත් පරක්කු නැහැ. නමුත් මම හිතන්නේ අනාගතය වෙන කොට මේ ප්‍රශ්න දෙගුණ තෙගුණ වෙනවා. මීට අවුරුදු තිහ හතලිහකට කලින් හිටපු ජනගහනය නොවෙයි, අද වන කොට මේ රටේ ජීවත් වන්නේ. නාගරික ජනගහනය එන්න එන්නම වැඩි වෙනවා. ඒවාගේම ගම්බද පළාත් නාගරීකරණය වෙනවා. නාගරීකරණය වෙන්න වෙන්න මේ ප්‍රශ්නය වැඩි වෙනවා මිසක් මෙම ප්‍රශ්නය අඩු වෙන්නේ නැහැ. එම නිසා මෙම ප්‍රශ්නය දිහා අපි ඉතාමත්ම අධ්‍යයනයක් කරලා, අනික් රටවල් මෙම ප්‍රශ්න දිහා බලන්නේ කොහොමද? පොලිතීන් ප්ලාස්ටික් අවම කරගන්නේ කොහොමද, දැනට මේ ලෝකයේ උද්ගතවෙලා තිබෙන ප්‍රශ්නයත් එක්කලා අනික් රටවල් මුහුණ දෙන්නේ කොහොමද? කියන එක අධ්‍යයනයක් කළොතින් මම හිතන්නේ, අපට ගොඩ එන්න එපමණ අමාරු නැහැ. මොකද ඇතැම් රටවල් සහමුලින්ම මම දැක්කා - මම දන්නේ නැහැ, මගේ මෙම තොරතුරු සීයයට සීයයක් නිවැරදිද කියලත්. අපේ අල්ලපු රටේ ඉන්දියාවේ නවදිල්ලි නගරය සමුපූර්ණයෙන්ම පොලිතීන් තහනම් කළා කියලා මම ප්‍රවෘත්තියක් දැක්කා. මම දන්නේ නැහැ එවැනි නගරයක්, මිනිස්සුන් විශාල ප්‍රමාණයක් ජීවත් වෙන ප්‍රදේශයක පොලිතීන් තහනමක් ගේන්න පුළුවන් නම් මම දන්නේ නැහැ එහි ප්‍රායෝගිකභාවය කොපමණද කියල. නමුත් මම කියන්නේ, ඒකයි අපට වැඩිය විශාල ජනගහනයක් ජීවත් වන, නාගරිකරණය වුණු නගර, පළාත්, රටවල් මේ පිළිබඳව අවධියෙන් අවබෝධයෙන් කටයුතු කරනවා.

අද මම ඒකයි කිව්වේ මේ මන්ත්‍රීවරු සැම දෙනාම විශාල වශයෙන් අදහස් ප්‍රකාශ කළා. එකිනෙකාට පරස්පර අදහස් වෙන්න පුළුවන්. එකිනෙකාට වෙනස් තොරතුරු අපට දැනගන්නට ලැබුණා. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, ඒවාගේම නිශාන්ත ශ්‍රී වර්ණසිංහ මෙම යෝජනාව ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීතුමාත් අපට උදාහරණ ගෙනල්ල දැක්වූවා පොලිතීන් ප්ලාස්ටික් වෙනුවට ආදේශක. එහෙම නැත්නම් එදා සිට ආදේශක විධියට දැන් අපි සලකනවා. එදා සිට පාරම්පරිකව අපි පාවිච්චි කරපු දේවල් පිළිබඳ. ඉතින් මේ පිළිබඳව අධ්‍යයනයක් කරලා අපේ රටේ කර්මාන්තකරුවන්ට මේ දේවල් හඳුන්වලා දුන්නොතින් මම හිතනවා ඉතාමත්ම පහසුවෙන් අපේ මිනිස්සු මේ දේවල් වැළඳ ගනිවී. මොකද, මම දන්න නගර බද කාන්තාවන් ඉන්නවා එක පාරක් කෙසෙල් කොලේ බත් එක කාලා විසි කරන්නේ නැහැ. කෙසෙල් කොළය නැවත නැවත පාවිච්චි කරනවා. ඒවාගේම නෙළුම් කොළ, කෙසෙල් කොළ අපේ ලංකාවේ සොයාගන්න අමාරු නැහැ. මේක කර්මාන්තය විධියට හුරු කළොත් මම හිතන්නේ ලංකාවේ අය ඉතාමත් ඉක්මනින් වැළඳ ගනී. මොකද නුහුරු දෙයක් නොවන නිසා.

ඒ වාගේම කෙසෙල් පට්ටවලින්, ඒ වාගේම තල් ගසෙන්, පොල් ගසෙන් ඒ විතරක් නොවෙයි කොළපත්වලින් විශාල විධියට අපි දකිනවා මේ වන කොට නිෂ්පාදන කෙරී ගෙන යනවා. අද වන කොට ලංකාවේ පරිහරණය අඩු වුණත්, අපි දකිනවා ඒ අතලොස්වක් වූ නිෂ්පාදනකරුවන් අපි විවිධ ප්‍රදර්ශනවලදී දකිනවා. ඔවුන් මහා පරිමාණයෙන් පිටරටට යවනවා. ලංකාවේ මිනිසුන්ට තාම මේක හුරුවෙලා නැහැ. ඒ නිසා ජනතාවට මේකට ඇඟිලි දික් කරලා වැඩක් නැහැ. රාජ්‍ය නිලධාරීන් වේවා පෞද්ගලික අංශය වේවා, පාසල් දරුවෝ වේවා, රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය කිව්වා වාගේ ලෙහෙසියට ලන්ච් ෂීට් එකේ බත් එක ඔතාගෙන යනවා. ප්‍රායෝගිකව ගැටළු තිබෙනවා. මොකද අපට නුහුරු ජීවන රටාවක අපි අද යන්නේ. එතකොට ඉක්මණට කඩේට ගිහිල්ලා බඩු ටික ගේන්න යන කොට පන් මල්ල අමතක වෙලා ගියොත් මොකද කරන්නේ? තිබෙන ෂොපින් මල්ලක බඩු ටික ගෙදරට ගේනවා. ඒ නිසා අපි කාටවත් ඇඟිලි දික් කරලා වැඩක් නැහැ. අපි හැමෝටම මේ පිළිබඳව වගකීමක් තිබෙන්නට ඕනෑ. ඒ නිසා අපි පොඩි කාලේ සිටම දරුවන්ව නිවැරදි විධියට පරිසරයත් එක්කලා ගනු දෙනු කරන්න, ඒවාගේම පරිසර හිතකාමී විතරක් නොවෙයි තිරසාර වැඩ පිළිවෙළක් එක්කලා ඔවුන්ගේ ජීවිතය ගොඩනඟා ගන්නට, ඔවුන්ට කුඩා කාලයේ සිටම යම්කිසි වැඩ සටහනකට ඔවුන්ගේ ඔළුව සකස් කරනවා නම් මම හිතන්නේ, අනාගතයේදී මෙම ප්‍රශ්න බොහෝ දේවල් විසඳා ගැනීමට අපට හැකියාව තිබෙනවා. අපි අද දකිනවා කඩයකට ගියාම විශේෂයෙන්ම සුපර් මාර්කට් එකට ගියත් අපි දකිනවා, ඔවුන් අද ඉදිරිපත් කරලා තිබෙනවා, ෂොපින් බෑග් වෙනුවට රෙදි මලු. ඒකට Point එකක් දෙනවා. Incentive එකක් විධියට. මේ වාගේ විවිධ ක්‍රම, විවිධ ආයතන තම තමුන් හිතලා නිර්මාණය කරලා කරගෙන යනවා. ඒ නිසා මේකට නිවැරදි නායකත්වයක් දෙන්නට අවශ්‍යයයි. වර්තමාන රජයේ වේවා නායකවරු, ඇමතිවරු ඒවාගේම නිලධාරීන් සෑම කෙනෙකුම එකතු වෙලා මේ සඳහා වැඩ පිළිවෙළක් සකස් කළොත් මම හිතන්නේ, එක පැත්තකින් නීති ගෙනැල්ලා ඒ ක්‍රමවේද යන කොට, අනික් පැත්තෙන් යම්කිසි වැඩ සටහනක් හදලා තිරසාර සංවර්ධනයත් එක්කලා මේ රට ගමන් කරනවා නම්, යම්කිසි වැඩ සටහනක් මේ සඳහා අවශ්‍යයයි. නීති වගේම ඒ වැඩ සටහනත් එක්කලා මම හිතන්නේ, මේ ප්‍රශ්නයට අපට පිළිතුරු සපයන්නට පුළුවන්.

ඒ නිසා මම කැළි කසළ පිළිබඳවත්, කැළි කසළ කළමනාකරණය පිළිබඳවත් - අපි දන්නවා උදාහරණයක් විධියට කොළඹ නගර සභාවේ අය දශක ගණනාවක් තිස්සේ අවුරුද්දට එක පාරක් කොරියාවේ ගිහින් එනවා. මම දන්න තොරතුරු අනුව කැළි කසළ පිළිබඳව අධ්‍යයනය කරලා එන්න. නමුත් අපි දැක්කා පසුගිය කාලයේ කුණු කන්ද කඩාගෙන වැටුණා. ඒ අධ්‍යයනය කරලා ආපු අයගේ තොරතුරුවලින්, දැනුමෙන් එල ප්‍රයෝජනයක් ගත්තද? එහෙම නැත්නම් ඒක තවත් එක් හුදෙක් විනෝද චාරිකාවක් විතරක්ද කියලා අපි දන්නේ නැහැ. ඉතින් මෙවැනි පුහු දේවල් අපි වුණත් කරන්නට ඉඩ තිබෙනවා. මොකද ඒ විධියට තමයි මේ System එක හැඩ ගැහිලා තිබෙන්නේ.

අපි ඇත්ත කථා කරන්නට ඕනෑ කාලය ඇවිල්ලා. ඒ නිසා අපි හැමෝටම වගකීමක් තිබෙනවා. කාටවත් අපට ඇඟිල්ල දික් කරන්නට බැහැ, ඔයයි මේ වැරැද්ද කළේ කියලා. ඒ නිසා තරුණ මන්ත්‍රීවරියෙක් විධියට මම ස්තුතිවන්ත වෙනවා නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා මේ ගෙනාපු යෝජනාව පිළිබඳව. ඒවාගේම ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට මට අවස්ථාව ලබා දීම පිළිබඳවත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහෝම ස්තුතියි ගරු මන්ත්‍රීතුමිය, මීළඟට නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට පිළිතුරු කථාව සඳහා අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා. 11.58]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළමුවෙන්ම මම ස්තුතිවන්ත වෙනවා, මේ යෝජනාව සම්බන්ධයෙන් සමාජ විද්‍යාත්මකව, පරිසර විද්‍යාත්මකව කරුණු ඉදිරිපත් කළ අපේ සුසිල් කිඳෙල්පිටිය මන්ත්‍රීතුමාට. ඒ වාගේම මෙම විෂය ක්ෂේත්‍රය පිළිබඳව සාමාන්‍ය බුද්ධිමතෙක් වන, ඒවාගේම විද්‍යාත්මකව කරුණු ඉදිරිපත් කරන අපේ අශෝක රන්වල ගරු මන්ත්‍රීතුමාට. මොකද එතුමා ජීව විද්‍යාත්මකව, රසායන විද්‍යාත්මකව මේ පිළිබඳව කරුණු පැහැදිලි කළා. මේ පොලිතීන්, ප්ලාස්ටික් සහ රසායනික ද්‍රව්‍ය අපේ ජීව ක්‍රියාවලියට එකතුවීමේදී ඒවා නැවත චතාවක්

0173

ප්‍රතිචක්‍රීයකරණය කරන්නේ කොහොමද? ඒවා නැවත වතාවක් මෙම මහ පොළොවට දිරාපත් වන ආකාරය පිළිබඳව විද්‍යාත්මකව කරුණු පැහැදිලි කිරීමක් කළා. මම හිතන්නේ අපට මේ සභාවේ ඉන්න ඉතාම වැදගත් බුද්ධිමය

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

සම්පතක් විධියට මම එතුමාව හඳුනා ගන්නවා. ඒවාගේම අපේ උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා මේ පිළිබඳව අපට උරුමව තිබුණු අපේ සම්ප්‍රදායික භාවිතාවන් පිළිබඳව කරුණු පැහැදිලි කළා. ඒ වාගේම අපේ සමන්මලී සකලසූරිය ගරු මන්ත්‍රීතුමිය මේ පිළිබඳව ඉතාමත් වැදගත් කරුණු ගණනාවක් ඉදිරිපත් කළා. ඇත්ත වශයෙන්ම මෑත කාලයේ මුළු ලෝකයේම වැඩිම අවධානය යොමු වුණු රටක් තමයි ඉන්දියාවේ දිල්ලි නගරය. දිල්ලි නගරයේ සිදු වෙලා තිබෙන පාරිසරික දූෂණය, වායු දූෂණය සහ ජල දූෂණය හේතු කරගෙන එදිනෙදා ජන ජීවිතය පවා සම්පූර්ණයෙන්ම අකර්මණ්‍ය වන තත්ත්වයකට පත් වුණා.

ඒ වාගේම චීනයේ බීජිං නගරයත් අද ලෝකයේ බරපතළ පාරිසරික දූෂණයක් සිදු වන නගරයක් විධියට, වායු දූෂණයක් සහිත නගරයක් විධියට හඳුනාගෙන තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඒ රටවල් මේ සම්බන්ධයෙන් අවශ්‍ය ප්‍රතිපත්තිමය තීන්දු තීරණ අරගෙන තිබෙනවා. නීති සම්පාදනය කරලා තිබෙනවා. ඒවා බලාත්මක කරනවා. ඒවා ක්‍රියාත්මක කරනවා. දැන් ඒවාගේම තමයි අපේ නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමිය පැහැදිලි කළා, මේක අපේ ජනජීවිතය ඇතුළේ අපි කොහොමද භාවිතාවක් කරගන්නේ කියලා. ඒ කාලයේදී, 1977 පසුව සිලිසිලි බෑග් එකින් බඩු ගෙනියනවා කියන එක මෝස්තරයක්, විලාසිතාවක් බවට පත් වුණා. ඒක තමයි විවෘත ආර්ථිකයේ එක ලක්ෂණයක් බවට පත් වුණේ. කඩයට ගිහිල්ලා, එහෙම නැත්නම් සුපර් මාර්කට් එකට ගිහිල්ලා, වෙළඳ පොළට ගිහිල්ලා සිලිසිලි බෑග් එකේ බඩු ගෙනියන එක තමයි විලාසිතාව, මෝස්තරය බවට පත් වෙලා තිබුණේ. ඒක තමයි විවෘත ආර්ථිකයේ එක සංකේතයක් වුණේ. අපිත් විවෘත ආර්ථිකයට ඇතුල් වෙලා කියලා පෙන්වන්න. අරක නිකන් ගොඩේ ගතියක් විධියට තමයි සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා තිබුණේ. බෑග් එක අරන් යන එක, පන් බෑග් එක අරන් යන එක එහෙම නැත්නම් සිමෙන්ති බෑග් එක ඇතුලේ බඩු ටික දාගෙන, එළවළු ටික, මස් මාළු ටික ඔතාගෙන යන එක, කෙසෙල් කොළයක හරි එහෙම නැත්නම් හබරල කොළයක හරි ඔතන් යන එක, ඒ කාලයේ

0174

ගොඩේ ගතියක් බවට පත් වුණා. ඒ නිසා Modern කට්ටිය විධියට තමයි පොලිතීන් බෑග් එකේ බඩු ගෙනියන එක හඳුනාගත්තේ. ඒ කාලයේ සංවර්ධනයේ එක නිර්ණායකයක් බවට පත් වෙලා තිබුණා ඒක පුද්ගල පොලිතීන් භාවිතය සහ ප්ලාස්ටික් භාවිතය. ඉතින් එවැනි තැනකට මේ රට ගමන් කළා. දැන් අපි මේ විවෘත ආර්ථිකයේ හොඳ නරක අත්දැකලා තිබෙනවා. මේකේ හොඳත් තිබෙනවා. නරකත් තිබෙනවා. එහෙමනම් මේක හරියට කිරා මැනලා අරගෙන අපි කොහොමද මේකින් බැහැර කළ යුතු දේවල් හඳුනා ගන්නේ.

මේකේ තිබෙන පාරිසරික බලපෑම ගැන අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ. මේ සියලු දෙනාම දන්නවා. මේකේ සමාජීය බලපෑම, පාරිසරික බලපෑම අපි ඕනෑතරම් අත්විඳලා තිබෙනවා. දැන් අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා ඇත්ත වශයෙන්ම මේ පොලිතීන් අද මුහුදට එකතුවෙලා මුහුදු පත්ලේ විශාල කඳු හැදිලා තිබෙනවා කියලා. පොලිතීන් කඳු. සමුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරීත්වයට, මත්ස්‍යයින්ගේ ක්‍රියාකාරීත්වයට මොන විධියේ බලපෑමක් ඇති කරනවාද කියන එක පිළිබඳව තාම තක්සේරු කරන්න බැහැ. විශාල පොලිතීන් කඳු. ඒ කියන්නේ ටොන් ලක්ෂ ගණන් ගිහිල්ලා මේ මුහුදු පත්ලේ එකතු වෙලා තිබෙනවා. ගංගාවල එකතු වෙලා තිබෙනවා. ඒවා තුළ වෙනම අලුත් පරිසර පද්ධති නිර්මාණය වෙලා තිබෙනවා. ඒක හිතාගන්නට බැහැ. අවුරුදු සිය ගණන් අවුරුදු පන්සිය දාහක් ගියත් දිරාපත් වෙන්නේ නැහැ. අපි අනාගතයේදී අපේ පොලොව හාරලා බැලුවොත් ඇත්ත වශයෙන්ම අපට අහුවෙන්නේ ඔය කියන පුරා වස්තු නම් නොවෙයි. වයර් කෑලි එහෙම නැත්නම් ඉලෙක්ට්‍රොනික් ද්‍රව්‍ය. පොලිතීන්. මේවා තමයි අනාගතයේදී අපට මහ පොළොව තුළ පුරාවිද්‍යාව විධියට ගවේෂණය කරන්න සිද්ධ වෙන්නේ. එහෙම නැතුව පුරා වස්තු කියලා වටිනා දේවල් නම් අනාගයේදී අපට හොයන්නට බැරි වෙයි. ඒ නිසා මේ පිළිබඳව මම හිතන්නේ අපේ රෝස් ගරු මන්ත්‍රීතුමිය පැහැදිලි කළා. මේකේ විකල්ප මොනවාද? ආදේශන මොනවාද කියන එක නීතියෙන්ම පමණක් බැහැයි කියලා.

නීතියක් අවශ්‍යයි. නීතියකින් තමයි රටක් පාලනය වන්නේ. රටකට ව්‍යවස්ථාවක් හදලා තිබෙන්නේ, නීති සම්පාදනය කරලා තිබෙන්නේ ඒ නිසයි. අපි නීති රීති මේ සෑම එකක්ම හදාගන්නේ මොකටද? යම්කිසි ශීලාචාර,

ශිෂ්ට සම්පන්න ක්‍රමයකට මේ රට ගෙනියන්න. එහෙනම් එවැනි ශීලාචාර ශිෂ්ට සම්පන්න තැනකට මේ රට ගෙනියන්න අද අපට අවශ්‍යයි. ඒ සඳහා අපේ සමාජ භාවිතාව, දේශපාලන භාවිතාව, ආර්ථික භාවිතාව ඇතුළේ අපි කළ යුතු කුඩා කුඩා වෙනස්කම් තිබෙනවා. ඒ කුඩා කුඩා වෙනස්කම්වලින් විශාල වෙනසක් අපේ සමාජ තුළ රට තුළ පරිසරය තුළ සිදු වෙනවා. ඒ නිසා මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුයි කියලා ප්‍රකාශ කරනවා.

විශේෂයෙන්ම මේ පොලිතීන් තහනම පිළිබඳව දීප ව්‍යාප්ත සමීක්ෂණයක් කළා, පර්යේෂණ හා සංවර්ධන ඒකකය, අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය සහ මධ්‍යම පරිසර අධිකාරිය. 2017 නොවැම්බර් මාසයේ තමයි මේ දීප ව්‍යාප්ත සමීක්ෂණය, රට තුළ කළේ. මේ සමීක්ෂණයේදී තෝරාගත් නියැදියේ වෘත්තීය සහ රැකියාවේ ස්වභාවය වුණේ, රාජ්‍ය සේවයේ 39% ක් මේ සමීක්ෂණයට සම්බන්ධ කරගත්තා. පුද්ගලික අංශයේ 19% ක්. ව්‍යාපාරික ක්ෂේත්‍රයේ 25% ක්. පාසල් 10% ක්. විශ්වවිද්‍යාල 3% ක්. වෘත්තීය පුහුණු 4% ක්. දැන් මෙකේ ප්‍රතිඵල මොකද්ද? මේ සමීක්ෂණ වාර්තාවලින් කියන්නේ, දැනට ක්‍රියාත්මක වන 2017 වර්ෂයේ සැප්තැම්බර් 01 වන දින සිට බලපවත්වන පොලිතීන් තහනම පිළිබඳ ඔබ දැනුවත්ද? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 95% ක් කියලා තිබෙනවා මේ තහනම පිළිබඳව ඔවුන් දැනුවත් කියලා. 5% ක් කියලා තිබෙනවා ඔවුන්ගේ දැනුවත් භාවයක් නැහැයි කියලා. මෙම සමීක්ෂණ වාර්තාවලින් තහවුරු වෙලා තිබෙනවා. මීළඟට අහන ප්‍රශ්නය තමයි දැනට එසේ තහනම් කර ඇති නිෂ්පාදන මොනවාද යැයි ඔබ දැනුවත්ද? 86% ක් ඔවුන් දැනුවත් කියලා කියලා තිබෙනවා. මේ තහනම් කරලා තිබෙන ද්‍රව්‍ය මොනවාද කියන එක. 14% ක් දන්නේ නැහැ මොනවාද මේ තහනම් කරලා තිබෙන ද්‍රව්‍යය කියලා. මීළඟට, මෙම සමීක්ෂණ වාර්තාවේ දැනුවත් නම්, ඒ මොනවාද කියලා අහනවා. එතකොට ඒ අය කියනවා, ලන්ච් ෂීට්, කෑම ඇසුරුම් කොළ පිළිබඳව 88% ක් දැනුවත්ව ඉන්නවා. රෙජිෆෝම් කොප්ප තහනම් කියන එක පිළිබඳව 32% ක් දැනුවත්ව ඉන්නවා. කසළ බහලුම් මලු 33% ක් තහනම් කියලා දැනුවත්ව ඉන්නවා. සිලිසිලි බෑග් සම්බන්ධයෙන් 80% ක් දැනුවත්ව ඉන්නවා. රිජිෆෝම් කෑම පෙට්ටි පිළිබඳව 64% ක් මේවා තහනම් කියලා දැනුවත්ව ඉන්නවා. ඒ වාගේම ග්‍රොසරි කවර 60% ක් තහනම් කියලා ඔවුන් දැනුවත්ව ඉන්නවා. ප්ලාස්ටික් වතුර බෝතල් 29% ක් තහනම් කියන එක පිළිබඳව දැනුවත්ව ඉන්නවා. රෙදි පිළි බහලුම් පිළිබඳව 18% ක්. ඉහත පොලිතීන් තහනම ජනතාවට හිතකරවේද කියලා ප්‍රශ්න ඇහුවහම ඒකට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 92% ක් ඔව් කියලා කියලා තිබෙනවා. ඒ කියන්නේ මේ තහනම ජනතාවට හිතකරයි කියලා පිළි අරගෙන තිබෙනවා. 92% ක්. 8% ක් නැහැ කියලා කියලා තිබෙනවා. මීළඟට හිතකර නොවේ නම් ඊට හේතු මොනවාද කියලා අහලා තිබෙනවා. අපේ රෝස් ගරු මන්ත්‍රීතුමියගේ ප්‍රශ්නයට උත්තරයක් මෙතැන තිබෙනවා. මේ සමීක්ෂණයෙන් අහලා තිබෙනවා හිතකර නොවීමට නම් ඊට හේතු මොනවාද කියලා. ආදේශන නොමැතිවීම හෝ හිඟකම. සියයට සියයක්ම කියනවා ආදේශන නොමැති වීම හා හිඟකම කියලා. ඊළඟට පවතින ආදේශනවල මිල සම්බන්ධයෙන් ඒ අය ප්‍රශ්න කරලා කියනවා, මෙකේ මිල වැඩි වීම ඒ කට්ටියට ප්‍රශ්නයක්. ඒ නිසා 57% ක් ඔවුන් මිල පිළිබඳ ප්‍රශ්නය මතු කරලා තිබෙනවා. මෙම සමීක්ෂණය අනුව ආදේශන සඳහා යොමුවීමට අකමැති පිරිස 37% ක් ඉන්නවා. මේ විධියට මේ පිළිබඳව ඉතාම වැදගත් සමීක්ෂණයක් කරලා තිබෙනවා. මේ තොරතුරු පදනම් කරගෙන, ඇත්ත වශයෙන්ම බස්නාහිර පළාත තමයි රටේ ආර්ථිකයේ කේන්ද්‍රස්ථානය. අපි ආර්ථිකයේ ඩයිනමෝව කියලා කියනවා. මැෂිම කියලා කියනවා. එහෙමනම් මෙම බස්නාහිර පළාත තමයි වේගයෙන්ම ජනාකීර්ණය වෙමින් තිබෙන පළාත.

අපේ සමන්මලී ගරු මන්ත්‍රීතුමිය කිව්වා වාගේ ඉදිරි කාලයේදී එන්න එන්න මේ මහ පොළොවට, පරිසරයට, ඒවාගේම වාතයට ජලයට එකතු කරන බැහැර කිරීම් විශාල වශයෙන් වැඩි වන පළාත බවට පත් වෙන්නේ, බස්නාහිර පළාත. එහෙම නම් බස්නාහිර පළාත සම්බන්ධයෙන් තීන්දු තීරණ ගන්න අද මෙතැන අපේ මහ ඇමතිතුමා නැහැ. අපේ වැදගත්ම අමාත්‍යාංශයක් වන අධ්‍යාපන අමාත්‍යතුමා නැහැ. ආකල්ප වර්ධනය කරන්නට ඕනෑ කියලා කියනවා. දැනුම ලබා දෙන්න ඕනෑ කියලා කියනවා. ඒවාගේම පරිසර විෂය භාර ඇමැතිතුමා නැහැ. කෘෂිකර්මය කෙළින්ම මේකට සම්බන්ධයි. සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයි. මම සතුටු වෙනවා අපේ ඇමැතිතුමා මේ අවස්ථාවේ ඉන්නවා. දැන් මේ ජනාධිපතිතුමා ඉතාමත් වැදගත් තීරණයක් අරගෙන තියෙන්නේ. දැන් මේ තීරණය සම්බන්ධයෙන්, මේක බලාත්මක කිරීම සම්බන්ධයෙන් මෙම පළාත් සභාවේ මහ ඇමතිවරයාට, ඒ වාගේම විෂය භාර ඇමැතිවරයාට

ආයතන ප්‍රධානීන්ට වගකීමක් තිබෙනවා. අපි මේක බස්නාහිර පළාත තුළ බලාත්මක කරමු. ඇයි අපට බැරි? අපි සෑම කෙනෙකුම කියනවා මේ සමාජ ක්‍රමයේ ප්‍රශ්නයක් තිබෙනවා. ආර්ථික ක්‍රමයේ ප්‍රශ්නයක් තිබෙනවා. [ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

දේශලපාලන ක්‍රමයේ ප්‍රශ්නයක් කියලා මේක සම්පූර්ණයෙන්ම අපි සමස්ථ අර්බුදයක් විධියට විග්‍රහ කරන්න උත්සාහ කරනවා. හැබැයි මේ ප්‍රශ්නය අපි කොහොමද විසඳා ගන්නේ? මේක බලාත්මක කරන්නේ කොහොමද? මේක අපි Implement කරන්නේ කොහොමද කියන එක පිළිබඳව සාකච්ඡාවක් කරන්නේ නැහැ.

දැන් අපේ සෞඛ්‍ය අමාත්‍යතුමා ඉන්නවා. බස්නාහිර පළාත තුළ බස්නාහිර පළාත් සභාව යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා යටතේ පාලනය වන මේ සියලුම රෝහල්වලට අවශ්‍ය නම් තීරණයක් ගන්න පුළුවන්, ඒ අධ්‍යක්ෂකවරු කැඳවලා, ඒ වෛද්‍යවරු කැඳවලා මේ රෝහල තුළ පොලිතීන් භාවිතය තහනම් කියලා. පොලිතීන්වලින් තොර කලාපයක් බවට ඒ රෝහල් පත් කරන්නට පුළුවන්. ඒවාගේම පාසල් ඒ තත්ත්වයට ගේන්න පුළුවන්. පාසල්වලට පොලිතීන් ගේන එක නතර කරන්න පුළුවන්. මේ බස්නාහිර පළාත යටතේ පාලනය වන සියලුම රාජ්‍ය ආයතන, දෙපාර්තමේන්තු, සංස්ථා අනිකුත් සියලුම ආයතන ඇතුළේ පොලිතීන්වලින් තොර කලාපයක් බවට ඒ ආයතන පත් කරන්න පුළුවන්. ශ්‍රාවස්තියේ ඉඳලා. ඒවාගේම තමයි බස්නාහිර පළාත් සභා ලේකම් කාර්යාලය පොලිතීන් භාවිතයෙන් තොර, ඒ වාගේම මේ පළාත් සභා ගොඩනැගිලි තිබෙන කලාපය පොලිතීන් භාවිතයෙන් තොර කලාපයක් බවට පත් කරන්නට පුළුවන්. එතැන්ට අවශ්‍ය කරන ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. අවශ්‍ය නම් නීති සම්පාදනය කරන්නට ඕනෑ. ඒ නිසා අපි පැහැදිලිවම කියනවා මේක ක්‍රියාත්මක කරන්න පුළුවන්. මෙහිදි වැදගත් වන්නේ එදා මිහිඳු හාමුදුරුවෝ ලංකාවට වැඩම කළ අවස්ථාවේදී ලබා දීපු උපදේශනය. දේවානම් පියතිස්ස රජතුමාට කිව්වේ මොකක්ද? ඔබතුමා මේ රටේ අයිතිකාරයා නොවෙයි, භාරකාරයා පමණයි කියලා. අපි සෑම කෙනෙකුම භාරකාරයෝ විතරයි. අපි තාවකාලික භාරකාරයෝ. ඒ නිසා අපට වගකීමක් තිබෙනවා, අනාගත පරපුර වෙනුවෙන් නූපන් පරපුර වෙනුවෙන්. මේ මහපොළව, ගහකොළ, පරිසරය, සතා සිවුපාව විතරක් නොවෙයි. මේ ස්වභාව ධර්මය, ජල ගෝලය, වායු ගෝලය ඒ වාගේම මේ මිහි ගෝලය ආරක්ෂා කරලා දෙන එක. ඒ නිසා ඒ අනාගතය වෙනුවෙන් ඉතාමත් වැදගත් තීරණයක් තමයි ජනාධිපතිතුමා අරගෙන තියෙන්නේ. ඒක හැල්ලුවට ලක් කරන්නේ නැතුව, ඒක විහිළුවට ලක් කරන්නේ නැතුව, ඒ නීති නමන්න යන්නේ නැතුව ඒ නීති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරන සහයෝගය ලබා දීමයි අපි කරන්න ඕනෑ.

අපේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ කෘෂිකර්ම ඇමැතිතුමා ඉන්නවා. එතුමාට කියන්නට පුළුවන් මේ පොලිතීන් භාවිතය කොහොමද අවම කරන්නේ, පාලනය කරන්නේ කියන එක ගැන. ඒ සඳහා නීතියක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. අපේ ගංගා ටික කොහොමද අපි ආරක්ෂා කර ගන්නේ? ඒ සඳහා අවශ්‍ය කරන වැඩපිළිවෙළ අපි සකස් කරන්න ඕනෑ. අපට පාසල් සියල්ලේ කරන්න පුළුවන්. අවශ්‍ය නම් පාසල්වල විදුහල්පතිතුමන්ලාත් එක්ක කථා කරලා, අනිවාර්යයෙන්ම දෙමාපියන්ට ඒ අනුව පණිවිඩය යනවා. කරුණාකරලා පාසලට ගේන දේවල් පොලිතීන්වලින් තොර වෙන්න ඕනෑ. සමහර රෝහල් තියෙනවා ඇත්ත වශයෙන්ම එම රෝහල්වලට පොලිතීන් ගේන්න බැහැ. සිලිසිලි බෑග් ගේන්න දෙන්නේ නැහැ. ඒවා තහනම් කරලා තිබෙනවා. රෙජිෆෝම් ගේන්න දෙන්නේ නැහැ. සමහර වෙලාවට රෝගියාට ඒ කෑම එකවත් ගේන්න දෙන්නේ නැහැ, හරවලා යවනවා. ඉතින් මෙවැනි නීතිය හරහා තමයි මේක ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙන්නේ. ඒක නිසා මේ නීතිය කියන එක ඉතාම වැදගත්. මේ නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ.

ඒ වාගේම මේ සභාව ඇතුළේ සියලුම දේශපාලන පක්ෂ නියෝජනය කරන මන්ත්‍රීවරු ඉන්නවා. දැන් මේ පළාත් පාලන මැතිවරණය ඇවිල්ලා තිබෙනවා. ඉදිරියේදී තවත් මැතිවරණ එන්න නියමිතයි. ඇයි පක්ෂයක් විධියට ප්‍රතිපත්තිමය තීරණයක් ගන්න බැරි තමන්ගේ පක්ෂය ඇතුළේ. තමන්ගේ පක්ෂය මේ පොලිතීන් ප්‍රවර්ධනය කරන්නේ නැහැ. තමන්ගේ අපේක්ෂකයා පොලිතීන් ප්‍රවර්ධනය කරන්නේ නැහැ. ප්‍රචාරක කටයුතු සඳහා පොලිතීන් භාවිතා කරන්නේ නැහැ කියන තීරණයට එන්න පුළුවන්. ඒක එක්සත් ජාතික පක්ෂය වෙන්නට පුළුවන්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙන්න පුළුවන්, ජනතා විමුක්ති පෙරමුණ වෙන්න පුළුවන්, අපේ පක්ෂය වෙන්න පුළුවන්, අනික් සෑම පක්ෂයකටම පුළුවන් තමන්ගේ පක්ෂය ඇතුළේ

මේ සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම සඳහා අරගල කරන්න, බල කරන්න පුළුවන්. ඒ හරහා මේක ජාතික මට්ටමෙන් පුළුවවන්. විශේෂයෙන්ම මැතිවරණ කාලසීමාව තුළ පොලිතීන් භාවිතය ඉහළ යනවා. මේක පාලනය කරන්න අපි කටයුතු කරන්න ඕනෑ. විකල්ප අපි හඳුනා දෙන්න ඕනෑ වාගේම විශේෂයෙන්ම අපි කියන්න කැමැති අන්න ඒ සඳහා නිර්ණායක ටිකක් දේශපාලන පක්ෂවලට ගන්න පුළුවන්. ඒකයි වැදගත් වෙන්නේ. මෙන්න මේ වගේ ප්‍රතිපත්තිමය තීන්දුව හරහා මේ රට හරි මගට ගෙනියන්න, මේ රට නිවැරදි දිසාවට යොමු කරන්න අපි උත්සහ කරන්න ඕනෑ. ඒකයි මහජන නියෝජිතයින් විධියට අපේ වගකීම වෙන්නේ. ඒ නිසා මේ පොලිතීන් තහනම පිළිබඳව ජනාධිපතිතුමා ගත් මේ තීරණයට ස්තුතිවන්ත වෙමින්, එතුමාගේ මේ තීරණය බලාත්මක කිරීම සඳහා - එතුමාට හැට දෙලක්ෂයක ජනවරමක් ලැබිලා තිබෙනවා. ඒ ජනවරම ඔස්සේ මේ රටේ ගහ කොළ, පරිසරය ආරක්ෂා කිරීම සඳහා, අනාගතය ආරක්ෂා කිරීම සඳහා ඒ ගත්තු වැදගත් තීන්දුවට මේ සභාවේ සම්පූර්ණ සහයෝගය ලබා දීම සඳහා කටයුතු කරන්න. මේ නීතිය බලාත්මක කිරීම සඳහා අපි සෑම කෙනෙකුම හැකි සෑම ආකාරයකින්ම දායක වෙමු කියලා ඉල්ලා සිටිමින් මේ විවාදයට එක්වීම පිළිබඳ ඊට සම්බන්ධ වූ මන්ත්‍රීතුමියන්ලාට සහ මන්ත්‍රීතුමන්ලාට මාගේ ගෞරවපූරක ස්තුතිය පිරිනමමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහෝම ස්තුති නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා ගෙනාපු යෝජනාව බොහොමත්ම කාලෝචිතයි කියන එක අපි පිළිගන්නවා. ඒ එක්කම මේ යෝජනවා සමාජගත වෙන්න, ඒ අමාත්‍යාංශවල ක්‍රියාත්මක කරන්න, මම විශ්වාස කරනවා මීට වඩා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය, ඒ වාගේම ප්‍රධාන ලේකම්තුමාගේ අවධානය යොමු වෙලා මේ යෝජනාව විතරක් නොවෙයි, මෙම සභාවේ මෙවැනි යෝජනා ගේන අවස්ථාවලදී ඒ ඒ අමාත්‍යාංශවල ඉන්න සියලුම ලේකම්වරු ඒ වගකීම දරන්න පුළුවන් නිලධාරීන් ඒ සභාව අවසන්වන තෙක් මේ සභාවේ රැඳී ඉන්න අවශ්‍ය කටයුතු ක්‍රියාමාර්ග අපි ඉදිරියේදී ගන්නවා කියන එකත් මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

න්‍යාය පත්‍රයේ දෙවන පෞද්ලික මන්ත්‍රී යෝජනාව තිබෙන්නේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ නමින්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි මා විසින් ඉදිරිපත් කරන තිබෙන පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ඊළඟ සභාව වාරයේදී ඉදිරිපත් කිරීමට ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ සඳහා සභාව එකඟයි.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

ඒ අනුව එම යෝජනාව මීළඟ සභා වාරයට කල් තබනවා.

# කල් තැබීමේ යෝජනාව
ADJOURNMENT

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "*දැන් මෙම සභාව කල්තැබිය යුතු යැයි*" යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 12.16 ට, 2018 පෙබරවාරි මස 20 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 12.16 p.m till 9.30 a.m. on 20.02.2018*